ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය

தேசிய கொள்கைகள், பொருளாதார விவகாரங்கள், மீள்குடியேற்றம் மற்றும் புனர்வாழ்வு, வடமாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சு

Ministry of National Policies, Economic Affairs, Resettlement & Rehabilitation, Northern Province Development and Youth Affairs

# 2018

# කාර්යසාධන වාර්තාව

# செயற்திறன் அறிக்கை

# Performance Report

# කාර්යසාධන වාර්තාව

# செயற்திறன் அறிக்கை

# Performance Report

# 2018

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය

தேசிய கொள்கைகள், பொருளாதார விவகாரங்கள், மீள்குடியேற்றம் மற்றும் புனர்வாழ்வு, வடமாகாண அபிவிருத்தி, மற்றம் இளைஞர் விவகாரங்கள் அமைச்சு

Ministry of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs

## අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති ආයතන

2019.03.18 දිනැති අංක 2115/9 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව පහත සඳහන් දෙපාර්තමේන්තු/ සංස්ථාපිත මණ්ඩල හා ආයතන ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ.

### දෙපාර්තමේන්තු

ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව

### ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

ජාතික මෙහෙයුම් මැදිරිය

හානිපූරණය සඳහා වන කාර්යාලය

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය

තල් සංවර්ධන මණ්ඩලය

නෝර්ත් සී ලිමිටඩ්

ජාතික තරුණ සේවා සභාව

ජාතික යොවුන් සේනාංකය

ජාතික යෞවන තිළිණ ප්‍රදාන කාර්යාලය

සීමාසහිත ජාතිත තරුණ සේවා සමූපකාර සංගමය

නායකත්ව සංවර්ධනය සඳහා ජාතික මධ්‍යස්ථානය

# පටුන


ගරු අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගේ පණිවිඩය …... XI

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු ගරු. රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය …………….... XV

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය .......…… XIX

**පරිච්ඡේදය 01- ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය**

1.1 හැඳින්වීම …………….. 1
1.2 ප්‍රධාන කාර්යයන් ……………. 2
1.3 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය …………….. 3

**පරිච්ඡේදය 02 - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය**

2.1 දැක්ම, මෙහෙවර හා අරමුණු ……………. 5
2.2 සංවිධාන ව්‍යුහය ……………. 6

**පරිච්ඡේදය 03 - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය විසින් ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘති/ කර්තව්‍යයන් හි කාර්යසාධනය**

3.1 විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය (DCB) වැඩසටහන 2018 ……………..... 13
3.2 ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටන - 2018 ……………. 15
3.3 ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2018 …………… 17
3.4 ගම්පෙරළිය - වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන …………….. 19
3.5 සැලසුම් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් …………….. 21
3.6 ‘1990 සුවසැරිය පදනම’: පූර්ව රෝහල් හදිසි ප්‍රතිකාර ගිලන්රථ සේවාව - II අදියර …………….. 29
3.7 මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකය (CPMU) ……………. 30
3.8 ආර්ථික කටයුතු සම්බන්ධ ක්‍රියාකරකම් …………… 35
3.9 විශේෂ සංවර්ධන ව්‍යාපෘති …………… 44
3.10 ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව …………… 51

**පරිච්ඡේදය 04 – නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන අංශයෙහි කාර්යසාධනය**

4.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සංක්ෂිප්තව ………… 57
4.2 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශය ………… 65
4.3 තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය ……………. 71
4.4 නෝත් සී ලිමිටඩ් ……………. 74
4.5 තල් සංවර්ධන මණ්ඩලය ……………. 80

**පරිච්ඡේදය 05 –යෞවන කටයුතු අංශයෙහි කාර්යසාධනය**

5.1 හැඳින්වීම ............ 85
5.2 ජාතික තරුණ සේවා සභාව ............ 89
5.3 ජාතික යොවුන් සේනාංකය ............ 90
5.4 කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය ............ 91
5.5 නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය ............ 92

**පරිච්ඡේදය 06 –ප්‍රාදේශීය සංවර්ධන අංශයෙහි කාර්යසාධනය**

6.1 මූලධන ආයෝජන ............ 93
6.2 ශ්‍රී ලංකා හඳුබිම අධිකාරිය ............ 93
6.3 ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ............ 94
6.4 විමධ්‍යගත මූලධන අයවැය සංවර්ධන වැඩසටහන ............ 95
6.5 2019 වර්ෂයට යෝජිත වැඩසටහන් ............ 95

**ඇමුණුම් – වියදම් වාර්තාවන්**

ඇමුණුම I: ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය
ඇමුණුම II: නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන හා උතුරු පළාත් සංවර්ධන අංශය
ඇමුණුම III: යෞවන කටයුතු අංශය
ඇමුණුම IV: ප්‍රාදේශීය සංවර්ධන අංශය

## ගරු අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යතුමාගේ පණිවිඩය



ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ 2018 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව මා විසින් ඉදිරිපත් කරනුයේ හදපිරි සතුටිනි. 2025 දැක්මෙහි දක්වා ඇති පරිදි ආර්ථිකය වඩාත් තරඟකාරී, දැනුම පදනම් කරගත් සමාජ වෙළඳපොළ ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමේ සිය ක්‍රියාවලියේ පියවර කිහිපයක් 2018 වර්ෂය තුළ රජය විසින් දියත් කර ඇත. ශ්‍රී ලංකාවේ දිර්ඝ කාලීන අපේක්ෂාව වනුයේ ඉන්දියන් සාගරයේ භූගෝලීය හා ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට දේශය පරිවර්තනය කරමින් එය සතුව තිබූ අතීත ශ්‍රී විභූතිය යළි අත්පත් කරගැනීමයි. මෙම අභිප්‍රාය පෙරදැරිව, දිවයින පුරා ව්‍යාප්ත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් සමඟ ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ මාලාවක් හඳුන්වා දීමට අපි ප්‍රයත්න දරන්නෙමු. මෙම පරිවර්තනය සඳහා ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය අතිශයින් වැදගත් භූමිකාවක් ඉටුකරමින් සිටියි. ආයෝජන හිතකාමී ස්ථාවර සාර්ව ආර්ථික රාමුවක් හඳුන්වාදීම සඳහා ද අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඇත.

ජාතික සංහිඳියාව හා ආර්ථික වෘද්ධිය මත පදනම්ව ආර්ථිකය ඉහළ තලයකට එසවීමේ දිගු චාරිකාව සඳහා රජය අවතීර්ණ වී ඇත. ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැවත ගොඩ නැංවීම, දහනම වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ප්‍රතිස්ථාපනය කිරීම, යෝජිත සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳව මහජන අදහස් විමසීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන හා ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම වැනි කාර්යය යහපාලන සංස්කෘතියක් කරා ප්‍රවේශ වීමේ දී සැලකිය යුතු වැදගත් සංධිස්ථාන වේ.

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 79.3% ක් වන රාජ්‍ය ණය අනුපාතිකය 2020 වනවිට 70% දක්වා අඩුකරලීම සඳහා රජය විසින් විචක්ෂණශීලී ණය කළමනාකරණ ක්‍රමෝපායක් හඳුන්වා දී ඇත. ජීවන වියදම සැහැල්ලු කරමින් සියලුම සමාජ ස්තර වලට අයත් රටේ ජනතාවගේ ආර්ථික තත්වය නංවාලීම සඳහා අප රජය විසින් පියවර ගෙන ඇත.

ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා සහාය ලබා දීමට සහ යටිතල පහසුකම්වල ගුණාත්මක තත්වය වැඩිදියුණු කිරීම සහ එමඟින් කඩිනම් ආර්ථික වර්ධනයකට සහාය දීම සඳහා කඩිනම් හා ශීඝ්‍ර පියවර ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම හඳුනාගනිමින්, "ගම්පෙරළිය" ලෙස හැඳින්වෙන වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන අප රජය විසින් හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන දිවයින පුරා කඩිනම් පදනමින් ක්‍රියාත්මක වීම 2018 ජූලි මස ආරම්භ වූ අතර, එය 2020 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. මෙම වැඩසටහන යටතේ රුපියල් මිලියන 19,883ක වටිනාකමක් දරන ව්‍යාපෘති 51,509ක් අනුමත කර ඇති අතර ඒවා ප්‍රශස්ත අයුරින් ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද, විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය (DCB), ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන (RISP), ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන හා "ගම්පෙරළිය" - සීඝ්‍ර ග්‍රාමීය සංවර්ධන වැඩසටහන වැනි වැඩසටහන් මාගේ අමාත්‍යාංශයේ මාර්ගෝපදේශකත්වය හා අධීක්ෂණය යටතේ සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අනුව, 16.913ක් වූ විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය ව්‍යාපෘති, 3,742 ක් වූ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහනේ ව්‍යාපෘති, ආගමික මධ්‍යස්ථාන 361ක් සංවර්ධනය කිරීම සහ 25,250ක් වූ ගම්පෙරළිය ව්‍යාපෘති වශයෙන් සමස්තයක් ලෙස කුඩා පරිමාණ ව්‍යාපෘති 46,266ක් 2018 වර්ෂය තුළ බිම් මට්ටමින් ක්‍රියාත්මක කර ඇත. මෙම සියලු ව්‍යාපෘති සඳහා දරන ලද සම්පූර්ණ ආයෝජනය රුපියල් බිලියන 16 ඉක්මවා ඇත.

සීඝ්‍රයෙන් පුළුල් වන ගෝලීය සංදර්භයක, ඊට සමගාමී වේගයෙන් අප රට නවීන දේශයක් බවට පත් කිරීමේ දිගු දුෂ්කර ගමන් මාර්ගයට ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය පෙරටු කරගෙන අපගේ ජාතිය අවතීර්ණ වී ඇති බව සඳහන් කරමින් මෙම සටහන අවසන් කිරීමට මම කැමැත්තෙමි.

මෙම ප්‍රගතිය අත්පත් කරගැනීම සඳහා මා වෙත ලබාදුන් පූර්ණ සහයෝගය සඳහා ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාශයේ සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල නිලධාරීන් වෙනුවෙන් ස්තූතිය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කරගනිමි.

රනිල් විමසිංහ

**රනිල් වික්‍රමසිංහ**
අග්‍රාමාත්‍ය හා ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන,
උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍ය

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු  අමාත්‍යාංශය 2018 වසර තුළ ලබා කර ගත් ප්‍රගතිය පිලිබඳ වන වාර්තාව සඳහා මාගේ සුභ පැතුම් එක් කිරීමට ලැබීම මා ලද භාග්‍යක් කොට සළකමි.

දේශපාලන වශයෙන් මෙන්ම සමාජ සහ  ආර්ථික වශයෙන් ද සැලකිය යුතු අභියෝග ගණනාවක් ජය ගනිමින් තිරසර සංවර්ධනයක් වෙනුවෙන් රට මෙහෙය වීම වත්මන් රජයේ ප්‍රධාන අරමුණ වී තිබේ. කාලීනව මතුවන ගැටළු නිරාකරණය කරගනිමින් එකී අරමුණ කරා යන ගමනේ මූලාරම්භය ග්‍රාමීය ජනතාව ඉලක්ක කරගත් සංවර්ධන ක්‍රියාවලියක් බව අප රජය තරයේ විශ්වාස කරනු ලබයි.

ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමත්, ජනජීවිතය මනාව පවත්වා ගැනීම සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් මූලික පදනම ලෙස සලකා අප අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කර තිබේ.

ජාතික ආර්ථික ඉලක්ක සපුරාලමින් රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යයේදී  ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ උපදෙස් සහ මග පෙන්වීම මත ක්ෂේත්‍ර ගණනක සංවර්ධන ව්‍යාපෘති අප අමාත්‍යාංශය විසින් සාර්ථකව අවසන් කර ඇති බවට ග්‍රාමීය ජනතාව සාක්ෂි සපයයි.

මතුවන සියලු අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙමින් ඉලක්ක ගත සංවර්ධනයක් වෙනුවෙන් රට මෙහෙයවන ගරු අග්‍රාමාත්‍ය සහ විෂභාර අමාත්‍ය රනිල් වික්‍රමසිංහ  මැතිතුමන්ට ගෞරවණීය ප්‍රණාමය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එසේම අමාත්‍යාංශයේ ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දෙන සහයෝගය අගය කරන අතර  ග්‍රාමීය ජන ජීවිතය ශක්තිමත් කිරීමත්, කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ සහ මහා පරිමාණ ව්‍යාපෘති කාලීන අවශ්‍යතා මත සිදු කිරීමත්, විනිවිද භාවයෙන් යුතු ආර්ථික රටාවක් ඇති කිරීමත් තුලින් අභිමානවත් අනාගතයක් නිර්මාණය කිරීම සඳහා අප රජයටත් සමස්ත රාජ්‍ය සේවාවටත් ශක්තිය සහ ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.



නිරෝෂන් පෙරේරා,
**රාජ්‍ය අමාත්‍ය,**
**ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු  අමාත්‍යාංශය**

## ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය



2018 වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් අත්පත් කරගත් ප්‍රගතිය ඇතුළත් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාව මා විසින් ඉදිරිපත් කරනුයේ හදපිරි සතුටිනි.

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, සහ යෞවන කටයුතු අමාත්‍යාංශය, එහි ආරම්භයේ සිටම රටෙහි සමාජ-ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා කිරීමට සහ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ජාතික ප්‍රතිපත්ති පිළියෙල කිරීමේ ක්‍රියාවලියේ වගකීම දරන ප්‍රධාන අමාත්‍යාංශයක් වශයෙන්, ගම්පෙරළිය සීඝ්‍ර ග්‍රාමීය සංවර්ධන වැඩසටහන, විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන සඳහා විශේෂ අවධානය යොමුකරන අතර, මෙම අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනවල ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා එම ආයතනවලට සම්බන්ධීකරණ හා පහසුකම් සැපයීමේ කාර්යයේදී ප්‍රධාන භූමිකාවක් ඉටු කරනු ලැබේ.

මීට අමතරව, රැකියා වෙළඳ පොළට ප්‍රවේශ වීම සඳහා වැඩි අවස්ථා ලබා දෙමින් පාසැල් හැරගිය තැනැත්තන්ගේ වෘත්තීය පුහුණුව හා නිපුණතා වැඩි දියුණු කරගැනීම සඳහා මෙන්ම, නිපුණතා සහ පෞරුෂත්වය සමගින් ජාතික සංවර්ධනය සඳහා සක්‍රීයව සහභාගීවීමේ හැකියාව සපිරි තරුණතරුණියන් බවට තරුණතරුණියන් සවිබල ගැන්වීමේ අභිලාෂය සහිතව යෞවන කටයුතු සම්බන්ධ ප්‍රධාන ආයතනය ලෙසින් මෙම අමාත්‍යාංශය විසින් සක්‍රීය කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

මෙම අමාත්‍යාංශයට පැවරී ඇති කාර්යභාරය සාර්ථකව ඉටු කරලීම උදෙසා නායකත්වය හා එලදායි මාර්ගෝපදේශකත්වය ලබා දෙන ගරු අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත මාගේ කෘතඥතාවය පළකිරීම සඳහා මෙය අවස්ථාවක් කරගනිමි. තවද මෙම කාර්යසාධනය අත්පත් කරගැනීම සඳහා පූර්ණ සහයෝගය ලබාදුන් මෙම අමාත්‍යාංශයේ සහ මෙම අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතනවල නිලධාරීන් සඳහා ද මාගේ ස්තූතිය පිරිනැමිය යුතු වේ.

**වී.සිවඥානසෝති**
**ලේකම්**

# 01 පරිච්ඡේදය

# ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, සහ යෞවන කටයුතු අමාත්‍යාංශය

## 1.1 හැඳින්වීම

පෙර පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙනුවට 2018.12.28 දිනැති අංක 2103/33 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයට අනුව ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය 2018 දෙසැම්බර් මස පිහිටුවන ලද අතර 2019.03.18 දිනැති අංක 2115/09 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් මෙම අමාත්‍යාංශය ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, සහ යෞවන කටයුතු අමාත්‍යාංශය ලෙස සංශෝධනය කර ඇත. ඒ අනුව, අමාත්‍යාංශයට අදාල ආයතනයන් හා කාර්යභාරයන් ද නැවත සංශෝධනය කර ඇත.

ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලැබේ. ජනතාවගේ ආදායම් මට්ටම වැඩිකිරීමේ හා තරුණතරුණියන්ට පාසැල්/වෘත්තීය/විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිම කිරිමෙන් අනතුරුව වාසිදායක රැකියා අවස්ථා සඳහා ප්‍රවේශ වීමේ අවස්ථා සම්පාදනය කරන අතර ශ්‍රී ලංකාව දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අභිලාෂයෙන් යුතුව අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය පියවර සැලසුම් කරනු ලැබේ. ඔවුන්ට වැදගත් ජීවන රටාවක් සඳහා මාර්ගයක් සුරක්ෂිත කරන අතර අනාගත අභියෝගවලට මුහුණදීම සඳහා තරුණතරුණියන්ගේ කුසලතා වර්ධනය කිරීම මීට ඇතුළත් වේ. මීට අමතරව, අමාත්‍යාංශය විසින් වගකීම් දරන අනෙක් ක්ෂේත්‍රය වනුයේ තිස් වසරක් පැවති යුද්ධයෙන් පීඩාවට පත් වූ ජනතාව පුනරුත්ථාපනය හා නැවත පදිංචි කිරීමේ කටයුතු වේ. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ඉටුකළ යුතු ප්‍රධාන කර්තව්‍ය වනුයේ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම හා ඔවුන්ගේ මානුෂීය අවශ්‍යතා හා අනෙකුත් අවශ්‍යතා සපුරාලීම, නොමඟ ගිය පුද්ගලයන්ගේ සමාජ සංකලනය හා රටේ සමාජ ආර්ථික දියුණුව සඳහා ඔවුන්ගේ අයිතිවාසිකම් හා සංස්කෘතිකමය අගයන් ආරක්ෂා කරමින් යහපත් පුද්ගලයන් ලෙස ඔවුන් සමාජයට යළිත් එකතු කරගැනීම වේ.

තවද, රටේ ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපෘති හා වැඩසටහන් සකස් කළ යුතු වේ. සංවර්ධනයේදී ප්‍රාදේශීය සමබරතාවය තහවුරු කර ගැනීමට හා රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබේ. යහපාලන මූලධර්ම සමඟ අනුගතව සමාජ සුභසාධනය, දිගු කාලීන සෞභාග්‍යය සහ තිරසර සංවර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා මෙම පියවර ඉලක්ක ගතකර ඇත. මතු සඳහන් කෙරෙන ප්‍රතිපත්තිමය නියමයන්ගේ මඟ පෙන්වීම යටතේ මෙම පියවර සකස් කර ඇත.

I. “මෛත්‍රී පාලනයක්” 2015 ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය
II. “මාස හැටකින් අලුත් රටක්” මැයෙන් වූ රජයේ පංචවිධ ක්‍රමෝපායික සැලසුම: ආර්ථිකය ගොඩනැංවීම, දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වීම, සැවොම සඳහා නිදහස සුරක්ෂිත කිරීම, යටිතල පහසුකම් හා ආයෝජන වැඩි දියුණු කිරීම, අධ්‍යාපනික සංවර්ධනය යන පස් වැදෑරුම් ඉලක්ක සාක්ෂාත් කරගැනීම මෙයින් අවධාරණය කෙරේ.
III. 2017 ජනවාරි මාසයේදී අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ප්‍රකාශයට පත්කළ “බලගතු ශ්‍රී ලංකාවක්”
IV. 2017 සැප්තැම්බර් මස 04 වන දින ප්‍රකාශයට පත් කළ “ 2025 දැක්ම: පොහොසත් රටක් -නවීන ආර්ථිකයක වෙනස් වන මුහුණුවර” ප්‍රකාශනය
V. 2015 නොවැම්බර් මස 05 වන දින, 2016 ඔක්තෝම්බර් මස 27 වන දින හා 2017 ඔක්තෝම්බර් මස 20 වන දිනයන්හිදී ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශ හා ඉදිරි දැක්ම
VI. රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020

## 1.2 ප්‍රධාන කාර්යයන්

- ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු යන විෂයයන්ට අදාළව හා මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවලට අයත්වන විෂයයන් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම, අධීක්ෂණය හා ඇගයීමේ කටයුතු
- ජාතික ආර්ථික හා සමාජ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- ජාතික සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම
- ආර්ථික සංවර්ධනයෙහිලා පුද්ගලික අංශයේ සහභාගිත්වයට පහසුකම් සැලසීම සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශය අතර සම්බන්ධීකරණ කටයුතු
- අදාළ ජාතික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන අධිකාරීන් සමඟ එකඟ වූ කාලරාමු තුළ හා අයැවයගත සම්පත් සීමාවන් තුළ ඉහත සඳහන් කළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ප්‍රශස්ත සම්පත් කළමනාකරණයකින් යුක්තව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීම සඳහා නූතන කළමනාකරණ ශිල්ප ක්‍රම යොදාගනිමින් උචිත ක්‍රමෝපාය සැකසීම
- ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය හා ආර්ථික සංවර්ධනයෙහිලා ජාත්‍යන්තර සහයෝගීතාවය ලබාගැනීම තහවුරු කරගැනීම
- ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ද ඇතුළු දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආදායම් විෂමතාවය අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- ගැටුම් හේතුවෙන් අවතැන් වූ සාමාන්‍ය ජනතාව නැවත පදිංචි කිරීම සඳහා වැඩසටහන් හා ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- ගැටුම් හේතුවෙන් කායික හා මානසිකව පීඩාවට පත්ව ඇති ජනතාව නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය සඳහා වැඩසටහන් හා ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම
- නැවත පදිංචි කිරීමේ කාර්යයන් වලදී රජයේ සහ ආධාර නියෝජිතායතන, රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සමාජය සමඟ සම්බන්ධීකරණ කටයුතු
- අවතැන්වූවන් සඳහා අත්‍යවශ්‍ය සේවා සැපයීමේදී පැනනඟින ගැටලු සම්බන්ධව සම්බන්ධීකරණ කටයුතු
- ගැටුම් හේතුවෙන් පීඩාවට පත් වූ පුද්ගලයන් හා හානි වූ දේපළ පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
- ත්‍රස්තවාදී ක්‍රියාවන්හි නියුක්ත වූ පුද්ගලයන් ප්‍රධාන සිවිල් ජනජීවිතයට යළි එක්කරගැනීම සඳහා ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම
- යෞවන කටයුතු විෂයට අදාළ ව්‍යාපෘති හා වැඩසටහන් සම්පාදනය, අධීක්ෂණය හා ඇගයීම
- තරුණතරුණියන් නිවැරදි දිශානතියකට යොමු කිරීම සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සංවර්ධන සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- රැකියා විරහිත තරුණතරුණියන් කේන්ද්‍රකරගත් නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- තරුණ සංවිධාන සම්බන්ධ කටයුතු
- තරුණ ප්‍රජාව සඳහා ස්වේච්ඡා වැඩසටහන් සම්පාදනය කිරීම
- මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයිති ආයතන යටතේ පවතින අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු
- මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ආයතන අධීක්ෂණය කිරීම

## 1.3 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය

අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන ආයතන සමඟ කාර්යයන් සම්බන්ධීකරණය සඳහා සහ අමාත්‍යාංශය වෙත පැවරී ඇති කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය පහත දැක්වෙන ප්‍රධාන අංශ වලින් සමන්විත වේ .

- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය
- නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන හා උතුරු පළාත් සංවර්ධන අංශය
- යෞවන කටයුතු අංශය
- ප්‍රාදේශීය සංවර්ධන අංශය

# 02 පරිච්ඡේදය

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය

### 2.1 දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

තිරසර ජාතික ප්‍රතිපත්තීන් තුළින් සාර්ව සහභාගිත්ව ආර්ථික වර්ධනය සහ සෞභාග්‍යය

**මෙහෙවර**

සාර්ව සහභාගිත්ව ආර්ථික වර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තීන් සහ ගතික ආර්ථික ක්‍රමෝපායන් සම්පාදනය හරහා සෑම පුරවැසියෙකු උදෙසාම සංවර්ධනයේ ප්‍රතිලාභ සහතික කිරීම

**අරමුණු**

- ආර්ථික සංවර්ධනය අත්පත් කරගැනීම
- දිළිඳුකම පිටුදැකීම
- රැකියා වියුක්තිය පිටුදැකීම හා ඌන රැකියා නියුක්තිය අවම කිරීම
- දේශීය ඉතුරුම් ප්‍රවර්ධන මඟින් ආයෝජන ප්‍රවර්ධන
- ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් ප්‍රවර්ධනය
- සාධාරණ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම
- තරුණ ප්‍රජාව කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව නිපුණතාවයෙන් හෙබි මානව සම්පතක් ජනිත කිරීම

## 2.2 සංවිධාන ව්‍යුහය




ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ කාර්යයන් මනාව සිදු කිරීම සඳහා එය පහත සඳහන් පරිදි අංශ හයකට වෙන් කර ඇත.

- පරිපාලන
- සැලසුම්
- ආර්ථික කටයුතු
- සංවර්ධන හා ව්‍යාපෘති
- අභ්‍යන්තර විගණන
- මූල්‍ය

මීට අමතරව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවද ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ විෂය පථය යටතට ගැනේ.

### 2.2.1 පරිපාලන අංශය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ පාලන අංශය විසින් අමාත්‍යාංශයේ සියලු අභ්‍යන්තර පරිපාලන කටයුතු හා සමස්ත කාර්ය මණ්ඩලයේ ආයතනික කටයුතු සිදු කරනු ලැබේ. මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන ආයතනවල පරිපාලන කටයුතු ආශ්‍රිත සියලු ගැටලු සම්බන්ධීකරණයද මෙම අංශය විසින් සිදු කෙරේ.

#### 2.2.1.1 කාර්යයන්

- අමාත්‍යාංශයේ සියලු අභ්‍යන්තර පරිපාලන කටයුතු සහ එහි කාර්ය මණ්ඩලයේ සියලු ආයතනික හා පරිපාලන කටයුතු
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට අදාළ පරිපාලන හා ආයතනික කටයුතු සම්බන්ධීකරණය
- පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සහ උපදේශක කාරක සභාව, මහජන පෙත්සම් කාරක සභාව, රාජ්‍ය ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධ කටයුතු
- අමාත්‍යාංශයේ සියලු ප්‍රසම්පාදන කටයුතු

#### 2.2.1.2 2018 වර්ෂයේ කාර්යසාධනය

| අනු අංක | කාර්යය | ප්‍රගතිය |
|---|---|---|
| 1 | කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ රාජකාරී කටයුතු (පෞද්ගලික ලිපිගොනු සංඛ්‍යාව - 228) | පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ පරිපාලන හා අනෙකුත් සියලුම කටයුතු නොපමාව කාර්යක්ෂමව ඉටු කර ඇත. නියමිත උසස්වීම් ලබාදීමට තීරණය කර රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට යැවීම හා අනුමතින් ලබාගෙන උසස්වීම් ලබාදීම, වාර්ෂික වේතනාධික ලබාදීම. |
| 2 | විශ්‍රාම වැටුප් සැකසීම | විශ්‍රාම වැටුප් සැකසීම සම්බන්ධ සියලුම කටයුතු නොපමාව ඉටු කර ඇත. (විශ්‍රාම ගිය නිලධාරීන් සංඛ්‍යාව - 02) |
| 3 | නිවාඩු, අතිකාල, ගමන් වියදම් හා දුම්රිය බලපත්‍ර කටයුතු | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ නිවාඩු, අතිකාල, ගමන් වියදම් හා දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම සහ අමාත්‍ය/රාජ්‍ය අමාත්‍ය පෞද්ගලික කාර්ය මණ්ඩලයේ හා යටත් ආයතනයන්හි අතිකාල ගමන් වියදම් සම්බන්ධ සියලුම රාජකාරී කටයුතු අප්‍රමාදව හා කාර්යක්ෂමව ඉටු කර ඇත. |
| 4 | ණය සම්බන්ධ කටයුතු | අමාත්‍යාංශ නිලධාරීන්ගේ ණය අවශ්‍යතා නොපමාව ඉටු කර ඇත. |
| | | උත්සව අත්තිකාරම් - 292 |
| | | ආපදා ණය - 103 |
| | | විශේෂ අත්තිකාර - 41 |
| 5 | විදේශීය පුහුණු පාඨමාලා/දේශීය පුහුණු පාඨමාලා කටයුතු (මානව සම්පත් සංවර්ධනය) | අමාත්‍යාංශ නිලධාරීන්ගේ, දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ හා අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතනයන්හි නිලධාරීන්ගේ රාජකාරී විදේශ සංචාරයන් හා දේශීය පුහුණු පාඨමාලා සම්බන්ධ රාජකාරී කටයුතු කාර්යක්ෂමව හා අප්‍රමාදව ඉටු කර ඇත. (රාජකාරී විදේශ සංචාර සංඛ්‍යාව - 353 දේශීය පුහුණු - 28 ) |

| | | |
|---|---|---|
| **6** | සහනදායී පදනම මත වාහන බලපත්‍ර නිකුත් කිරීම | අමාත්‍යාංශයේ හා යටත් ආයතනයන්හි කාර්ය මණ්ඩලය වෙනුවෙන් සහනදායී පදනම මත වාහන බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු නොපමාව හා කාර්යක්ෂමව ඉටු කර ඇත. (බලපත්‍ර 102 ක් නිකුත් කර ඇත) |
| **7** | **ප්‍රවාහන අංශයේ රාජකාරී කටයුතු** | |
| **i.** | ගරු අමාත්‍යතුමා/ගරු රාජ්‍ය අමාත්‍යවරු/ නිලධාරීන් වෙත ප්‍රවාහන පහසුකම් සැපයීම | වාහන 104 ක් කළමනාකරණය කර ඇත. |
| **ii.** | සංචිත ප්‍රවාහන පහසුකම් සැපයීම | |
| **iii.** | වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | |
| **8** | **අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලට අදාළ පරිපාලන හා ආයතනික කටයුතු සම්බන්ධීකරණය** | කාර්යක්ෂමව හා අප්‍රමාදව ඉටු කර ඇත. |
| | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | |
| | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | |
| | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | |
| | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | |
| | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | |
| | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව | |
| | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | |
| | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය | |
| **9** | අමාත්‍යාංශය යටතේ පවතින සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා සභාපතිවරු හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පත් කිරීමට අදාළ කටයුතු | එක් එක් ආයතන පිහිටුවා ඇති අතර පනත් ප්‍රකාරව පත්වීම් සිදු කර ඇත. |
| **10** | පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කොට යැවීම | අප්‍රමාදව ඉටු කර ඇත. |
| **11** | උපදේශක කාරක සභා/මහජන පෙත්සම් කාරක සභාව/රාජ්‍ය ගිණුම් කාරක සභාව/පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධ කටුයුතු | විෂයගත කරුණු අදාළ ආයතන වෙතින් ලබා ගෙන නියමිත දිනට පෙර පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත. |
| **12** | **ප්‍රසම්පාදන අංශයේ රාජකාරී කටයුතු** | |
| | මෙම අමාත්‍යාංශයට භාණ්ඩ, සේවා,වැඩ, උපදේශන සේවා හා වෙනත් මිලදී ගැනීම්වලට අදාළ සියළුම ප්‍රසම්පාදන කටයුතු. | අමාත්‍යාංශයේ පාලන හා ගිණුම් අංශ සඳහා නව කාර්යාල පරිශ්‍රයක් කුලී පදනම මත ලබා ගැනීම. ( ලිපිනය නො. 35, ලේක්හවුස් ගොඩනැගිල්ල, 02 වන මහල, ඩී.ආර් විජේවර්ධන මාවත, කොළඹ- 10 ) |
| | | ස්ථාවර වත්කම් මිලදී ගැනීම - මේස 26 , පුටු 60, වානේ අල්මාරි, රාක්ක 07, |
| | | මුද්‍රණ යන්ත්‍රය 09, ලැප්ටොප් 18, ෆෝටෝ කොපි යන්ත්‍ර, ටැබ් යන්ත්‍ර 04 |
| | | ස්කැන් යන්ත්‍ර 02, මෘදුකාංග 02, කඩදාසි කපන යන්ත්‍රය 01, ටෙලිවිෂනය 01, |
| | | මේස ලාම්පු 05, ෆැක්ස් යන්ත්‍ර 01, UPS 05, Pen drive 20, |
| | | මාධ්‍ය උපකරණ - 1. Tripod 01, Memory Card Redder 01, 7" Field monitor Wirless clip on Microphone System |

| | | |
|---|---|---|
| | | Camera Body with standed lence and Telelence 01 , Flash Gun & Two Camera Batteries 01 . Vedio Camera 01 |
| | | සුව සැරිය - ගිලන් රථ සේවාව ඌව පළාත, උතුරු පළාත, උතුරු මැද පළාත, වයඹ පළාත සහ මධ්‍යම පළාත්වල දියත්කරීම සඳහා ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් පුවත්පත් දැන්වීම් පළ කිරීම. |
| | | අමාත්‍යාංශයේ ආරක්ෂක, සනීපාරක්ෂක හා පානීය ජල බෝතල් සැපයීම වෙනුවෙන් සේවා ගිණුම් පවත්වාගෙන යාම. |
| 13 | **තොරතුරු තාක්ෂණ අංශයේ රාජකාරි කටයුතු** | |
| | රැකියා විරහිත උපාධිධාරීන් අභ්‍යාසලාභී පුහුණුවන්නන් ලෙස බඳවාගැනීමට අදාළ කටයුතු සිදු කිරීම | රැකියා විරහිත උපාධිධාරීන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනීමේ රජයේ වැඩසටහන යටතේ අයදුම්පත් බාර ගැනීමේ අවසාන දිනය වන 2017.09.08 වන විට උපාධිධාරීන් විසින් යොමු කරන ලද අයදුම්පත් 56280 ක් ලැබිණි. |
| | | ඒ අනුව 2018.08.20 දින උපාධිධාරීන් 3614 ක් පත්වීම් ලබා ගන්නා ලදි. |
| | | පුහුණුවට සම්බන්ධ වූ අභ්‍යාසලාභී උපාධිධාරීන් සංඛ්‍යාව - 3614 |
| | | ඉල්ලා අස් වූ අභ්‍යාසලාභී උපාධිධාරීන් සංඛ්‍යාව - 106 |
| | | දැනට පුහුණුව ලබන අභ්‍යාසලාභී උපාධිධාරීන් සංඛ්‍යාව - 3508 |
| | කොළඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන අංශය මගින් සංවිධානය කරනු ලබන රැකියා පොල වැඩසටහන සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් සම්බන්ධ වීම | කොළඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන අංශය මගින් මෙම අමාත්‍යාංශයට කරන ලද ආරාධනාවක් අනුව 2017 වර්ෂයේ ඒ සඳහා අමාත්‍යාංශය නියෝජනය කළ අතර 2018 වර්ෂයේදී ද එම වැඩසටහන සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන ලදි. (රාජ්‍ය සේවය පිළිබඳව උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් හා 2018 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ අධ්‍යයනයන් අවසන් කළ උපාධිධාරීන්ට රාජ්‍ය සේවය පිළිබඳව දැනුමක් ලබාදීමට කටයුතු කිරීම) |

## 2.2.2 සැලසුම් අංශය

ඵලදායි හා සංගත ජාතික ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති රට වෙනුවෙන් සකස් කිරීමේ කාර්යය සඳහා සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම සැලසුම් අංශයට පැවරී තිබේ.

- රජයේ රාජ්‍ය ආයෝජන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය
- විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටන (DCB) , ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන හා ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කිරීම, ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා නිර්දේශ ලබාදීම, ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධීකරණය, අධීක්ෂණය කිරීම හා ප්‍රගති සමාලෝචන කටයුතු
- "ගම්පෙරළිය" - වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ජාතික මට්ටමේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ/ අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු
- විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ සතිපතා රැස්වීම් සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම

- ආර්ථික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ හා තිරසර සංවර්ධනය පිළිබඳ විශේෂ කාරක සභාවේ කටයුතු සම්බන්ධීකරණය
- අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තා, ප්‍රගති වාර්තා, වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම
- අමාත්‍යාංශ විෂය පථය යටතේ වන ආයතන සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යයන් සම්බන්ධීකරණය යන කාර්යවලදී මෙම අංශය ප්‍රමුඛ කාර්යයක් ඉටු කරනු ලැබේ.

### 2.2.3 ආර්ථික කටයුතු අංශය

ආර්ථික කටයුතු අංශයේ ප්‍රධාන වගකිම් වනුයේ; අමාත්‍යාංශයේ කාර්ය සැලසුමේ සඳහන් පරිදි ප්‍රතිඵල අත්පත් කරගැනීම තහවුරු කරගැනීම සඳහා රජයේ සියලුම ආර්ථික ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති අධීක්ෂණය කිරීම. ජාතික ආර්ථික ප්‍රතිපත්ති හා ක්‍රමෝපාය සැකසීමේ කටයුතු සම්පාදනය හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම, රාජ්‍ය හා පුද්ගලික ආයතන/ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ වගකීම, රක්ෂණ කර්මාන්තය හා ආශ්‍රිත නීති සඳහා පහසුකම් සැපයීම වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ණය තොරතුරු කාර්යාංශය, ජාතික රක්ෂණ භාර අරමුදල, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සහ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව යන ආයතනවල සම්බන්ධීකරණ හා අධීක්ෂණය කිරීමේ කටයුතු ආර්ථික කටයුතු අංශය විසින් 2018 මැයි මස 12 වන දින දක්වා සිදුකරන ලදී.

ඉන්පසු, 2018 මැයි මස සිදුවූ අමාත්‍ය මණ්ඩල සංශෝධනයෙන් අනතුරුව පහත සඳහන් ආයතන ආර්ථික කටයුතු අංශය වෙත පැවරි ඇත.

i. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
ii. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
iii. ශ්‍රීලංකා රක්ෂණ සංස්ථාන හා එහි අනුබද්ධිත සමාගම් :
   අ) සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ්
   ආ)කැන්විල් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - ග්‍රෑන්ඩ් හයට් කොළඹ
   ඇ)ග්‍රෑන්ඩ් හයට් හෝටලය කොළඹ
   ඈ) ලංකා හොස්පිටල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

- විශිෂ්ට ගණයේ වෛද්‍යවරුන් හා නවීනතම වෛද්‍ය උපකරණවලින් සමන්විතව ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙත සුවිශේෂී වෛද්‍ය සත්කාරක සේවා සපයන සුපිරි ගණයේ රෝහලක් වන ලංකා හොස්පිට්ල්ස්හි පාලන කොටස් හිමිකාරිත්වය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් දරනු ලැබේ.
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රිසෝට්ස් ඇන්ඩ් ස්පා ඔස්සේ සිය ව්‍යාපාරික මෙහෙයුම් ඉහළ වර්ධනයක් සහිත විනෝදාස්වාද ක්ෂේත්‍රය කරා විවිධාංගිකරණය කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මූලික පියවර ගෙන ඇත. ගෝලීය වශයෙන් සුප්‍රසිද්ධ හෝටල් ජාලයේ ශ්‍රී ලංකාවේ ග්‍රෑන්ඩ් හයට් හෝටල් ව්‍යාපෘතිය තුළ ද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ආයෝජන සිදු කර ඇත.

### 2.2.4 සංවර්ධන හා ව්‍යාපෘති අංශය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ සංවර්ධන හා ව්‍යාපෘති අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම, විවිධ ආයතන මඟින් ක්‍රියාත්මක කරන බහු ආංශික ව්‍යාපෘති සම්බන්ධීකරණය හා ආධාර සපයන නියෝජිතායතන සම්බන්ධිකරණය කිරීම වේ. එසේම, වැඩසටහන්වල ප්‍රගති සමාලෝචන, අධීක්ෂණ හා ඇගයීම් කාර්යයන් මෙම සංවර්ධන හා ව්‍යාපෘති අංශයේ විසින් සිදු කරන අනෙකුත් කාර්යයන් වේ.

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතට ගැනෙන දෙපාර්තමේන්තු හා ආයතන විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචනය, සම්බන්ධීකරණය හා අධීක්ෂණය හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී පහසුකම් සැලසීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයද ඇතුළුව අදාළ ආයතන වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමද මෙම අංශයේ අනෙකුත් වගකීම් වේ.

මීට අමතරව, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID), ලෝක ආහාර වැඩසටහන (WFP), ලෝක බැංකුව, යුරෝපා සංගමය හා ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතන විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතින්හි ඉලක්ක හා අරමුණු අත්පත් කරගැනිම සඳහා සඳහා අවශ්‍ය කෙරෙන සම්බන්ධීකරණය මෙම අංශය විසින් සපයනු ලැබේ

එසේම, මෙම අංශය උතුරු පළාත් සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවේ හා උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකායේ කටයුතු වලට සම්බන්ධ අතර උතුරු පළාතේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ඒ ඔස්සේ සමාජ හා ආර්ථික ගැටලු මත පදනම්ව ප්‍රතිපත්ති තිරණ ගැනීමේ කාර්යයට සම්බන්ධ වේ.

## 2.2.5 අභ්‍යන්තර විගණන අංශය

### 2.2.5.1 කාර්යයන්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශ විෂය පථය යටතේ පවතින ආයතනවල ක්‍රියාත්මක කරන අභ්‍යන්තර පිරික්සුම හා පාලන පද්ධතිය, එහි සැකසුම මෙන්ම එහි යථා කාර්යසාධනය ද ඔස්සේ වඩාත් ඵලදායි ප්‍රතිඵල අත්පත් කරගැනීම උදෙසා පවතින ප්‍රශස්ත ප්‍රතිඵලදායි ක්‍රමය බවට සත්‍යාපනය කිරීම සඳහා පරීක්ෂා කිරීම

- ගිණුම්කරන හා අනෙකුත් වාර්තාවල නිරවද්‍යතාවය හා විශ්වසනීයතාව තහවුරු කරගැනීම සඳහා අනුගමනය කරන ගිණුම්කරන පරිපාටිවලට අනුගත වෙමින් නිරවද්‍ය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අවශ්‍ය කෙරෙන තොරතුරු ප්‍රමාණාත්මකව ලබාදෙන්නේ දැයි නිශ්චය කරගැනීම.
- කාර්ය මණ්ඩලය විසින් ඔවුන් වෙත පැවරී ඇති කාර්යයන් හා වගකීම් ඉටු කිරීමේදී දක්වන කාර්යසාධනය ඇගයීම.
- අමාත්‍යාංශය හෝ එහි ආයතනවල දේපළ සඳහා වන අලාභ හෝ හානිවීම් වැළැක්වීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන සලසා තිබේදැයි තහවුරු කරගැනීම සඳහා පරීක්ෂා කිරීම.
- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කරන උපදෙස් නිශ්චිතව පිළිපදින්නේද යන්න තහවුරු කරගැනීම.
- අපතේ යෑම්, නිෂ්කාර්ය ධාරිතාව, සහ අරමුදල් ප්‍රමාණය ඉක්මවා වියදම් කිරීම අනාවරණය හා අත්හැර දැමීම සඳහා ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය නිශ්චය කරගැනීම සඳහා පරීක්ෂා කිරීම.
- අමාත්‍යාංශය හා හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ගිණුම් පරිපාටි හා අරමුදල් වැයවීමකට තුඩුදෙන මෙහෙයුම් පරීක්ෂා කිරීම සේම අමාත්‍යාංශය හා හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල දේපළ හා වත්කම් පරීක්ෂාකාරී, අරපිරිමැසුම්දායක හා යෝග්‍ය ආකාරයෙන් පරිශීලනය වන්නේදැයි තහවුරු කරගැනීම.
- අවශ්‍යවන සෑම අවස්ථාවකම විශේෂ විමර්ශන පැවැත්වීම.
- අමාත්‍යාංශයේ විෂය පථයට අයිති දෙපාර්තමේන්තුවල හා ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සෑම මාස තුනකට වරක් පැවැත්වීම.

### 2.2.5.2 2018.12.31 දක්වා කාර්යසාධනය

- අමාත්‍යාංශ මූලික වාර්තාව 2018
- අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් මස බැංකු සැසඳුම පරීක්ෂා කිරීම.
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ පොදු අත්තිකාරම් "බී" ගිණුම - 2017 පරීක්ෂා කිරීම.
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය හා තොගපොත් පරීක්ෂා කිරීම.
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ වවුචර් සහ පරිපාලන කටයුතු පරීක්ෂා කිරීම.
- ජාතික යොවුන් සේනාංකයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ගමන්වියදම් ඉල්ලීම් පරීක්ෂා කිරීම.
- අමාත්‍යාංශයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරීක්ෂා කිරීම - ඌනතා/අතිරික්ත හඳුනාගැනීම
- අමාත්‍යාංශයේ විදේශ මූල්‍යයන ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂා කිරීම
- විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යැවෙන මාසික සාරාංශ, දෛනික ධාවන සටහන් සමඟ පරීක්ෂා කිරීම
- අමාත්‍යාංශයේ 2018 ජූලි මස බැංකු සැසඳුම පරීක්ෂා කිරීම
- අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ විසර්ජන ගිණුම හා 2018 වැයශීර්ෂ ලෙජර් පරීක්ෂා කිරීම.
- අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ මාර්තු හා අප්‍රේල් මස වවුචර් හා මුදල් පොත පරීක්ෂා කිරීම.
- අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ මැයි හා ජූනි මස වවුචර් හා මුදල් පොත පරීක්ෂා කිරීම.
- අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන ගොනුවල සාම්පලයක් පරීක්ෂා කිරීම procumbent – procurement
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය හා තොගපොත පරීක්ෂා කිරීම.
- අමාත්‍යාංශයේ, අමාත්‍යාංශයේ විෂය පථයට අයිති දෙපාර්තමේන්තුවල හා ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වන ලදී.

### 2.2.6 මූල්‍ය අංශය

මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ;

- අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම .
- අමාත්‍යාංශයේ වැටුප් හා අනෙකුත් ගෙවීම් සිදු කිරීම.
- අමාත්‍යාංශයේ අවසාන ගිණුම් සකස් කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ද ඇතුළුව අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණය.
- අදාළ අධිකාරිත්ව වෙත වියදම් වාර්තාකිරීම හා සටහන් කිරීම.
- අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අමාත්‍යාංශයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා මූල්‍ය තොරතුරු සැපයීම

# 03 පරිච්ඡේදය
# ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය විසින් ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘති/කර්තව්‍යයන් හි කාර්යසාධනය

## 3.1 විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය (DCB) වැඩසටහන 2018

ප්‍රජාවගේ සමාජ-ආර්ථික ජීවන තත්වය නංවාලීමේ අරමුණින්, විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන (DCB) යටතේ එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙත වාර්ෂිකව රුපියල් මිලියන 10.0ක ප්‍රතිපාදනයක් වෙන් කිරීම සඳහා 2016 වර්ෂයේදී ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. ඒ අනුව, 2018 වර්ෂයේදී මෙම විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන සඳහා **රුපියල් මිලියන 2,250.0**ක් වෙන් කරන ලද අතර, දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා **රුපියල් මිලියන 2,186.78** ක වටිනාකමින් යුතු **ව්‍යාපෘති 17,514**ක් අනුමත කර ඇත. මෙම 2018 වර්ෂයේ වැඩසටහනට අමතරව, 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ගෙවීමට නියමිතව තිබූ බිල්පත් පියවීම සඳහා රුපියල් මිලියන 249.24 ක ප්‍රතිපාදනද නිදහස් කර ඇත.

කාණ්ඩගත එක් එක් අංශ යටතේ අනුමත කළ ව්‍යාපෘති හා වෙන්කළ ප්‍රතිපාදන පිළිබඳ විස්තර වගු අංක 3.1 මඟින් දැක්වේ.

| සංවර්ධන අංශ අනුව කාණ්ඩගත කළ ව්‍යාපෘති | ව්‍යාපෘති සංඛ්‍යාව | % | ප්‍රතිපාදන (රු. මිලියන) | % |
|---|---|---|---|---|
| ග්‍රාමීය ජල සැපයුම් | 304 | 2% | 62.93 | 3% |
| ග්‍රාමීය විදුලිබල පහසුකම් | 133 | 1% | 14.71 | 1% |
| ග්‍රාමීය ප්‍රදේශ වෙත ප්‍රවේශ මාර්ග | 2900 | 17% | 692.51 | 32% |
| ආර්ථික යටිතල පහසුකම් | 156 | 1% | 44.00 | 2% |
| ග්‍රාමීය සුභසාධනය | 753 | 4% | 102.37 | 5% |
| ප්‍රජා සංවර්ධනය | 1945 | 11% | 267.60 | 12% |
| කුඩා පරිමාණ වාරිමාර්ග | 105 | 1% | 22.51 | 1% |
| සමාජ සුභසාධනය | 8611 | 49% | 674.36 | 31% |
| සමාජ සේවා | 2289 | 13% | 267.34 | 12% |
| ප්‍රජා ආරක්ෂණ කටයුතු | 48 | 0.3% | 7.42 | 0.3% |
| ජීවනෝපාය සංවර්ධනය | 178 | 1% | 15.24 | 1% |
| ග්‍රාමීය ආර්ථිකය | 92 | 1% | 15.79 | 1% |
| 2018 වර්ෂයේ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | 17,514 | 100% | 2,186.78 | 100% |
| 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා ගෙවීමට තිබූ බිල්පත් පියවීම සඳහා වෙන්කළ මුදල් | | | 249.24 | |
| දිස්ත්‍රික්ක වෙත ලබා දී ඇති මුළු ප්‍රතිපාදනය | | | 2,436.02 | |

**වගුව 3.1 - අනුමත කළ ව්‍යාපෘති හා වෙන්කළ ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු**

ඒ අනුව, අනුමත කරන ලද **17,514**ක් වූ සමස්ත ව්‍යාපෘති සංඛ්‍යාවෙන්, ව්‍යාපෘති **16,913**ක් සම්පූර්ණයෙන් නිමකර ඇති අතර ව්‍යාපෘති 119ක් අර්ධ වශයෙන් නිමකර ඇත. මෙහි භෞතික ප්‍රගතිය **97.24%**කි. දිස්ත්‍රික් ලේකම්වරු වෙත නිදහස් කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් ගෙවීමට නියමිත බිල්පත් ද ඇතුළුව රුපියල් මිලියන **2,331.63**ක වියදමක් 2018 වර්ෂය අවසානයේදී වාර්තාගත විය. මෙහි මූල්‍ය ප්‍රගතිය **95.64%**කි.

රත්නපුර දිස්ත්‍රික්කය - බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පූජාපිටිය ගමේ ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම




කළුතර දිස්ත්‍රික්කය පානදුර ප්‍රදේශීය කොට්ඨාශයේ වීරවර්ධන පාර සංවර්ධනය කිරීම



ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජෙබාල් නගර්හි බස් නැවතුම්පොළ ඉදි කිරීම



කුරුණෑගල දිස්ත්‍රික්කය -අලව්ව ප්‍රාදේශීය ලේකම් සාරානන්ද වෙත ප්ලාස්ටික් පුටු ලබාදීම



## 3.2 ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2018

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන (RIDP) දිස්ත්‍රික් මට්ටමින් ආරම්භ කිරීම 2016 වර්ෂයේදී සිදු වූ අතර, එය අඛණ්ඩව 2017 සහ 2018 වර්ෂවලද ක්‍රියාත්මක විය. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ ග්‍රාමීය ප්‍රදේශවල සමාජ-ආර්ථික ජීවන තත්ත්වය නංවාලීම වේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර පවතින විෂමතා අඩුකරලීම මගින් ඍජු හා වක්‍ර ප්‍රතිලාභ උදාකර ගැනීමත්, ජීවන තත්වය ඉහළ නංවාලීමත් අපේක්ෂා කෙරේ.

ග්‍රාමීය පාලම් හා බෝක්කු ඉදිකිරීම/සංවර්ධනය, මාර්ග ඉදි කිරීම/සංවර්ධනය, කුඩා වාරිමාර්ග ඇළවල් සංවර්ධනය කිරීම, ජල සැපයුම් ව්‍යාපෘති, ස්වාභාවික ආපදා හේතුවෙන් විනාශ වූ ව්‍යාපෘති යළි යථා තත්ත්වයට පත් කිරීම, නිෂ්පාදන සඳහා ඉහළ මිලක් හා ඉහළ ඉල්ලුමක් ලබාගත හැකි වෙළඳපොළවල් (කඩමණ්ඩි), සති පොළවල්/ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම, ගොඩනැගිලි ඉදිකිරීම, කෘෂිකාර්මික සංවර්ධනය ආදී අංශ යටතේ ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කර ඇත.

2018 වර්ෂයේදී මෙම ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන, උප වැඩසටහන් දෙකක් යටතේ ක්‍රියාත්මක කරන ලදී. එනම් යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන - II අදියර වශයෙනි. 2018 වර්ෂයේදී ඒ යටතේ අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව හා වෙන්කරන ලද ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු පහත දැක්වේ. මෙම 2018 වර්ෂයේ වැඩසටහනට අමතරව, 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ගෙවීමට නියමිතව තිබූ බිල්පත් පියවීම සඳහා රුපියල් මිලියන 4,591.19 ක ප්‍රතිපාදනද අදාළ දිස්ත්‍රික් වෙත නිදහස් කර ඇත.

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | % | ප්‍රතිපාදනය රුපියල් | % |
|---|---|---|---|---|
| මාර්ග සංවර්ධන | 5192 | 71% | 7,293,527,961.51 | 74% |
| පානීය ජල සැපයුම් | 442 | 6% | 509,465,320.05 | 5% |
| ග්‍රාමීය විදුලිබල පහසුකම් | 5 | 0.1% | 2,200,000.00 | 0.02% |
| වාරිමාර්ග සහ කෘෂිකර්මය | 214 | 3% | 335,359,575.55 | 3% |
| ආර්ථික යටිතල පහසුකම් | 20 | 0.3% | 44,400,000.00 | 0.4% |
| අධ්‍යාපනය | 221 | 3% | 219,406,131.77 | 2% |
| සෞඛ්‍යය | 88 | 1% | 114,000,000.00 | 1% |
| සනීපාරක්ෂක කටයුතු | 77 | 1% | 91,961,272.79 | 1% |
| ක්‍රීඩා | 277 | 4% | 195,500,000.00 | 2% |
| අනෙකුත් | 786 | 11% | 1,086,007,421.25 | 11% |
| 2018 සමස්ත ව්‍යාපෘති සංඛ්‍යාව | 7322 | 100% | 9,891,827,682.92 | 100% |
| 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා ගෙවීමට තිබූ බිල්පත් පියවීම සඳහා වෙන්කළ මුදල් | | | 4,591,186,195.46 | |
| දිස්ත්‍රික්ක සඳහා ලබාදී ඇති මුළු ප්‍රතිපාදනය | | | 14,483,013,878.38 | |

වගුව 3.2 - ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ 2018 වර්ෂය තුළ අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව හා වෙන්කළ ප්‍රතිපාදන

එසේ වුවද, 2018.11.23 දිනැති අංක 18/2783/905/019 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ මඟ පෙන්වීම යටතේ මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක MF/EA/PLN/SP2018/පොදු දරන 2018.11.28 දිනැති ලිපියෙන් ගිවිසුම් අත්සන් කර තිබුනද අදාළ කටයුතු ආරම්භ කර නොමැති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන්ට උපදෙස් දී ඇත. දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ වාර්තා අනුව **රුපියල් මිලියන 3,015.90**ක වටිනාකමකින් යුතු **2,884කට ආසන්න ව්‍යාපෘති** සංඛ්‍යාවක් අත්හිටුවන ලදී.

මේ අනුව, ක්‍රියාත්මක කරන ලද සමස්ත ව්‍යාපෘති සංඛ්‍යාවෙන් ව්‍යාපෘති **3,741**ක් සම්පූර්ණ වශයෙන් නිමකර ඇති අතර ව්‍යාපෘති 181ක් අර්ධ වශයෙන් නිමකර ඇත. මෙහි භෞතික ප්‍රගතිය **51.10%**කි. ගෙවීමට නියමිත බිල්පත් ද ඇතුළුව රුපියල් මිලියන **9,208.45**ක වියදමක් 2018 වර්ෂය අවසානයේදී වාර්තාගත විය. මෙහි මූල්‍ය ප්‍රගතිය **63.49%**කි.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රද්ධාපුර- කන්නියා මාර්ගය වැඩි දියුණු කිරීම



කොළඹ දිස්ත්‍රික්කය - මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරිගණක පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම




කොළඹ දිස්ත්‍රික්කය - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජයවර්ධනපුර කෝට්ටේ පිරිමි පාසැලේ සුහුරු පන්ති කාමරයක් (Smart Class Room) සංවර්ධනය කිරීම




නුවරඑළිය දිස්ත්‍රික්කය - හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඔකන්දල දේවාලය මාර්ගය සංවර්ධනය කිරීම



## 3.3 ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2018

2018 වර්ෂය තුළද ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර එම වැඩසටහන දියත් කිරීම සඳහා රුපියල් මිලියන 250ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. සමාජය තුළ සිදුවෙමින් පවතින සදාචාරාත්මක පරිහානිය වළක්වා ගැනීම සහ ආගමික ශික්ෂණයක් සහිත ශිෂ්ටසම්පන්න සමාජයක් බිහිකරලීම සඳහා ආගමික ප්‍රවේශයක් ලබාදීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ.

හඳුනාගත් ආගමික මධ්‍යස්ථානවල මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සමහරක් වනුයේ දහම් පාසැල් ගොඩනැගිලි, මොන්ටිසෝරි, වාහන නැවතුම් ස්ථාන, බහුකාර්ය ගොඩනැගිලි, ආගමික ස්ථානවල නේවාසිකාගාර හා පිරිවෙන්, පුස්තකාල ගොඩනැගිලි ආදිය අළුත්වැඩියා කිරීම හා ඉදිකිරීම, ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම, විදුලි, ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම, සදාචාර සංවර්ධන වැඩසටහන් සඳහා උපකරණ සැපයීම වේ.

ඒ අනුව ව්‍යාපෘති **380**ක් අනුමත කර අදාළ දිස්ත්‍රික් ලේකම්වරු වෙත රුපියල් මිලියන **190.89**ක ප්‍රතිපාදන නිදහස් කර අදාළ ව්‍යපාති ක්‍රියාත්මක කරන ලදී. පහත දැක්වෙනුයේ 2018 වර්ෂය තුළ අනුමත කරන ලද ව්‍යාපෘති හා නිදහස් තරන ලද ප්‍රතිපාදනවල සාරාංශයකි. මෙම 2018 වර්ෂයේ වැඩසටහනට අමතරව, 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ගෙවීමට නියමිතව තිබූ බිල්පත් පියවීම සඳහා රුපියල් මිලියන 58.86 ක ප්‍රතිපාදනද අදාළ දිස්ත්‍රික්ක වෙත නිදහස් කර ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති සඳහා නිදහස් කළ ප්‍රතිපාදන (රු.) | 2017 වර්ෂයේ බිල්පත් පියවීම සඳහා නිදහස් කළ ප්‍රතිපාදන (රු.) | නිදහස් කළ මුළු ප්‍රතිපාදනය (රු.) |
|---|---|---|---|---|---|---|
| 1 | අම්පාර | 50 | 50 | 15,000,000.00 | | 15,000,000.00 |
| 2 | අනුරාධපුරය | 13 | 13 | 6,478,200.00 | | 6,478,200.00 |
| 3 | බදුල්ල | 28 | 26 | 14,000,000.00 | 1,173,477.77 | 15,173,477.77 |
| 4 | කොළඹ | 40 | 38 | 20,000,000.00 | 5,054,117.20 | 25,054,117.20 |
| 5 | ගාල්ල | 19 | 19 | 9,300,000.00 | 5,627,754.72 | 14,927,754.72 |
| 6 | ගම්පහ | 21 | 19 | 10,500,000.00 | 2,178,055.96 | 12,678,055.96 |
| 7 | හම්බන්තොට | 1 | 0 | 500,000.00 | 291,227.21 | 791,227.21 |
| 8 | යාපනය | 1 | 1 | 500,000.00 | | 500,000.00 |
| 9 | කළුතර | 10 | 8 | 5,000,000.00 | 4,317,118.10 | 9,317,118.10 |
| 10 | මහනුවර | 46 | 46 | 32,279,820.22 | | 32,279,820.22 |
| 11 | කෑගල්ල | 40 | 37 | 19,800,000.00 | 461,365.40 | 20,261,365.40 |
| 12 | කුරුණෑගල | 16 | 12 | 8,225,955.11 | 21,307,838.95 | 29,533,794.06 |
| 13 | මාතලේ | 40 | 40 | 20,000,000.00 | | 20,000,000.00 |
| 14 | මාතර | 8 | 5 | 3,883,366.00 | 9,430,991.37 | 13,314,357.37 |
| 15 | මොනරාගල | 3 | 3 | 1,500,000.00 | | 1,500,000.00 |
| 16 | නුවරඑළිය | 10 | 10 | 5,000,000.00 | | 5,000,000.00 |
| 17 | පොළොන්නරුව | 5 | 5 | 2,500,000.00 | 1,141,268.90 | 3,641,268.90 |
| 18 | පුත්තලම | 14 | 14 | 8,924,750.00 | 1,346,325.57 | 10,271,075.57 |
| 19 | රත්නපුර | 13 | 12 | 6,500,000.00 | 5,849,616.10 | 12,349,616.10 |
| 20 | ත්‍රිකුණාමලය | 2 | 2 | 1,000,000.00 | 676,838.42 | 1,676,838.42 |
| | එකතුව | 380 | 360 | 190,892,091.33 | 58,855,995.67 | 249,748,087.00 |

වගු අංක **3.3**: ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන

දිස්ත්‍රික් ලේකම්වරු විසින් වාර්තා කළ ප්‍රගතියට අනුව, ව්‍යාපෘති **380**ක් අතුරින් ව්‍යාපෘති **360**ක කටයුතු සම්පූර්ණයෙන් නිමාකර ඇත. මෙහි භෞතික ප්‍රගතිය **94.73%**කි. 2018 වර්ෂයට අදාළව ගෙවීමට ඉතිරිව ඇති බිල්පත් ද සමඟින් වර්ෂය අවසාන වන විට **රුපියල් මිලියන 235.93**ක වියදමක් වාර්තා විය. මෙහි මූල්‍ය ප්‍රගතිය **94.47%**කි.

අනුරාධපුර දිස්ත්‍රික්කය - තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙහෙරගල විහාරයේ දාගැබ ඉදි කිරීම



මාතර දිස්ත්‍රික්කය - මාලිම්බොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රී ඉන්ද්‍රාරාම දහම් පාසැල් ගොඩනැඟිල්ල ඉදි කිරීම



කොළඹ දිස්ත්‍රික්කය - කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සීලසුමනාරාමය සංවර්ධනය කිරීමේ කටයුතු



බදුල්ල දිස්ත්‍රික්කය - සොරනාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශෛලබිම්බාරාමය සංවර්ධනය කිරීමේ කටයුතු



## 3.4 ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

2018.07.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, රටෙහි යටිතල පහසුකම්වල ගුණාත්මක තත්ත්වය දියුණු කිරිම සිදු කරන අතර, ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා උපකාර කිරීමට සහ ආර්ථික සංවර්ධනය කඩිනම් කිරිම සඳහා වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක් දියත් කිරීම සඳහා රජය විසින් තීරණය කර ඇත. ඒ අනුව, කඩිනම් පදනමින් සමස්ත දිවයින පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ගම්පෙරළිය නමින් හැඳින්වෙන වැඩසටහනක් සැලසුම් කර ඇත.

2018 වර්ෂයේ තුන්වන කාර්තුවේ ආරම්භ කරන ලද ගම්පෙරළිය වැඩසටහන වර්ෂ 02ක කාල සීමාව සඳහා දීර්ඝ කිරීමට රජය අපේක්ෂා කරයි. මෙම වැඩසටහන යටතේ වූ ව්‍යාපෘතීන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 20,003.5 ක ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයට ලැබී තිබුණි. රු. මිලියන 19882.955ක වටිනාකමින් යුත් ව්‍යාපෘතීන් 51,509 ක් අනුමත කොට, අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමුකරන ලදී.
ඒ අනුව, අනුමත කරන ලද 51,509 ක් වූ මුළු ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 7237 ක් සම්පූර්ණයෙන් නිමකරන ලද අතර ව්‍යාපෘති 171 ක් අර්ධ වශයෙන් නිමකරන ලදී. අතැති බිල් වල වටිනාකම ද ඇතුලත්ව 2018 වර්ෂයේ මුළු වියදම රු. මි. 5,068.17 වේ.

දිස්ත්‍රික්ක මට්ටමින් අනුමත ව්‍යාපෘතීන් සාරාංශය පහත වගුවේ දක්වා ඇත.

| අ.අ. | දිස්ත්‍රික්කය | අනුමත ප්‍රතිපාදනය (රු.මි) | ව්‍යාපෘති ගණන |
|---|---|---|---|
| 1 | අම්පාර | 665.19 | 1226 |
| 2 | අනුරාධපුර | 873.138 | 3710 |
| 3 | බදුල්ල | 1713.16 | 3010 |
| 4 | මඩකලපුව | 596.4 | 704 |
| 5 | කොළඹ | 1630.37 | 3622 |
| 6 | ගාල්ල | 1276.246 | 2560 |
| 7 | ගම්පහ | 1944.095 | 7100 |
| 8 | හම්බන්තොට | 524.02 | 818 |
| 9 | යාපනය | 394.82 | 408 |
| 10 | කළුතර | 1219.336 | 2464 |
| 11 | මහනුවර | 1365.851 | 3792 |
| 12 | කෑගල්ල | 1689 | 4192 |
| 13 | කිලිනොච්චි | 100 | 73 |
| 14 | කුරුණෑගල | 1493.67 | 2187 |
| 15 | මන්නාරම | 148.81 | 308 |
| 16 | මාතලේ | 398.39 | 721 |
| 17 | මාතර | 698.98 | 2525 |
| 18 | මොණරාගල | 360.5 | 411 |
| 19 | මුලතිව් | 138.4 | 127 |
| 20 | නුවරඑළිය | 302.85 | 2451 |
| 21 | පොළොන්නරුව | 299.67 | 3954 |
| 22 | පුත්තලම | 565.409 | 1292 |
| 23 | රත්නපුර | 884.91 | 3083 |
| 24 | ත්‍රිකුණාමලය | 497.75 | 468 |
| 25 | වවුනියාව | 101.99 | 303 |
| | එකතුව | **19882.955** | **51509** |

වගු අංක 3.4: දිස්ත්‍රික්ක මට්ටමින් අනුමත ව්‍යාපෘතීන් සාරාංශය

### 3.4.1 අනුමත කරන ලද ව්‍යාපෘතීන් ක්ෂේත්‍ර අනුව වර්ගීකරණය පහත පරිදි වේ.

| ක්ෂේත්‍රය | ව්‍යාපෘති ගණන | අනුමත ප්‍රතිපාදනය (රු.මි) |
|---|---|---|
| ග්‍රාමීය වැව් සහ අමුණු ප්‍රතිංසස්කරණය | 1232 | 1,024.60 |
| ග්‍රාමීය මංමාවත් | 16298 | 12,616.70 |
| පාසැල්වල සනීපාරක්ෂක පහසුකම් (අළුත්වැඩියා කිරීම්/ නව ඉදිකිරීම්) | 1572 | 829.11 |
| පාසැල් ක්‍රීඩා පිට්ටනි | 1196 | 873.8 |
| "සති පොළවල්" සංවර්ධනය කිරීම | 208 | 79.84 |
| අවශ්‍යතාවය සහිත නිවෙස් සඳහා විදුලිබලය සැපයීම | 5224 | 160.6 |
| පන්සල්/ කෝවිල්/දේවස්ථාන/පල්ලි ප්‍රතිසංස්කරණය | 4165 | 2,203.95 |
| සංචාරක ආකර්ෂණයක් පවතින පුරාවිද්‍යා ස්ථාන ප්‍රතිසංස්කරණය | 158 | 59.1 |
| නිවාස සංවර්ධනය - නිවාස සෙවිලි කිරීම් ස්ථිර වහලවල්වලට පරිවර්තනය කිරීම | 21398 | 1,957.02 |
| ඉඩම් ඔප්පු නිකුත් කිරීම | 1 | 1 |
| "හරිත උද්‍යාන" වැඩසටහන | 57 | 77.23 |
| එකතුව | 51,509 | 19,882.96 |

වගු අංක 3.5: අනුමත කරන ලද ව්‍යාපෘතීන් ක්ෂේත්‍ර අනුව වර්ගීකරණය




වගු අංක 3.1: අනුමත කරන ලද ව්‍යාපෘතීන් ක්ෂේත්‍ර අනුව වර්ගීකරණය

## 3.5 සැලසුම් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම්

### 3.5.1 අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ

2018.01.01 සිට 2018.12.31 දක්වා මෙම අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

| අනු අංකය | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | විෂය |
|---|---|---|
| 1 | MNPEA/2018/002 | ඔස්ට්‍රියානු සහන ණය යෝජනා ක්‍රමය යටතේ කොළඹ මහනගර සභාව සඳහා ගිනි නිවීමේ වාහන / උපකරණ ලබා දීම |
| 2 | MNPEA/2018/003 | සංගණන ඒකක ලැයිස්තුගත කිරීම |
| 3 | MNPEA/2018/004 | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය - කොන්ත්‍රාත් මුදලේ 15%ක් මූල්‍යයනය කිරීම සඳහා වූ ණය පහසුකම |
| 4 | MNPEA/2018/005 | ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන ප්‍රතිරක්ෂණාවරණ වැඩසටහන් යටතේ 30%ක් වූ අනිවාර්ය ප්‍රතිරක්ෂණාවරණ පවරා දීම වෙනුවෙන් 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා (එම දින 02කම ඇතුළත් වන සේ) වසරක කාලයක් සඳහා ප්‍රතිරක්ෂණ ආවරණ ප්‍රසම්පාදනය කිරීම |
| 5 | MNPEA/2018/006 | රාජ්‍ය ණය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වගකීම් කළමනාකරණය |
| 6 | MNPEA/2018/007 | යොවුන්පුරය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කූඩාරම් 500ක් ප්‍රසම්පාදනය කිරීම |
| 7 | MNPEA/2018/009 | නිපුණතා ආංශීය වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය මූල්‍යයනය කිරීම පිණිස ආසියානු සංවර්ධන බැංකුවෙන් අතිරේක ණය ආධාර |
| 8 | MNPEA/2018/010 | පෞද්ගලික අංශය මඟින් සහල් ආනයනය |
| 9 | MNPEA/2018/011 | ද සොයිසා මාතෘ රෝහලෙහි ළදරු සහ ප්‍රසව විමර්ශන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර ලබා ගැනීම |
| 10 | MNPEA/2018/012 | ව්‍යවස්ථාපිත ආයතනයන්හි වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම - ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය - 2015 වාර්ෂික වාර්තාව |
| 11 | MNPEA/2018/013 | දේශීය බැංකු මඟින් අරමුදල් සලසන ප්‍රමුඛ ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය |
| 12 | MNPEA/2018/014 | ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය යළි ස්ථානගත කිරීම සඳහා ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීම |
| 13 | MNPEA/2018/015 | කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත උද්ධෘතයෙන් යුතුව සකස් කර ඇති පනත් කෙටුම්පත |
| 14 | MNPEA/2018/016 | දේශීය බැංකු වෙතින් ලබාගත් අරමුදල් මඟින් හසලක ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| 15 | MNPEA/2018/017 | දේශීය බැංකු වෙතින් ලබාගත් අරමුදල් මඟින් විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ බෙදාහැරීම් පද්ධතිය සඳහා අනෙකුත් උපාංග හා සවිකිරීමේ උපාංග, Specials, DI කපාට, HDPE/DI නළ සැපයීම හා එළීම |
| 16 | MNPEA/2018/018 | මධ්‍යම අධිවේගී මාර්ගයේ 3වන කොටස (CEP III) ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම - පොතුහැර සිට රඹුක්කන හරහා ගලගෙදර දක්වා |
| 17 | MNPEA/2018/019 | ෂැන්ග්‍රී-ලා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම් සැපයීම |
| 18 | MNPEA/2018/020 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ උපදේශක තනතුරට පත් කිරීම - ජෝෂප් මයිකල් පෙරේරා මහතා |

| | | |
|---|---|---|
| 19 | MNPEA/2018/021 | උතුරු පළාතේ ස්වේච්ඡා පදනමින් සේවයේ නිරත වී සිටින ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ, II ශ්‍රේණියට බඳවා ගැනීම |
| 20 | MNPEA/2018/022 | ආර්ථික ප්‍රතිඵල අත් කර දීමේ වැඩසටහනේ අංගයක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන සංචාරක කර්මාන්තය සාර්ථකව ක්‍රියාත්මක කිරීස සඳහා බාහිර උපදේශක සහාය ලබා ගැනීම |
| 21 | MNPEA/2018/023 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය වෙතින් ඇමරිකානු ඩොලර් මිලියන 100ක ණය මුදලක් ලබා ගැනීම |
| 22 | MNPEA/2018/024 | ශ්‍රී ලංකා කඩිනම් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකුවේ ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව මඟින් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 115ක ණය මුදලක් ලබා ගැනීම |
| 23 | MNPEA/2018/025 | ග්‍රාමීය පාලම් ඉදි කිරීම |
| 24 | MNPEA/2018/026 | ඔරුගොඩවත්ත අඹතලේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව ජලනළ පද්ධතිය වැඩිදියුණු කිරීම |
| 25 | MNPEA/2018/027 | ව්‍යවස්ථාපිත ආයතනයන්හි වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම - මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - වාර්ෂික වාර්තාව 2016 |
| 26 | MNPEA/2018/029 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ උපදේශක අතුල ඒ. සෙනෙවිරත්න මහතාගේ සේවා කාලය දීර්ඝ කිරීම |
| 27 | MNPEA/2018/030 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මඟින් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 115.0ක ණය පහසුකමක් ලබා ගැනීම |
| 28 | MNPEA/2018/031 | ශ්‍රී ලංකාවේ හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාව 1990 සුවසැරිය පදනම අදියර II ක්‍රියාත්මක කිරීම |
| 29 | MNPEA/2018/032 | ඇමරිකා එක්සත් ජනපදය සමඟ එළඹි සංවර්ධන සහයෝගිතා ගිවිසුම් සහ බදු ප්‍රතිපූර්ණය කිරීම |
| 30 | MNPEA/2018/033 | පළාත් පාලන ආයතන වෙත කසළ එකතු කිරීමේ යන්ත්‍ර සැපයීම |
| 31 | MNPEA/2018/034 | සුරක්ෂිතලත් ගනුදෙනු උද්ධෘතය යටතේ සකස් කරන ලද පනත් කෙටුම්පත |
| 32 | MNPEA/2018/035 | මධ්‍යම අධිවේගී මාර්ගයේ 3වන කොටස (CEP III) ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම - පොතුහැර සිට රඹුක්කන හරහා ගලගෙදර දක්වා |
| 33 | MNPEA/2018/036 | 2018 වර්ෂය සඳහා විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමක් ලබා ගැනීම |
| 34 | MNPEA/2018/037 | මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ - 2 වන අදියර (OCH - 2) සඳහා ලබා ගත් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) ණය මුදලෙහි භාවිත නොකරන ලද ශේෂය, මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ 1 වන අදියරේ (OCH - 1) මාකුඹුර බහුකාර්ය මධ්‍යස්ථානයේ යෝජිත ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීම |
| 35 | MNPEA/2018/038 | ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත්වල කි.මී.64.31ක් දිගැති මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සහ පාලම් 13ක් නැවත ඉදි කිරීම |
| 36 | MNPEA/2018/039 | ගුණාත්මක වර්ධනය සඳහා වැඩි වශයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කිරීමට හැකි වන පරිදි රාජ්‍ය අංශයේ ගොඩනැඟිලි ඉදි කිරීම සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමය යටතේ පෞද්ගලික ආයෝජන ලබා ගැනීම |
| 37 | MNPEA/2018/040 | සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| 38 | MNPEA/2018/041 | රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතනයවල උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පොලී රහිත ණය යෝජනා ක්‍රමය |
| 39 | MNPEA/2018/042 | මහා පරිමාණ ප්‍රසම්පාදන සහ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා වන යෝජනා |

| | | |
|---|---|---|
| **40** | MNPEA/2018/043 | ශ්‍රී ලංකාවේ තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම |
| **41** | MNPEA/2018/044 | සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල (SFD) වෙතින් කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍යයනය |
| **42** | MNPEA/2018/045 | රජයේ සුරැකුම්පත් වෙළඳාම, පියවීම සහ මධ්‍යම තැන්පතු ක්‍රමය හා සම්බන්ධ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීම |
| **43** | MNPEA/2018/046 | බලපෑමට ලක්වන ඉලක්කගත ප්‍රදේශවල 2018-2022 කාල පරාසය තුළ එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහනෙහි ශ්‍රී ලංකාවට අදාළ උපාය මාර්ගික සැලැස්ම රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කිරීම |
| **44** | MNPEA/2018/047 | රජයේ ආයතන සතු විදුලි උත්පාදක යන්ත්‍රවල අමතර දාරිතාවය ඵලදායි ලෙස පරිහරණය |
| **45** | MNPEA/2018/048 | රාජ්‍ය ණය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා බැරකම් කළමනාකරණය |
| **46** | MNPEA/2018/049 | මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව සඳහා වන ජපාන ආධාර වැඩසටහන - 2018 |
| **49** | MNPEA/2018/050 | උඩරට දුම්රිය මාර්ගයේ මෙහෙයුම් කටයුතු සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඩීසල් බලවේග කට්ටල 09ක් ප්‍රසම්පාදනය, මිලදී ගැනීම හා බෙදා හැරීමේ ව්‍යාපෘතිය |
| **50** | MNPEA/2018/051 | යෝජිත ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමේ වැඩසටහනෙහි ආයෝජන සම්බන්ධ අභ්‍යන්තර සහ බාහිර ගෙවීම් සිදු කිරීම |
| **51** | MNPEA/2018/052 | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ II කොටසේ අත්තිකාරම් මුදල්වලින් කොටසක් ගෙවීම සඳහා මහජන බැංකුවෙන් ලබාගත් මූල්‍ය පහසුකම ප්‍රතිව්‍යුහගත කිරීම |
| **52** | MNPEA/2018/053 | ඔස්ට්‍රියානු සහන ණය යෝජනා ක්‍රමය යටතේ කැලණිය පැරණි දුම්රිය පාලම ඉදි කිරීම |
| **53** | MNPEA/2018/054 | රජරට හා නැගෙනහිර විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවලට සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයට අවශ්‍ය වෛද්‍ය උපකරණ සැපයීම සඳහා මූල්‍යාධාර |
| **54** | MNPEA/2018/055 | යෝජිත කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - කාර්ය මණ්ඩල අවශ්‍යතා |
| **55** | MNPEA/2018/056 | ඔස්ට්‍රියානු සහන ණය යෝජනා ක්‍රමය යටතේ රජයේ රෝහල් සඳහා ගිලන් රථ 100ක් ලබා ගැනීම |
| **56** | MNPEA/2018/057 | ළමුන් සඳහා දිවා සුරැකුම් පහසුකම් පුළුල් කිරිම සහ වැඩිදියුණු කිරීම |
| **57** | MNPEA/2018/058 | දීමනා ලබා දෙමින් රාජ්‍ය සේවකයන් දිරි ගැන්වීම |
| **58** | MNPEA/2018/059 | ව්‍යවස්ථාපිත ආයතනයන්හි වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම - ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - වාර්ෂික වාර්තාව - 2016 |
| **59** | MNPEA/2018/060 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ උපදේශක ඩබ්.ගාමිණී ගුණරත්න මහතාගේ සේවා කාලය දීර්ඝ කිරීම |
| **60** | MNPEA/2018/061 | ශ්‍රී ලංකාවේ මහ බැංකුකරණයට අදාළ වන නීති සඳහා යෝජිත සංශෝධන |
| **61** | MNPEA/2018/062 | ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත්වල කි.මී.64.31ක් දිගැති මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සහ පාලම් 13ක් නැවත ඉදි කිරීම |
| **62** | MNPEA/2018/063 | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමේ වැඩසටහන - 2018 |
| **63** | MNPEA/2018/064 | ජාත්‍යන්තර පාසල් ලියාපදිංචි කිරීම |
| **64** | MNPEA/2018/065 | ශ්‍රී ලංකා සැලසුම් සේවයේ අතිරේක ලේකම් තනතුරුවලට පත් කිරීම |
| **65** | MNPEA/2018/067 | 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත නීතිගත කිරීම |
| **66** | MNPEA/2018/068 | අන්තර්ජාතික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් මූල්‍යයනය කිරීමට යෝජිත තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන |

| | | |
|---|---|---|
| 67 | MNPEA/2018/069 | බලපෑමට ලක්වන ඉලක්කගත ප්‍රදේශවල 2018-2022 කාල පරාසය තුළ එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහනෙහි ශ්‍රී ලංකාවට අදාළ උපාය මාර්ගික සැලැස්ම රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කිරීම |
| 68 | MNPEA/2018/070 | ප්‍රාථමික සෞඛ්‍යාරක්ෂණ පද්ධතිය සවිමත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකුවේ ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව මගින් ඇමරිකානු ඩොලර් මිලියන 200.0ක ණය මුදලක් ලබා ගැනීම |
| 69 | MNPEA/2018/071 | ළමුන් සඳහා දිවා සුරකුම් පහසුකම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම |
| 70 | MNPEA/2018/072 | උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් පීඩනයට පත් පවුල් සඳහා ගඩොලින් හා සිමෙන්ති බදාමයෙන් බැඳි සාම්ප්‍රදායික ස්ථිර නිවාස ලබා දීමේ වැඩසටහන |
| 71 | MNPEA/2018/073 | සම්බන්ධීකාරක (විශේෂ ව්‍යාපෘති) සිරිමසිරි හපුආරච්චි මහතාගේ සේවය දීර්ඝ කිරීම |
| 72 | MNPEA/2018/074 | ගුණාත්මක වර්ධනය සඳහා වැඩි වශයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කිරීමට හැකි වන පරිදි රාජ්‍ය අංශයේ ගොඩනැඟිලි ඉදි කිරීම සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමය යටතේ පෞද්ගලික ආයෝජන ලබා ගැනීම |
| 73 | MNPEA/2018/075 | මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා වූ හැකියාව ශක්තිමත් කිරීම ව්‍යාපෘතිය |
| 74 | MNPEA/2018/076 | එස්.ඒ.ඩී.ජයන්ත හේමසිරි මහතා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සම්බන්ධීකාරක (1990 සුවසැරිය ව්‍යාපෘතිය) වශයෙන් පත් කිරීම |
| 75 | MNPEA/2018/077 | සිනමන් එයාර් (පෞද්ගලික) සමාගම විසින් ගුවන් යානා නඩත්තු කාර්යයන් සඳහා ගුවන් යානා රඳවන ගොඩනැඟිල්ලක් ඉදි කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ පරිශ්‍රයේ පිහිටා ඇති සීමාසහිත ගුවන් තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමට අයත් ඉඩමක් බදු පදනම මත ලබා ගැනීම |
| 76 | MNPEA/2018/078 | දීමනා ලබා දෙමින් රාජ්‍ය සේවකයන් දිරි ගැන්වීම |
| 77 | MNPEA/2018/079 | මධ්‍යම ආදායම්ලාභී නිවාස ණය යෝජනා ක්‍රමය පිළිබඳ 2018 අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම |
| 78 | MNPEA/2018/080 | ජාතික විගණන පනත් කෙටුම්පත |
| 79 | MNPEA/2018/081 | 2018 වර්ෂය සඳහා විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමක් ලබා ගැනීම |
| 80 | MNPEA/2018/082 | අදියරගත පදනමින් රැකියා විරහිත උපාධිධාරීන් පුහුණු කිරීම |
| 81 | MNPEA/2018/083 | ප්‍රාථමික සෞඛ්‍යාරක්ෂණ පද්ධතිය සවිමත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකුවේ ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව මගින් ඇමරිකානු ඩොලර් මිලියන 200.0ක ණය මුදලක් ලබා ගැනීම |
| 82 | MNPEA/2018/084 | රජයේ ආයෝජන සකස් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම |
| 83 | MNPEA/2018/085 | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 1 කඩවත සිට මීරිගම දක්වා |
| 84 | MNPEA/2018/086 | සංචාරකයින්ගේ ප්‍රයෝජනය සඳහා නියමිත කාලසටහනකට අනුව ක්‍රියාත්මක වන අභ්‍යන්තර ගුවන් සේවා ප්‍රවර්ධනය කිරීම |
| 85 | MNPEA/2018/087 | කඳුරට දුම්රිය මාර්ගයේ ධාවනය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට දුම්රිය එන්ජින් හා මැදිරි ප්‍රසම්පාදනය කිරීම - දුම්රිය එන්ජින් 12ක් මිලදී ගැනීම |

| | | |
|---|---|---|
| **86** | MNPEA/2018/088 | බදුල්ල, හාලිඇළ සහ ඇල්ල ඒකාබද්ධ ජලසම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මූල්‍යනය සඳහා ශ්‍රී ලංකා රජය සහ ඇමරිකා එක්සත් ජනපද අපනයන - ආනයන බැංකුව අතර අත්සන් කරන ලද ණය ගිවිසුම සඳහා වන සංශෝධනය |
| **87** | MNPEA/2018/089 | ප්‍රංශ සහයෝගිතාව යටතේ ශ්‍රී ලංකාවේ කුඩා ප්‍රමාණයේ කිරි සැකසීමේ මධ්‍යස්ථාන 06ක් සංවර්ධනය කිරීම |
| **88** | MNPEA/2018/090 | හිල්ටන් හෝටලයෙහි සහ ග්‍රෑන්ඩ් හයට් කළම්බුහි කොටස් අයිතිය අලෙවි කිරීම |
| **89** | MNPEA/2018/091 | විදුලිබල උත්පාදනය පුළුල් කිරීමේ දීර්ඝ කාලීන සැලැස්ම සමාලෝචනය කිරීමේ කමිටු වාර්තාව |
| **90** | MNPEA/2018/092 | ව්‍යවස්ථාපිත ආයතනයන්හි වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම - සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - වාර්ෂික වාර්තාව - 2015 |
| **91** | MNPEA/2018/093 | මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකය (CPMU) 2017 මාර්තු 01 දා සිට 2018 මාර්තු 31 දක්වා සිදු කළ කාර්යයන් පිළිබඳ ප්‍රගති වාර්තාව |
| **92** | MNPEA/2018/094 | සංචාරක කාර්යසාධක බලකායේ විධායක අධ්‍යක්ෂ වශයෙන් සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයාගේ උපදේශක වශයෙන් පැඩි විතාන මහතාගේ සේවා කාලය දීර්ඝ කිරීම |
| **93** | MNPEA/2018/095 | අදියරගත පදනමින් රැකියා විරහිත උපාධිධාරීන් පුහුණු කිරීම |
| **94** | MNPEA/2018/096 | මධ්‍යම අධිවේගී මාර්ගයේ 3වන කොටස (CEP III) ඉදි කිරීම - පොතුහැර සිට ගලගෙදර දක්වා |
| **94** | MNPEA/2018/097 | යෝජිත නාගරික ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් තාක්ෂණික සහාය ණය |
| **95** | MNPEA/2018/098 | විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය සහාය |
| **96** | MNPEA/2018/099 | උතුරු පළාත් තිරසර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ණය සහාය |
| **97** | MNPEA/2018/100 | කුලුනු මතින් දිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ණය ආධාර |
| **98** | MNPEA/2018/102 | කාන්තා සුභසිද්ධිය පිළිබඳ සමීක්ෂණය - 2018/2019 |
| **99** | MNPEA/2018/103 | උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් පීඩනයට පත් පවුල් සඳහා ගඩොලින් හා සිමෙන්ති බදාමයෙන් බැඳි සාම්ප්‍රදායික ස්ථිර නිවාස ලබා දීමේ වැඩසටහන |
| **100** | MNPEA/2018/104 | කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ (CSE) මහජන කොටස් හිමිකාරිත්වය පිළිබඳ ලැයිස්තුගත වීමේ රීතියට අනුකූලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු ලංකා හොස්පිටල් කෝපරේෂන් පීඑල්සී සමාගමේ කොටස් හිමිකාරිත්වයෙන් කොටසක් අලෙවි කිරීම |
| **101** | MNPEA/2018/105 | රජයේ ඉඩම් සඳහා ඉඩම් දීමනා පත්‍ර නිකුත් කිරීමේ කඩිනම් වැඩසටහන |
| **102** | MNPEA/2018/106 | ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය - වාර්ෂික වාර්තාව 2016 |
| **103** | MNPEA/2018/107 | උෂ්ණත්ව පාලක ගබඩා පහසුකමක් දඹුල්ලේ ස්ථාපනය කිරීම |
| **104** | MNPEA/2018/108 | අදියරගත පදනමින් රැකියා විරහිත උපාධිධාරීන් පුහුණු කිරීම |
| **105** | MNPEA/2018/109 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම |
| **106** | MNPEA/2018/110 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ) ලෙස ධමිත කුමාරසිංහ මහතා පත්කිරීම |
| **107** | MNPEA/2018/111 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සඳහා ජීවිත රක්ෂණ කටයුතු හා සාමාන්‍ය රක්ෂණ කටයුතු සම්බන්ධ මෘදුකාංග හා දෘඩාංග විසඳුම් සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම |

| | | |
|---|---|---|
| **108** | MNPEA/2018/112 | කොළඹ ග්‍රෑන්ඩ් හයට් කොටස් අලෙවි කිරීමේ ක්‍රියාවලිය සිදු කරන තෙක් එහි ඉදි කිරීම් කටයුතු පාර්ශ්වික වශයෙන් මූල්‍යයනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 12ක ණයක් ලබා ගැනීම |
| **109** | MNPEA/2018/113 | රාජ්‍ය අමාත්‍ය කාර්යාංශයේ විශ්ලේෂණ කණ්ඩායමේ සීමාවාසික පුහුණුවන්නන්ගේ / විශ්ලේෂකයන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම සහ විශ්ලේෂණ ඒකකය සඳහා විශ්ලේෂක කණ්ඩායම් නායක තනතුරක් ඇති කිරී |
| **110** | MNPEA/2018/114 | ප්‍රදාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇති වන බදු සම්බන්ධ ගැටලු විසඳීම |
| **111** | MNPEA/2018/115 | සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය |
| **112** | MNPEA/2018/116 | ග්‍රාමීය පාලම් ඉදි කිරීම |
| **113** | MNPEA/2018/117 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ස්ථාවර සාකච්ඡා සම්මුති කමිටුව පිහිටුවීම |
| **114** | MNPEA/2018/118 | සුළු පරිමාන වී මෝල් හිමියන් සඳහා සහන ප්‍රදානය කිරීම |
| **115** | MNPEA/2018/120 | උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් පීඩනයට පත් පවුල් සඳහා ගඩොලින් හා සිමෙන්ති බදාමයෙන් බැඳි සාම්ප්‍රදායික ස්ථිර නිවාස ලබා දීමේ වැඩසටහන |
| **116** | MNPEA/2018/121 | ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීම (TCAMP) |
| **117** | MNPEA/2018/122 | මධ්‍යම අධිවේගී මාර්ගයේ 3වන අදියර වෙනුවෙන් අරමුදල් සම්පාදනය සඳහා Tokyo Mitsubishi UFJ, Ltd. බැංකුව වෙත ඉදිරිපත් කරන ලද වරපත්‍ර ලිපියෙහි වලංගු කාලය දීර්ඝ කිරීම |
| **118** | MNPEA/2018/123 | උසස් අධ්‍යාපනය සඳහා වූ විශිෂ්ටත්ව මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු කැරගල පිහිටි ඉඩම බදු පදනම මත ලබා දීම |
| **119** | MNPEA/2018/124 | ළමුන් සඳහා දිවා සුරැකුම් පහසුකම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම |
| **120** | MNPEA/2018/125 | සාමාන්‍ය වෙළඳපොළ මිල යාන්ත්‍රණයෙන් බැහැරව පිරිවැය මත පදනම් මිලකට ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ පහසුකම් ලබා දීමේ රජයේ වැඩසටහනට දායක වූ සුපිරි වෙළඳසැල්වලට දැරීමට සිදු වූ අලාභ ප්‍රතිපූර්ණය කිරීම සඳහා වන යෝජනාව |
| **121** | MNPEA/2018/127 | සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් මූල්‍ය ආධාර |
| **122** | MNPEA/2018/129 | 1990 සුවසැරිය පදනමේ සංවිධාන සැලැස්ම සහ වැටුප් ව්‍යුහය |
| **123** | MNPEA/2018/131 | උෂ්ණත්ව පාලක ගබඩා පහසුකමක් දඹුල්ලේ ස්ථාපනය කිරීම |
| **124** | MNPEA/2018/132 | රාජ්‍ය අමාත්‍ය කාර්යාංශයේ විශ්ලේෂ ඒකකයේ අධුනික පුහුණුලාභීන් /විශ්ලේෂකයින්ගේ සේවා කාලය දීර්ඝ කිරීම හා එම ඒකකයේ අධුනික පුහුණුලාභීන් /විශ්ලේෂක තනතුරක් ඇති කිරීම |
| **125** | MNPEA/2018/133 | ජන හා නිවාස සංගණනය 2021 |
| **126** | MNPEA/2018/134 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව සඳහා සහාය වීමට අවශ්‍ය ව්‍යුහයක් වැඩිදියුණු කිරීම හා යටිතල පහසුකම් සඳහා මූල්‍යයනය කිරීම සඳහා ලෝක බැංකුවේ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව වෙතින් ඇමරිකානු ඩොලර් මිලියන 25ක ණය මුදලක් ලබා ගැනීම |
| **127** | MNPEA/2018/135 | උශ්නත්වපාලක ගබඩා මධ්‍යස්ථාන/ශීතාගාර පහසුකම් ජාලයක් ස්ථාපනය කිරීම හා ප්‍රවහණ පහසුකම් සැපයිම සඳහා පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීම |
| **128** | MNPEA/2018/136 | හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රංශ සංවර්ධන ආයතනයෙන් මූල්‍යාධාර ලබා ගැනීම |
| **129** | MNPEA/2018/137 | රේඛිය අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු දිප ව්‍යාප්ත සේවයේ නිළධාරින්ගේ වාර්ශික ස්ථාන මාරු අහෝසි කිරීම |

| | | |
|---|---|---|
| **130** | MNPEA/2018/139 | ශ්‍රී ලංකා වැඩිහිටි සත්කාරක සේවා පහසුකම් ශක්තිමත් කිරීම |
| **131** | MNPEA/2018/140 | මාතර දිස්ත්‍රික්කයේ මෑත දි හටගත් ගංවතුරින් දැඩි ලෙස හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම |
| **132** | MNPEA/2018/142 | අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීම : 2018<br>මැදි ආදයම් නිවාස ණය යෝජනා ක්‍රමය |
| **133** | MNPEA/2018/143 | මඩකලපු මහ නගර සභාවට අයත් මහජන පුස්ථකාල ගොඩනැල්ලේ ඉතිරි වී ඇති වැඩ සම්පූර්ණ කිරීම හා බිම් මහලේ වැඩ අවසන් කිරීම |
| **134** | MNPEA/2018/144 | සංවර්ධන ව්‍යපෘති/ වැඩසටහන් සඳහා විදේශිය මුල්‍යයනය/බහු පාර්ශ්වික/ද්වි පර්ශවික සංවර්ධන පාර්ශවකරුවන් සහ විදේශ රටවල් සමඟ එළඹීමට නියමිත ණය/ප්‍රධාන/ඇපකර/කාර්ය රාමු ගිවිසුම් |
| **135** | MNPEA/2018/145 | ඉදි කිරිම් කාර්මාන්තය තුල පවත්නා උග්‍ර ශ්‍රම හිඟය |
| **136** | MNPEA/2018/146 | කොළඹ ජාත්‍යන්තර මුල්‍ය නගර ව්‍යපෘතියේ සම්බන්ධිකාරක ට්‍රයන් ප්‍රනාන්දුපුල්ලේ මහතාගේ සේවා කාලය දීර්ඝ කිරීම |
| **137** | MNPEA/2018/147 | ව්‍යවස්ථාපිත ආයතනයන්හි වාර්ශික වාර්ථාව ඉදිරිපත් කිරීම සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව- වාර්ශික වාර්ථාව -2016 |
| **138** | MNPEA/2018/149 | උතුරු හා නැගෙනහිර පළාත් වල ගඩොලින් හ සිමෙන්ති බදාමයෙන් බැඳි සම්ප්‍රදායික ස්ථිර නිවාස ලබා දීමේ වැඩ සටහන |
| **139** | MNPEA/2018/150 | ග්‍රමීය පාලම් ඉදිකිරීම |
| **140** | MNPEA/2018/152 | ඇමරිකා එක්සත් ජනපදයේ මිලේනියම් චැලේන්ජ් කොපරේෂන් ආයතනය හා ශ්‍රී ලංකා රජය අතර වන ගිවිසුම |
| **141** | MNPEA/2018/153 | ජංගම දුරකථන වලින් ලබා ගන්නා ඇමතුම් වල දී ඇමතුම් සම්බන්ධතාවය හා දත්ත භුවමාරු කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම |
| **142** | MNPEA/2018/155 | සංචාරකයන්ගේ ප්‍රයෝජන සඳහා දැරිය හැකි මිල ගණන් යටතේ නියමිත කාල සටහනකට අනුව ක්‍රියාත්මක වන රට අභ්‍යන්තර ගුවන් සේවා |
| **143** | MNPEA/2018/156 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (Regional Development Bank - RDB) සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් මූල්‍යාධාර ලබා දීම |
| **144** | MNPEA/2018/158 | උතුරු හා නැගෙනහිර පළාත්වල සංහිදියාව ඉලක්ක කොට ගත් ඉඅ ප්‍රමුඛතාවයෙන් යුත්මාර්ග සංවර්ධන ව්‍යාපෘති |
| **145** | MNPEA/2018/159 | සාමාන්‍ය වෙළඳපොළ මිල යන්ත්‍රණයෙන් බැහැරව පිරිවැය මත පදනම් මිලකට ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ පහසුකම් ලබා දීමේ රජයේ වැඩසටහනට දායක වූ සුපිරි වෙළඳසැල්වලට දැරීමට සිදු වූ අලාභ ප්‍රතිපූර්ණය කිරීම සඳහා වන යෝජනාව |
| **146** | MNPEA/2018/161 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) සඳහා ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA) වෙතින් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 70ක ණය මුදලක් ලබා ගැනීම |
| **147** | MNPEA/2018/162 | දේශගුණික විපර්යාසයන්ට අනුගත වන කෘෂි - වාරි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA) වෙතින් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 125ක ණය මුදලක් ලබා ගැනීම |
| **148** | MNPEA/2018/163 | ඉරණවිල පිහිටි ඇමරිකන් ඇමරිකන් හඬ (VOA) ගුවන් විදුලි මධ්‍යස්ථානයෙන් පවරා ගන්නා ලද වත්කම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම |

| | | |
|---|---|---|
| **149** | MNPEA/2018/165 | ජර්මානු ෆෙඩරල් ජනරජයෙන් යුරෝ මිලියන 0.25ක තාක්ෂණික ප්‍රදාන ආධාරයක් ලබා ගැනීම |
| **150** | MNPEA/2018/166 | කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මඟින් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 200ක ණය පහසුකමක් ලබා ගැනීම |
| **151** | MNPEA/2018/168 | ජාත්‍යන්තර පාසල් ලියාපදිංචි කිරීම |
| **152** | MNPEA/2018/169 | ශ්‍රී ලංකාවේ තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම නෛතික අනුමැතිය ලබා ගැනීම |
| **153** | MNPEA/2018/171 | සාමාන්‍ය වෙළඳ පොළ මිල යාන්ත්‍රණයෙන් බැහැරව පිරිවැය මත පදනම් මිලකට ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ පහසුකම් ලබාදීමේ රජයේ වැඩසටහනට දායක වූ සුපිරි වෙළඳසැල් වලට දැරීමට සිදු වූ අලාභය ප්‍රතිපූරණය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන අතිරේක ප්‍රතිපාදන |

**වගු අංක 3.5:** අමාත්‍ය මණ්ඩල සංදේශ

### 3.5.2 සාර්ව ආර්ථික මට්ටමේ ප්‍රතිපත්තිමය කරුණු සඳහා දායකත්වය;

- 2018 අංක 18 දරන '1990 සුවසැරිය පදනම පනත' 2018 ජූලි මස 04 වන දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලදී.
- රාජ්‍ය ආයෝජන හැසිරවීමේ කාර්යසාධක බලකාය (PIDTF) ස්ථාපනය කරන ලද අතර අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීමද සිදුකරන ලදී.

### 3.5.3 සැලසුම්කරණය සම්බන්ධ කටයුතු;

- අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තා, වාර්ෂික ක්‍රියාකාරි සැලසුම් නිසි කාල සීමාවන් තුළදී සකස් කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන ආයතන සමඟ නියමිත කාල වලදී ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.
- මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකය වෙත පහසුකම් සැපයීම, උසස් අධ්‍යාපනය සඳහා වූ විශිෂ්ටත්ව මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සහ ජාත්‍යන්තර මූල්‍ය නගර ව්‍යාපෘතිය සඳහා නීතිමය රාමුවක් සකස් කිරීම.
- අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන දෙපාර්තමේන්තු හා ආයතන සමඟ සම්බන්ධීකරණය ඇතිව පාර්ලිමේන්තුවේ ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ යුතු කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

## 3.6 ‘1990 සුවසැරිය පදනම’: පූර්ව රෝහල් හදිසි ප්‍රතිකාර ගිලන්රථ සේවාව - II අදියර

එවකට පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ‘1990 සුවසැරිය’ පදනම හරහා 2018 ජූලි සිට දෙසැම්බර් මාසය දක්වා හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන්රථ සේවා ව්‍යාපෘතියේ II අදියර යටතේ ගිලන්රථ 209ක් හා අදාළ වෛද්‍ය උපකරණ ඉන්දියාවෙන් ආනයනය කරන ලදී. මූල්‍යමය ප්‍රදාන නොව භාණ්ඩ ප්‍රදාන (in-kind grant) සැපයෙන ව්‍යාපෘතියක් ලෙස ඉන්දිය රජය විසින් මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයන ලදී. ගිලන් රථ 209ක් හා අදාළ වෛද්‍ය උපකරණ ආනයනය සඳහා දරන ලද වියදම පහත දැක්වේ.

| 2018.12.31 දිනට දරා ඇති මුළු වියදම (රු. මිලියන) | |
|---|---|
| **මූල්‍යන ශීර්ෂය 13** | 802.626 |
| **මූල්‍යන ශීර්ෂය 17** | 217.06 |

වගු අංක 3.6: **මුළු වියදම**



## 3.7 මධ්‍යම වැඩසටහන් කළමණාකරන ඒකකය (CPMU)

මධ්‍යම වැඩසටහන් කළමණාකරන ඒකකය(CPMU) 2017 වසරේ මාර්තුමස ස්ථාපිත කරනු ලැබුවේ සංවර්ධන ප්‍රමුඛතාවයන් හඳුනාගෙන නියමිත කාලයක් තුළ ඒ සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමටය. ඒ අනුව ශ්‍රී ලංකාවේ වැදගත්ම ආර්ථිකමාර්ගවන මධ්‍යස්ථ ආදායම, පෞද්ගලික අංශයේ රැකියා, ආයෝජන, අපනයන හා බදු ආදායම් යන අංශයන් හඳුනාගෙන ඒවා සංවර්ධනය කිරීම කඩිනම් කිරීම සඳහා මධ්‍යම වැඩසටහන් කළමණාකරන ඒකකය(CPMU) සහයෝගය ලබා දෙනු ලැබේ. වර්තමානයේ පහත දැක්වෙන අංශ කෙරෙහි මධ්‍යම වැඩසටහන් කළමණාකරන ඒකකය(CPMU) අවධානය යොමුකර ඇත.

- සංචාරක ව්‍යාපාරය
- නිෂ්පාදන
- කෘෂිකර්මාන්තය( ධීවර කටයුතුද ඇතුළත්ව)
- ආයෝජන
- ඩිජිටල් ආර්ථිකය

2018 ජනවාරි මස 01 දින සිට 2018 සිට දෙසැම්බර් 31 දින දක්වා මධ්‍යම වැඩසටහන් කළමණාකරන ඒකකයේ (CPMU) වර්තමාන ක්‍රියාකාරකම් සඳහා ප්‍රගතිය පහත පරිදි වේ.

### 3.7.1 සංචාරක ක්ෂේත්‍රය

**(අ) සංචාරක අලෙවි ක්‍රියාකාරකම්**

- තමන්ට හිමි මාධ්‍ය භාවිතයට ගැනීම, අභ්‍යන්තර හැකියාවන් ගොඩනැගීම.

උපදේශකයකු විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අනුව ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සඳහා නව වෙබ් අඩවියක් නිර්මාණය කර ඇත.

- ඩිජිටල් අලෙවි ව්‍යාපාරය සැමවිටම වැඩිදියුණු කිරීම

ඩිජිටල් අලෙවිකරණ ක්‍රියාකාරකම් යටතේ එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය, ඉන්දියාව හා චීනය ආදී වෙළෙඳ පොළ පහකට නාලිකා සහ අන්තර්ගත උපාය මාර්ග, සමාජයීය සවන්දීම, මාධ්‍ය මිලදී ගැනීම සහ කුඩා වෙබ් අඩවි නිර්මාණය කිරීම සඳහා ගිවිසුම් ප්‍රධානයකර ඇත.

- ගෝලීය ප්‍රචාරක ව්‍යාපාරය

ගෝලීය අලෙවි ව්‍යාපාරය යටතේ 2018 නොවැම්බර් මාසයේදී ලන්ඩන් නුවර ලෝක සංචාරක වෙළදපොළ (WTM)හිදී ශ්‍රී ලංකාව සඳහා නව සන්නාමයක් දියත්කරන ලදී.

**(ආ) වික්‍රමාන්විත සංචාරක සේවය හා පුහුණුව**

**ජාතික නිපුණතාවයේ ප්‍රමිතිය සංවර්ධනය කිරීම**

ගුවන,ජලය හා භූමිය පදනම් කරගත් තෝරාගත් ක්‍රියාකාරකම් සඳහා ජාතික ප්‍රවීණතා මට්ටම් සකස් කිරීම අවසන් කර ඇත.

**SLITHM ආයතනය TVEC ආයතනය සමග විෂයමාලා සංවර්ධනය:**

2018 අගෝස්තු මස 29 වන දින අරලියගහ මන්දිරයේදී වික්‍රමාන්විත සංචාරක හා පුහුණු පාඨමාලා 5 ක් දියත් කරන ලදි.

**රෙගුලාසි**

වික්‍රමාන්විත සංචාරක සේවා සැපයුම්කරුවන් සඳහා රෙගුලාසි සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට උපදෙස් ලබාදීම සඳහා කමිටු 10 ක් පත් කිරීම.එම රෙගුලාසි කෙටුම්පත් කිරීම සිදුකරමින් පවතී.

**ප්‍රමිතිය**

SLS ISO 211101: 2014 සංචාරක ප්‍රකාශන සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති අවශ්‍යතාව ප්‍රකාශයට පත් කිරීම 2018 ඔක්තෝබර් මස 11 සිට 13 යන දිනවල පාසිකුඩාහිදී ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදි.

**වික්‍රමාන්විත සංචාරක හා පුහුණු වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම**

වික්‍රමාන්විත සංචාරක ව්‍යාපාරයේ වර්තමාන වර්ධනයන් පිළිබඳව සේවා සපයන්නන්, නියාමකයින් සහ මගපෙන්වන්නන් පුහුණු කිරීම සඳහා පුහුණු පාඨමාලාවක් 2018 ඔක්තෝබර් 25 දින කුකුලේගඟ ලයා ලෙෂර්ස් හි පවත්වන ලදී.

**(ඇ) ගොල්ෆ් සංචාරක ක්ෂේත්‍රය**

2018 දෙසැම්බර් මස අවසානයේ දී ගොල්ෆ් සංචාරක ව්‍යාපාරය සම්බන්ධ රැස්වීම් 4 ක් පවත්වන ලදී. මෙම රැස්වීම්වලදී ගත් තීරණ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකරනු ලැබේ.

**(ඇ). ආයුර්වේද සංචාරක ක්ෂේත්‍රය**

2018 දෙසැම්බර් මස අවසානය වන විට ආයුර්වේද සංචාරක ව්‍යාපාරය සම්බන්ධ රැස්වීම් 4 ක් පවත්වන ලදී. මෙම රැස්වීම්වලදී ගන්නා ලද තීරණ වලට අනුව පසුවිපරම් කටයුතු සිදුකරනු ලැබේ.

**(ඉ). නිල් ධජ සහතිකකරණ වැඩසටහන (Blue Flag)**

මොරගල්ල වෙරළ සඳහා නිල් ධජ සහතිකය ලබාගැනීමට 2018 අගෝස්තු මස 16 වන දින ප්‍රථම රැස්වීම පවත්වන ලදි. නිල් ධජය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව ගත් පළමු උත්සාහය මෙයවන අතර, දිවයින වටා වෙරළ තීරය සඳහා මෙම වැඩසටහන ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ.. පසු විපරම් කටයුතු CPMU විසින් සිදු කරනු ලබයි.

## 3.7.2 ආයෝජන ක්ෂේත්‍රය

**(අ). තුරුණුදිරිය, ණය යෝජනා ක්‍රමය**

කුඩා ව්‍යාපාරයන්හි නිරතව සිටින තරුණ ව්‍යවසායකයින්ට මූල්‍යාධාර ලබා දීම සඳහා ණය යෝජනා ක්‍රමයක් ලංකා බැංකුව එක්ව 2018 අප්‍රේල් මාසයේ දී ආරම්භ කරන ලදි. මෙහිදී ණය යෝජනා ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීම, ගැටළු නිරාකරණය කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග අඛණ්ඩව CPMU විසින් සිදුකරනු ලබයි. . 2018 දෙසැම්බර් 31 වැනි දින වන විට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලංකා බැංකුව විසින් රුපියල් 183,800,500ක් වටිනා ණය ප්‍රමාණයක් ණය ලාභීන් 429 ක් සඳහා ලබා දී ඇත.




ප්‍රස්තාර අංක 3.2: තුරුණු දිරිය - සතිපතා ප්‍රගතිය




ප්‍රස්තාර අංක 3.3: "තුරුණු දිරිය" - පළාත් මට්ටමින් ණය ලබාදීම

**(ආ). උතුරු සංවර්ධන සම්බන්ධීකරණ කමිටුව**

2016 දී අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය මගින් "උතුරු සංවර්ධන සම්බන්ධීකරණ කමිටුව" පිහිටුවන ලදි. වැඩසටහන් / ව්‍යාපෘති සම්බන්ධීකරණය හා නිරීක්ෂණය කිරීම, ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන සහතික කිරීම, උතුරු පළාතේ ග්‍රාමීය ආර්ථිකය නවීකරණය කිරීම මෙම කමිටුවේ කාර්යභාරය වේ . 2018 අප්‍රේල් මස ආරම්භයේ සිට සෑම මාසයකම කොළඹ හා උතුරු ප්‍රදේශවල පවත්වනු ලබන කමිටු රැස්වීම් සම්බන්ධීකරණය කිරීම සඳහා CPMU කටයුතු කරනු ලැබේ.

## 3.7.3 ඩිජිටල් ආර්ථික ක්ෂේත්‍රය

**(අ). නියමු ව්‍යාපෘතිය - ගැබිණි මවුවරුන් සඳහා ලබා දෙන වවුචර් ඩිජිටල් මාධ්‍යයෙන් සිදු කිරීම**

පුරවැසියන්ගේ ජංගම ගිණුම් වලට සෘජුව සුබසාධන ගෙවීම් සිදු කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස කටයුතු කිරීමට සැලසුම් කිරීම හා මහජන ප්‍රතිචාර රැස්කිරීමට කටයුතු කිරීමට මෙම පද්ධතිය සංවර්ධනය කර ඇති අතර 2018 අගෝස්තු 24වන දින පරිශීලක පිළිගැනීමේ පරීක්ෂාව(UAT) පවත්වනලද අතර කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් UAT ලේඛනය අත්සන් කර ඇත.

2018.10.05 දින කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක අදාළ නිලධාරීන් සඳහා පද්ධති පුහුණුව පිළිබඳ සැසිවාර පවත්වන ලද අතර ආයතන දෙකේම නිලධාරීන් විසින් ශ්‍රී ලංකා සෘජු සේවා මධ්‍යස්ථානය පද්ධතියේ විගණනය පවත්වා වාර්තා සකස් කර ඇත.

**(ආ) ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික ක්‍රමෝපාය**

2017 ජුලි 11 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය මගින් ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය සඳහා වූ උපායමාර්ග සංවර්ධනය සඳහා McKinsey සහ සමාගමේ උපදේශන සහාය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇත.

පළමු අදියර දෙක ලෙස , උපදේශන සමාගම විසින් හේතු නිර්ණය සහ සැලසුම් අවධීන් සම්පූර්ණ කිරීම කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික උපාය මාර්ග සහ මහජන හිතකාමී සැලසුම යන අංශ දෙකෙහි පළමු අදියරයන් ඉදිරිපත් කර ඇති අතර ව්‍යාපෘති සමාලෝචන කමිටුව විසින් එහි අත්සන් තබා ඇත. ඒකාබද්ධ කැබිනට් පත්‍රිකාවක වාර්තා දෙකක MODSIT,ඩිජිටල් යටිතල පහසුකම්, සංචාරක ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා කර්මාන්ත යන විෂයභාර අමාත්‍යවරුන් විසින් අත්සන් කරන ලද කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබේ.

## 3.7.4 කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය

**(අ). වී වගාව සහ අස්වැන්න පිළිබඳ MIS ස්ථාපනය කිරීම:**

CPMU විසින් කරන ලද ඉල්ලීමකට අනුව ජාතික සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුව, කැළණිය විශ්ව විද්‍යාලය (UOK) හා එක්ව MIS ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. UOK වෙබ් අඩවිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව මෙම වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම සිදු කරයි.

**(ආ). තෝරාගත් එල්ලංගා පද්ධති සංවර්ධනය කිරීම**

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට දියුණු කළ යුතු එල්ලංගා පද්ධති පිළිබඳ තොරතුරු එක්රැස්කර ඉදිරි ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**(ඇ) වන රක්ෂිතයන්, වනජීවී සංචිත ආදිය පිළිබිඹු කිරීම.**

CPMU හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා එක්ව එක් වෙබ් අඩවියක සියළුම ප්‍රධාන රක්ෂිත හා තොරතුරු ඇතුලත් සවිස්තරාත්මක දත්ත ගබඩාවක් ස්ථාපිතකර ඇත.මෙමගින් ආයෝජනකරුවන්හට පහසුවෙන් ආයෝජන සඳහා සුදුසු ඉඩම්සඳහා විස්තර ලබාගත හැක.

**(ඈ). මාතලේ දිස්ත්‍රික්කයේ සහ අනුබද්ධ කොට්ඨාසයේ කඩිනම් කොකෝවා වගා වැඩසටහන දියුණු කිරීම.**

මාතලේ, මහනුවර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල කොකෝවා වගාව නැවත ආරම්භ කිරීම සඳහා මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වේ. එය පහත පරිදි අදියර දෙකකින් ක්‍රියාත්මක වේ.

1. ගෙවතුවගා සංකල්පයට අනුව කුඩා තේ වතු හිමියන්ට කොකෝවා වගා කිරීම හඳුන්වා දීම
2. මහපරිමාණ බෝග වගාවක් ලෙස රාජ්‍ය වැවිලි කර්මාන්තය තුළ කොකොවා වගා කිරීම හඳුන්වා දීම

**(ඇ)බෝග ආරක්ෂා කිරීම සඳහා ගොවීන්ට තුවක්කු බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිය.**

වනජීවීන්ගෙන් කෘෂිකර්මාන්තයට වන තර්ජන පිළිබඳව රජයේ අවධානය යොමු කළ යුතු කරුණකි. කෘෂිකර්මාන්තයේ රැකවරණය සඳහා තුවක්කු නිකුත් කිරීම ආරක්ෂක හේතුමත සීමා වී ඇති අතර, සීමා කර ඇති තුවක්කු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ලිහිල් කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ප්‍රතිපත්තිමය යෝජනා ලබා දී ඇත.

**(ඉ) පොල් ඉඩම්වල අතුරු බෝග වගාව**

පොල් ත්‍රිකෝණයට අයත් පොල් ඉඩම්වල සැලකිය යුතු ප්‍රමාණයක බිම් කොටසක් ප්‍රයෝජනයට නොගනී. එම බිම් කොටසේ අන්නාසි, ඉගුරු, කහ, මිරිස් වැනි අතුරු බෝග පොල් සමඟ වගා කළ හැක. ඉහත වගාවන් මහා පරිමාණයෙන් මිලදී ගැනීමට කැමත්තප්‍රකාශකල පෞද්ගලික අංශයේ ආහාර නිෂ්පාදකයෙකු විසින් ඉදිරිපත් කළ යෝජනාවකටඅනුව පොල් ඉඩම්වල අතුරු බෝග වගාව සඳහා නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

## 3.7.5 විවිධ සමාලෝචන රැස්වීම්

2018 අප්‍රේල් මස සිට, CPMU විසින් විවිධ ව්‍යාපෘති මූලාරම්භයන්හි ක්‍රියාකාරීත්වය හා රැස්වීම් සම්බන්ධීකරණය කිරීම සඳහා සම්බන්ධ වන අතර පසු විපරම් කටයුතුද මෙහෙයවයි.

| | ආරම්භය/විෂය | 2018/දෙසැම්බර් 31 දක්වා පැවති රැස්වීම් ගණන |
|---|---|---|
| 1 | LGN ක්‍රියාකිරීමේ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා පසු විපරම | 06 |
| 2 | සංචාරක ප්‍රවර්ධන හා සංවර්ධන පිළිබඳ පසු විපරම | 05 |
| 3 | පිටත වටරවුම් මාර්ගය ප්‍රගති සමාලෝචනය | 02 |
| 4 | කොළඹ සහ නගරාසන්න මාර්ග සංවර්ධනය | 02 |
| 5 | සීගිරිය පිළිබඳ කමිටු රැස්වීම | 02 |

**ප්‍රස්තාර අංක 3.4: " විවිධ සමාලෝචන රැස්වීම්**

## 3.8 ආර්ථික කටයුතු සම්බන්ධ ක්‍රියාකාරකම්

### 3.8.1 සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය (SME)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය කරන ලද සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශයේ රැස්වීම් සඳහා ආර්ථික කටයුතු අංශයේ නිලධාරීන් සහභාගී වන ලදී.

රැකියා අවස්ථා මිලියනයක් උත්පාදනය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අනුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ඒකක 25,000ක් රටපුරා ස්ථාපනය කිරීමට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව එක්ව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය සඳහා නව ණය යෝජනා ක්‍රමයක් සැලසුම් කර හඳුන්වා දෙන ලදී. නව හා යෝග්‍ය තාක්ෂණ ලබා දෙමින්, තරුණ තරුණියන්ගේ පවතින කුසලතා හා දක්ෂතා උපයෝගීකරගෙන ග්‍රාමීයව පවතින සම්පත් භාවිතා කිරීම හා නව වෙළඳපොළ අවස්ථා හා සම්බන්ධතා වැඩි දියුණු කිරීම ඔස්සේ ග්‍රාමීය ආර්ථිකයේ කාර්යක්ෂමතාවය හා තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම මෙම නව ණය යෝජනා ක්‍රමයෙන් අපේක්ෂිතය.

සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධනය හා රැකියා අවස්ථා උත්පාදනය සඳහා වන ණය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මෙහෙයුම් කමිටුවක් පත් කරන ලදී.
මෙහෙයුම් කමිටුව විසින් ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය අධීක්ෂණය සඳහා යොදා ගැනීමට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධනය හා රැකියා අවස්ථා උත්පාදනය සඳහා ණය යෝජනා ක්‍රමය සම්බන්ධ මෙහෙයුම් උපදෙස් සම්පාදනය කර ඇත.

### 3.8.2 ස්වශක්ති ණය පහසුකම් යෝජනා ක්‍රමය

ග්‍රාමීය මට්ටමේ කුඩා හා මධ්‍යම ව්‍යාවසාය ආරම්භ කිරීමට තරුණ තරුණියන් ධෛර්යමත් කිරීම සඳහා වූ ස්වශක්ති ණය පහසුකම් යෝජනා ක්‍රමය ගරු. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී. “අදහස් විසි පන්දහසක් සහ විසි පන්දහසක් ව්‍යාපාර“යන තේමාව යටතේ ආරම්භ කළ මෙම වැඩසටහන, මිලියනයක් රැකියා අවස්ථා බිහිකිරීමේ රජයේ ජාතික වැඩසටහනෙහි සුවිශේෂී පියවරක් වනු ඇත. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් 200,000/- දක්වා වන ණය පහසුකමක් 5.5%ක සහනදායි පොළී අනුපාතිකයක් යටතේ සැපයෙන අතර ව්‍යාපාරයේ මූලික වියදම් ආවරණය කරගැනීම සඳහා ආපසු අයකර නොගන්නා රුපියල් 50,000ක මූල්‍ය ප්‍රදානයක් ද ණය මුදල සමඟින් පිරිනැමේ. මේ අතර, දැනට කෙරී ගෙන යන ව්‍යාපාර වැඩි දියුණු කිරීම සඳහා ද ඉහත සඳහන් කළ සහනදායි පොලී අනුපාතිකය යටතේම රුපියල් 250,000ක ණය මුදලක් පිරිනැමේ.

ග්‍රාමීය ප්‍රදේශවල පවතින සුවිශේෂී සම්පත් උපයෝගී කරගෙන නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා නව අදහස් ඇති, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නියුතු හෝ පරිසර හිතකාමී නිෂ්පාදන නිපදවීමේ නියුක්ත නව අදහස් සතු තරුණ තරුණියන් උපාධිධාරීන් හා විශේෂ නිපුණතා සහ විශේෂ අවශ්‍යතා ඇති තරුණ තරුණියන් සඳහා මෙම ණය පහසුකම ප්‍රදානය කෙරේ. ඉහත සඳහන් කෙරුණ ණය ඉල්ලුම්කරුවන්ට ස්වකීය ව්‍යාපාරවල සාර්ථකත්වය මත පදනම්ව සාමාන්‍ය පොළී අනුපාතික යටතේ අතිරේක ණය මුදලක් ලබා ගැනීම සඳහා ද අවස්ථාව හිමි වේ. මේ අනුව, 2016 හා 2017 වර්ෂවලදී ණය පහසුකම් සැපයීම සඳහා රුපියල් මිලියන 4,000ක් වෙන් කරනු ලැබූ අතර, ප්‍රතිලාභීන් 12,938 කට ණය පහසුකම් සැපයීම සඳහා මේ වන විට රුපියල් මිලියන 2,610.63ක මුදලක් වැය කර ඇත. ස්වශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් සැපයීම සඳහා 2018 අයවැය ප්‍රතිපාදන මඟින්

රුපියල් මිලියන 250 ක් වෙන් කර ඇත. 2018.12.31 වන දිනට ස්වශක්ති ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය වනුයේ ප්‍රතිලාභීන් 1,821ක් සඳහා රුපියල් මිලියන 375.42 ක ණය නිකුත් කර ඇති බවයි.

| දිස්ත්‍රික්කය | 2018.12.31 වන විට ප්‍රතිමූලායන නිදහස් කිරීම (2018.01.01-2018.12.31) | |
|---|---|---|
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ණය වටිනාකම (රුපියල් මිලියන) |
| ගම්පහ | 58 | 13.18 |
| කොළඹ | 76 | 15.93 |
| කළුතර | 142 | 29.95 |
| ගාල්ල | 135 | 28.15 |
| මාතර | 194 | 40.05 |
| හම්බන්තොට | 135 | 28.63 |
| මාතලේ | 63 | 13.41 |
| මහනුවර | 67 | 13.15 |
| නුවර එළිය | 38 | 8.10 |
| යාපනය | 53 | 8.84 |
| කිලිනොච්චි | 12 | 2.83 |
| මන්නාරම | 66 | 13.05 |
| මුලතිවු | 41 | 7.90 |
| වවුනියාව | 52 | 11.09 |
| පුත්තලම | 90 | 18.77 |
| කුරුණෑගල | 66 | 13.67 |
| අනුරාධපුරය | 52 | 11.25 |
| පොළොන්නරුව | 40 | 8.26 |
| කෑගල්ල | 52 | 10.47 |
| රත්නපුරය | 99 | 22.41 |
| ත්‍රිකුණාමලය | 3 | 0.60 |
| මඩකලපුව | 83 | 14.87 |
| අම්පාර | 44 | 8.33 |
| බදුල්ල | 48 | 10.12 |
| මොනරාගල | 112 | 22.42 |
| එකතුව | **1,821** | **375.42** |

වගු අංක 3.6: ප්‍රතිමූලායන නිදහස් කිරීම

### 3.8.3 ආපදා වලින් හානියට පත් ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම සඳහා වන "අත්වැල" ණය යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකාව තුළ සිදු වූ ආපදාවන්හි විනාශකාරී බලපෑම් සැලකිල්ලට ගනිමින් හා එම ආපදාවන්ගේ ආර්ථික හා සමාජීය බලපෑම් අවම කිරීමේ අවශ්‍යතාවයද සැලකිල්ලට ගනිමින් ආපදා හේතුවෙන් පීඩාවට පත් වූ ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම සඳහා "අත්වැල" ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමයෙහි ප්‍රධාන අරමුණ වනුයේ ආපදා තත්ත්වයන් හේතුවෙන් පීඩාවට පත් වූ ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම සඳහා සහනදායී නියමයන් හා කොන්දේසි යටතේ ණය පහසුකම් සැපයීමයි. මෙම ණය යෝජනා ක්‍රමය මගින් රජය විසින් දැනුම්දෙන ලද ඕනෑම ආපදාවකින් පීඩාවට පත් වූ ඕනෑම ආර්ථික ක්‍රියාකාරකමක් නැවත ආරම්භ කිරීම සඳහා සුදුසුකම් ඇති උප ණය ගැණුම්කරුවන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා දීම සිදු කරයි.

මෙම අමාත්‍යාංශයෙන් මූලික අරමුදල් සපයා දීම මත ශ්‍රී ලංකා මහ බැංකුව මේ සඳහා අරමුදලක් එහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇත. මෙය ප්‍රති මූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ. 2017 වසරේදී රජය විසින් මේ සඳහා රු.මි. 2000ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ප්‍රතිලාභීන්ගෙන් ණය ආපසු එකතු කර ගැනීම් ඇතුලුව වසර 20ක් දක්වා චක්‍රීය අරමුදලක් ලෙස අරමුදල ක්‍රියාත්මක වේ. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ කෘෂි කර්මාන්තය, වැවිලි, පශු සම්පත් සහ මත්ස්‍ය වගාව යන ක්ෂේත්‍ර මෙන්ම වෙළඳ, ව්‍යාපාරික, වෘත්තීමය කටයුතු ඇතුළත් සේවා ක්ෂේත්‍රවලට අයත් ආර්ථික ක්‍රියාකාරකම්ද ස්වයං රැකියා සහ කුඩා පරිමාණ ව්‍යාපාරික කටයුතු හා බැදුණු ආර්ථික ක්‍රියාකාරකම්ද නැවත ආරම්භ කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන ඇස්තමේන්තුගත ප්‍රතිස්ථාපන පිරිවැය ආවරණය කර ගැනීමට රු. 500,000/-ක් දක්වා වූ ණය මුදලක් ලබා දෙනු ලබයි.

2017 වර්ෂය සඳහා රු.මි. 1400ක් මෙම ණයයෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී ඇත. 2018 වර්ෂය සඳහා ප්‍රති ණය වියදම් පියවා ගැනීමට රු.මි. 533ක මුදලක් වෙන් කර ඇත. එම යෝජනා ක්‍රමයේ ප්‍රගතිය පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | ප්‍රතිමූල්‍යයන නිදහස් කිරීම - 2018. 09.30 වන දිනට | |
|---|---|---|
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිමූල්‍යයන වටිනාකම (රු. මි.) |
| කොළඹ | 42 | 17.08 |
| කළුතර | 527 | 239.64 |
| ගම්පහ | 2 | 1.00 |
| මහනුවර | 1 | 0.50 |
| ගාල්ල | 834 | 303.89 |
| මාතර | 1748 | 761.39 |
| හම්බන්තොට | 126 | 59.23 |
| රත්නපුරය | 260 | 115.53 |
| කෑගල්ල | 3 | 1.50 |
| එකතුව | **3,543** | **1,499.76** |

**වගු අංක 3.7: ප්‍රතිමූල්‍යයන නිදහස් කිරීම 2009.09.30**

## 3.8.4 දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - II වන අදියර - චක්‍රීය අරමුදල

2018 අයවැය මඟින් දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - II අදියරේ චක්‍රීය අරමුදලේ පරිපාලන වියදම් සඳහා රුපියල් මිලියන 32.45ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇත. මෙම චක්‍රීය අරමුදලේ ණය යෝජනා ක්‍රමය මූල්‍යයනය කරනු ලබන්නේ ජපාන රජයේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA) විසිනි. එම ව්‍යාපෘතියේ 2018.12.31 දිනට ප්‍රගතිය පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | 2017/12/31 දිනට එකතුව | | 2018.01.01 සිට 2018.12.31 දක්වා | | 2018.12.31 දිනට සමුච්චිත අගය | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිමූල්‍යයන වටිනාකම (රුපියල් මිලියන) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිමූල්‍යයන වටිනාකම (රුපියල් මිලියන) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිමූල්‍යයන වටිනාකම (රුපියල් මිලියන) |
| යාපනය | 4,372 | 332 | 92 | 11 | 4,464 | 342 |
| කිලිනොච්චිය | 1,967 | 155 | 4 | 1 | 1,971 | 155 |
| මන්නාරම | 2,450 | 184 | 18 | 2 | 2,468 | 186 |
| වවුනියාව | 2,387 | 160 | - | - | 2,387 | 160 |
| මුලතිව් | 1,092 | 102 | 15 | 2 | 1,107 | 104 |
| මඩකලපුව | 19,015 | 1,229 | 277 | 27 | 19,292 | 1,256 |
| අම්පාර | 8,127 | 552 | 88 | 7 | 8,215 | 560 |
| ත්‍රිකුණාමලය | 2,597 | 173 | 8 | 1 | 2,605 | 173 |
| පුත්තලම | 16,271 | 1,458 | 946 | 93 | 17,217 | 1,552 |
| අනුරාධපුරය | 9,607 | 733 | 152 | 11 | 9,759 | 744 |
| පොළොන්නරුව | 4,691 | 313 | 252 | 21 | 4,943 | 334 |
| බදුල්ල | 5,329 | 323 | 54 | 4 | 5,383 | 327 |
| මොනරාගල | 4,839 | 302 | 287 | 24 | 5,126 | 326 |
| රත්නපුරය | 8,576 | 664 | 1,380 | 132 | 9,956 | 797 |
| එකතුව | **91,320** | **6,681** | **3,573** | **336** | **94,893** | **7,017** |

**වගු අංක 3.8: ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - II වන අදියර**

## 3.8.5 අවබෝධතා ගිවිසුම් (MOUs)

මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව වෙනත් රටවල රාජ්‍ය නායකයන් හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් කෙරුණ අවබෝධතා ගිවිසුම්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ජනාධිපති ලේකම් කාර්යාලයට එම ප්‍රගතිය වාර්තා කිරීම සිදු කරනු ලැබේ.

## 3.8.6 වාර්ෂික වාර්තා හා කාර්යසාධන වාර්තා

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති කාර්යසාධන වාර්තා සංඛ්‍යාව

- ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2016 වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව
- මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2016 වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2015 ,2016 වර්ෂ සඳහා වූ කාර්යසාධන වාර්තා

### 3.8.7 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා

පවරා ඇති ආයතනවලට අදාළව පිළියෙල කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 18ක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 18 ක් අනුමත කර ඇත.

### 3.8.8 ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව

ආර්ථික කටයුතු අංශයට අදාළව ආර්ථික කළමණාකරණය පිළිබඳ අනු කමිටුව විසින් ගන්නා ලද තීරණ පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කර ඇත.

### 3.8.9 රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති

රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සම්බන්ධයෙන් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වූ ජාතික නියෝජිතායතනය, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා අනිකුත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධිකරණය කිරීමේ කටයුතු සිදු කෙරේ. “රාජ්‍ය අංශය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීමේ කාර්යය සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව පදනම මත පුද්ගලික ආයෝජන ලබාගැනීම හා එමඟින් ඉතිරි වන ප්‍රාග්ධන අයවැය ගුණාත්මක වැඩිදියුණු කිරීම් සඳහා යෙදවීම” මැයෙන් අංක MNPEA 07/2018දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

### 3.8.10 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩතාවය

ආර්ථිකමය කටයුතු පිළිබඳව සලකා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් ප්‍රචණ්ඩතාවය පිළිබඳව ආංශික වශයෙන් කටයුතු කිරීමට පියවර ගෙන ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය මත පදනම් වූ හිංසනයන් පිටුදැකීම සඳහා වන ප්‍රතිපත්තිමය රාමුව හා ජාතික ක්‍රියාකාරී සැලැස්මට අදාළව ආර්ථික සංවර්ධන සැලැස්ම පිළියෙල කර ඇත. මේ සම්බන්ධව ක්‍රියාත්මක වීම දැනට සිදු වේ.

### 3.8.11 රැස්වීම් සඳහා සහභාගී වීම

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම්, විගණන හා කළමනාකරණ රැස්වීම, ප්‍රසම්පාදන රැස්වීම්, ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් (STM), ආර්ථික කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ රැස්වීම්, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ(COPE) රැස්වීම් සඳහා ආර්ථික කටයුතු අංශයේ නිලධාරීන් සහභාගී විය.

## 3.8.12 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව 1997 අංක 18 පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපනය කරන ලදී. 2017 වර්ෂය දක්වා එය අමාත්‍යාංශ කිහිපයකින් සම්බන්ධීකරණ කටයුතු සිදු වුවද, 2017 වර්ෂයේ සිට ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට යටත් විය. එතැන් සිට සභාව විසින් අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවාගත් අතර පනතේ ඉලක්ක හා අරමුණු අනුව ආයතනික සැලැස්ම සකස් කරන ලදී.

"අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්" යන දැක්ම යටතේ 2018 වර්ෂය තුළදී පහත දැක්වෙන ව්‍යාපෘතීන් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් සිදු කරන ලදී.

- **පුහුණු ශ්‍රමිකයින් ශ්‍රී ලංකාව තුළට ගෙන ඒම.**

  මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව, ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනය සහ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය එක්ව 2018 ඔක්තෝබර් 2 වන දින ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනයේදී මෙම සාකච්ඡා සංසදය පවත්වන ලදී. අදාළ අංශ වලින් 140 පමණ පිරිසක් මෙම අවස්ථාවට සහභාගි විය.

- **පාසල්වල වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ:

1. වෘත්තීය හැකියාවන් සවිබල ගැන්වීම සඳහා: තම විභවතාවයන් විදහා පෙන්වීම සඳහා ජීවිත කාලය පුරාවටම සිදු කරනු ලබන කාර්යයභාරය (වැටුප් ගෙවන නොගෙවන) වල අනුපිළිවෙල හා විවිධත්වය; වෘත්තීය ජීවිතයට ඇතුළත් වන ක්‍රියාකාරකම්, විනෝදාස්වාද ක්‍රියාකාරකම්, ඉගෙනීම්, වැඩ කිරීම් ඇතුළත් වේ.
2. වෘත්තීය උපදේශන කුසලතා සංවර්ධනය කිරීම.
3. වෘත්තීය අධ්‍යාපනය දියුණු කිරීම.
4. වෘත්තීය තොරතුරු පවත්වා ගැනීම.
5. වෘත්තීය සම්බන්ධ අත්දැකීම් සම්බන්ධ කිරීම.
6. වෘත්තීය තක්සේරුව පවත්වා ගැනීම.

   මෙම ව්‍යාපෘතියට අදාළ 2018 වසර සඳහා වන පළමු වැඩසටහන 2018 ජූනි මස 18 සහ 19 දෙදින තුල ගම්පහ, ජයකොඩි මහා විද්‍යාලයේ දී 72 පමණ වන පිරිසකගේ සහභාගිත්වයෙන්ද දෙවන වැඩසටහන 2018 ජූලි මස 31 වන දින ගාල්ල, වන්චාවල මහ විද්‍යාලයේ දී 107 පමණ වන පිරිසකගේ සහභාගිත්වයෙන්ද ද තෙවන වැඩමුළුව කෑ / රන්වල මහානාග විද්‍යාලයේ 2018.1නොවැම්බර් මස 15 දින 120 පිරිසකගේ සහභාගීත්වයෙන්ද පැවැත්වී ය.

- **"රැකියා අරුණ" වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන.**

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ:

1. කර්මාන්ත / සමාගම්වල පවතින රැකියා අවස්ථා, රාජ්‍ය හා පෞද්ගලික පුහුණු ආයතන මගින් පවත්වනු ලබන නිපුණතා පුහුණු පාඨමාලා පිළිබඳ ව දැනුවත් කිරීමේ වැඩසටහන් හා රැකියා පොළ සංවිධානය කිරීම.
2. රැකියා විරහිත තරුණ තරුණියන් හට සේවා යෝජකයින්ව හඳුන්වාදීම සඳහා අවස්ථාව සලසා දීම.
3. කර්මාන්තයේ පවතින අවස්ථා පිළිබඳ යොවුන් තරුණයින් දැනුවත් කිරීම.
4. තරුණ පරපුරට කර්මාන්තකරුවන් හා සම්බන්ධ වීම සඳහා අවස්ථාව සලසා දීම.

මේ වන විට ගාල්ල, යාපනය, මාතලේ, යාපනය, මොණරාගල, පුත්තලම සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල වැඩසටහන් 6 ක් අවසන් කර ඇති අතර ඒ සඳහා 4435 ක පමණ පිරිසක් සහභාගී වී ඇති අතර ඔවුන් අතරින් 854ක පිරිසක් පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇති අතර 774 ක පිරිසකට රැකියා ලැබී ඇත.

- **රාජ්‍ය අංශයේ නිලධාරීන් ශක්තිමත් කිරීම - 2018**

  මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ රාජ්‍ය අංශයේ ප්‍රගතිය ශක්තිමත් කිරීම සඳහා නිලධාරීන් සවිබල ගැන්වීමයි. 2018 දී NHRDC මගින් රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩල, පාසල් විදුහල්පතිවරුන්, විභාග නිලධාරීන් සහ තාක්ෂණ නිලධාරීන් වැනි විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා විදෙස් පුහුණු වැඩසටහන් 9 ක් සංවිධානය කරන ලදී. සහභාගී වූ මුළු සංඛ්‍යාව 210 කි.

- **NHRDC දේශණ මාලාව**

  රාජ්‍ය සේවකයින්ගේ කළමනාකරණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා NHRDC විසින් මෙම දේශන මාලාව සංවිධානය කරන ලදී. රාජ්‍ය අංශයේ සේවකයින්ගේ යහපත උදෙසා පවත්වනු ලබන මෙම දේශන මාලාව සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ විවිධ අංශ නියෝජනය කරන බොහෝ දෙනා යහපත් ප්‍රතිචාර දක්වා තිබේ. රාජ්‍ය සේවය තුළ නිවැරදි සංවිධානාත්මක සංස්කෘතියක් සංවර්ධනය කිරීම, සේවාලාභී සත්කාරය සහ ශ්‍රම බළකාය ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා වූ උපාය මාර්ග වැනි විවිධ අංශ ආවරණය වන පරිදි ප්‍රවීන කථිකාචාර්යවරුන් මගින් මෙම දේශන මාලාව පවත්වන ලදී. මෙම වසර තුළ දේශන මාලා 6ක් පැවැත්වූ අතර ඒ සඳහා 1291 පමණ පිරිසක් සහභාගී වී ඇත.

- **ඵලදායී හා සදාචාර්යත්මක රාජ්‍ය සේවා සංස්කෘතියක් සඳහා පොදු නිපුණතා රාමුවක් නිර්මාණය කිරීම.**

  රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ හැකියාවන් සහ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව (NHRDC) විසින් අධ්‍යයනයක් කර තිබේ. විශේෂඥ කණ්ඩායම සමඟ කළ අධ්‍යයනය මත පදනම්ව රාජ්‍ය අංශය සඳහා පොදු නිපුණතා රාමුවක් සකස් කර ඒ සඳහා කැබිනට් අනුමැතිය ද ලැබී ඇත.

- **සන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම.**

මෙම ව්‍යාපෘතිය යටතේ අදාල පාර්ශවකරුවන් සමඟ වැඩමුළුවක් පවත්වන ලද අතර, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යායාලය සමග ඒකාබද්ධ ව නව පාඨමාලාවක් සකස් කර ඇත.

- **NHRDC හි සංඛ්‍යාන අත්පොත.**

  NHRDC හි දැක්ම අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ පාර්ශවකරුවන්ගේ තොරතුරු පරතරය සපුරාලීම සඳහා NHRDC හි කළමනාකාරිත්වය මගින් වාර්ෂිකව මෙම සංඛ්‍යාන අත්පොත ප්‍රකාශයට පත් කරයි. නවතම සංඛ්‍යාන අත්පොත 2018 ප්‍රකාශයට පත් කර අදාල ආයතනවලට බෙදා හැර ඇත.

- **සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් බලගැන්වීම සඳහා වන වැඩමුළුව.**

  සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සවිබල ගැන්වීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක වැඩමුළු 2ක් 2018.08.01 ගම්පහ දිස්ත්‍රික්කයේත් 2018.10.26 දින රත්නපුර දිස්ත්‍රික්කයේත් පැවැත්විය.මෙම වැඩමුළුව සඳහා සහභාගී වූ මුළු සංඛ්‍යාව 310 කි.

- පුහුණු ශ්‍රමිකයින් ශ්‍රී ලංකාව තුළට ගෙන ඒම. (සාකච්ඡා මණ්ඩපය)





- පාසල්වල වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීම.





- “රැකියා අරුණ” වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන.






- රාජ්‍ය අංශයේ නිලධාරීන් ශක්තිමත් කිරීම - 2018





- NHRDC දේශණ මාලාව





- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම.





## 3.9 විශේෂ සංවර්ධන ව්‍යාපෘති

### 3.9.1 ලෝක ආහාර වැඩසටහන

ශ්‍රී ලංකා රජය එකඟවී ඇති තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුගත වෙමින් ලෝක ආහාර වැඩසටහනේ සහාය සංවර්ධන ක්‍රියාකාරකම් ඉදිරියටත් ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන 2018 සිට 2022 වසර දක්වා පස් වසරක් තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ යටතේ රාජ්‍ය උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක වීම සඳහා රජය හා ලෝක ආහාර සංවිධානය ගිවිසුම් අත්සන් කර ඇත. උතුරු මැද, උතුර, මධ්‍යම, නැගෙනහිර හා ඌව පළාත් හි දිස්ත්‍රික් 13ක වෙසෙන ඉහළම අවධානමට ලක්විය හැකි කණ්ඩායම් වලට ආහාර ලබා ගැනීම හා පෝෂණ අවශ්‍යතා වෙනුවෙන් ව්‍යාපෘතිය ඉලක්ක වේ.

රාජ්‍ය උපාය මාර්ගික සැලසුමේ බලාපොරොත්තු වන ප්‍රධාන ප්‍රතිඵල 4 කි.

i. අර්බුදයට මැදිවූ ජනතාවට ආහාර සඳහා ප්‍රවේශ වීම
ii. වර්ෂය පුරාම ආහාර සුරක්ෂිතභාවය රහිත ප්‍රදේශ වල පාසල් යන දරුවන්ට ආහාර සඳහා ප්‍රවේශ වීම.
iii. 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ වසර 05ට අඩු දරුවන්ගේ යෞවනියන්ගේ හා ගර්භණී මාතාවන්ගේ පෝෂණය ඉහල නැංවීම.
iv. ශ්‍රී ලාංකිකයින් හට වසර පුරාම ස්වභාවික විපත් වලින් සිදු වන කම්පන හා ආතති වලදී හොඳින් මුහුණ දීමට හැකියාව ලබාදීම.

### 2018 වසර තුල ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්

### 3.9.1.1 අර්බුදයකට මැදිවූ ජනතාව ආහාර සඳහා ප්‍රවේශ වීම

මෙම සංරචකයේ අරමුණ වනුයේ ප්‍රමාණවත් ලෙස පෝෂනීය ආහාර නොලැබෙන ළමුන් හා කාන්තාවන් හට අර්බුදයකදී ආහාර සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව ආරක්ෂා කිරීමයි. මේ සඳහා ලෝක ආහාර සංවිධානය හදිසි අවස්ථාවකදී කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම ඉලක්ක කිරීම සඳහා හා අධීක්ෂණය සඳහා පද්ධතියක් පිහිටුවීමට අවශ්‍ය තාක්ෂණික සහාය ආපදා කලමණාකරන අමාත්‍යාංශයට ලබාදීමට කටයුතු කර ඇති අතර රු. මිලියන 1.4ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

### පාසල් දිවා ආහාර වැඩසටහන



පාසල් දිවා ආහාර වැඩසටහන උතුරු පළාතේ තෝරාගත් පාසල් වල පළමු ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා පන්ති වල සිටින සිසුන් 72,000කට දිනපතා පෝෂණීය දිවා ආහාරයක් සපයයි. පාසල් දරුවන්ගේ පෝෂණීය තත්වය ඉහල නැංවීම හා පාසල් පැමිණීම ඉහල නැංවීම ප්‍රධාන අරමුණ වේ. බත්, පරිප්පු, එළවළු, තෙල්, ටින් මාළු සහ එළවළු සහිත ග්‍රෑම් 125ක දිවා ආහාරයක් සෑම ශිෂ්‍යයෙකුටම සැපයේ. 2018 වර්ෂයේදී පාසැල් සිසුන් 76,000කට ආහාර ලබාදුන් අතර බත්, පරිප්පු, එළවළු, තෙල්, ටින් මාළු සහිත ආහාර මෙට්‍රික් ටොන් 346ක් බෙදා හැර ඇත. එළවළු සඳහා රු. මිලියන 18.7ක් වැය කර ඇත.

ඊට අතිරේකව, මෙම ව්‍යාපෘතිය පෝෂණ සංවේදී පාසල් වල ඉගෙනුම ලබන පාසල් සිසුන් හටද පෝෂණීය ආහාර ලබාදීම සහතික වීම ඉලක්ක කරයි. ඒ අනුව, පෝෂණ අගය ඉහල බත් ලබාදීම සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් හා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ තාක්ෂණික සහාය ඇතිව ක්‍රියා කරයි. මේ සඳහා ලෝක ආහාර වැඩසටහන රු. මිලියන 27.5ක් වෙන් කර ඇත.

### 3.9.2 කම්පන හා ආතතිවලින් ඇතිවන අවදානමට ඔරොත්තු දීම සඳහා ගොඩනැංවීම

කාලගුණික විපර්යාස වලින් බලපෑමට ලක්වන ප්‍රජාව ඉලක්ක කර මෙම සංරචකය ක්‍රියාත්මක වේ. පරිසර සංරක්ෂණය, ඉඩම් පුනරුත්ථාපනය, ජලය රැස් කිරීම, ජීවනෝපාය, කුසලතා සංවර්ධනය, ඵලදායී වත්කම්නිර්මාණය, අගයදාම වැඩිදියුණු කිරීම, සහ වෙළඳපල සබඳතා වැනි දේශියව ක්‍රියාත්මක මැදිහත්වීම් මඟින් උතුරු, ඌව, නැගෙනහිර, හා මධ්‍යම පළාත්හි යෝග්‍ය සංවේදී හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පාදක කර ගත් ඔරොත්තුදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

මෙවැනි මැදිහත්වීම් බලපෑමට ලක්වන ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත් වන ජනතාව අතර රැකියා අවස්ථා බිහි කරන අතර එය රජයේ 2025 දැක්ම හා තිරසාර සංවර්ධන වැඩසටහනට දායක වේ. ස්ත්‍රීන් ප්‍රධානීන් වන නිවාස ඒකක ඇතුළු අවම ඔරොත්තු දීමේ හැකියාව ඇති පවුල් ඒකක ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබයි. වත්කම් නිර්මාණය මඟින් ඔරොත්තුදීමේ හැකියාව ඇති කිරීම මුදල් ප්‍රේරන ක්‍රමෝපාය උපයෝගී කර ගනී.

2018 වර්ෂයේදී රු. මිලියන 219ක් වෙන් කිරීම මඟින් අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මාතලේ, මොනරාගල, මුලතිව්, නුවරඑළිය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය හා වව්නියා දිස්ත්‍රික්ක වල ස්වභාවික විපත් වලින් කම්පනවලට ලක්වන ප්‍රජාවට සහය





ලබාදී ඇති අතර පහත ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- **කෘෂි නිෂ්පාදන වැඩිදියුණු කිරීම**
  කුඩා ප්‍රමාණයේ ජලාශ 57ක නඩත්තුව හා පුනරුත්ථාපනය මඟින් ජලය ලබා ගැනීම දියුණු කිරීම හා වගා වපසරිය ඉහල දැමීම සඳහා රු. මිලියන 144.7ක් ආයෝජනය කරමින් සිටී.
- **වාණිජමය ගෙවතු හා කෘෂි නිෂ්පාදන සඳහා වියළි කලාපයේ ජල භාවිතය කාර්යක්ෂම කිරීම**
  බිඳිති හා විසිරුම් වැනි ක්ෂුද්‍ර ජල සැපයුම් පද්ධති ලබාදීම ඉලක්ක ගත කණ්ඩායම් වල ආදායම් වැඩිකිරීමට උපකාරී වේ. මේ යටතේ බදුල්ල දිස්ත්‍රික්කය තුල නියමු ව්‍යාපෘති 24ක් පිහිටුවීමට කටයුතු කෙරේ.
- **නිවාස ඒකක මට්ටමින් ජලය රැස් කිරීම දියුණු කිරීම**
  කෘෂි ළිං හා වර්ෂා ජලය රැස් කරන ඒකක 310ක් නවීකරනය හා පිහිටුවීම මඟින් ජලය වෙත ප්‍රවේශ වීමේ හැකියාව වැඩිකර ඇත. මේ සඳහා රු. මිලියන 52.4ක් වැය කෙරේ.
- **ජීවනෝපාය පුහුණු මඟින් රැකියා ජනනය**
  බලපෑමට ලක්වන කාන්තාවන් හා රැකියා විරහිත තරුණයින් ඉලක්ක කණ්ඩායම වේ. විවිධ වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන හරහා තරුණයන් හා කාන්තාවන් 245ක් සඳහා පුහුණු වැඩසටහන් 30ක් ක්‍රියාත්මක වේ. මෝටර් කාර්මික, ඇඳුම් මැසීම, ගෘහ රැහැන් ඇදීම, රෙදි විවීම ආදිය ප්‍රධාන පුහුණු වැඩසටහන් වේ. මේ සමඟම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 13ක් රු. මිලියන 6.5ක් වැයකර නවීකරණය කරයි. ඒ අනුව මෙම සංරචකය සඳහා රු. මිලියන 21.7ක් වෙන්කර ඇත. තවද රු. මිලියන 3.5ක් පුහුණුව අවසානයේ තෝරාගන්නා පුහුණුලාභීන් 195ක් වෙත මූලික ව්‍යාපාර ඇරඹීම සඳහා යෙදවේ.

ඊට අමතරව “ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ වෙසෙන කාන්තාවන්ගේ ආර්ථික අභිවෘද්ධිය තුළින් සාමය ගොඩනැඟීම” යන ලෝක ආහාර වැඩසටහන හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය එක්ව සැකසූ

ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීමට සහාය වේ. මෙය රාජ්‍ය උපාය මාර්ගික සැලසුමේ ඔරොත්තු දීම වර්ධනය කෙරෙන සංරචකයක් ලෙස එක්සත් ජාතීන්ගේ සාම සාධක අරමුදල වෙත ඉදිරිපත් කර ඇත. සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය ඇමරිකානු ඩොලර් 2,000,000 කි. (ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දායකත්වය ඇමරිකානු ඩොලර් 1,485,000ක් හා ලෝක ආහාර සංවිධානයේ දායකත්වය ඇමරිකානු ඩොලර් 515,000කි. මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු කාන්තා ව්‍යවසායකයින්ගේ සමූපකාර සමිතිය දේශීය හවුල්කරු ලෙස ක්‍රියා කරයි.) හිටපු සටන්කාරියන්, අනෙකුත් අවාසිසහගත හා ගැටුම්වලින් පීඩාවට පත්වූ කාන්තාවන් 350ක් සහිත පුසුකුඩිරිප්පු කාන්තා ව්‍යවසායකයින්ගේ සමූපකාර සමිතියේ සාමාජිකාවන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීම, සමාජ අන්තර් සම්බන්ධතා ඔරොත්තු දීමේ වර්ධනය හා සාමය ගොඩනැංවීම මෙහි ඉලක්ක වේ. මෙය නව වෙළඳපොල ජාල හා වැඩිදියුණු කරන ලද පශ්චාත් ගැටුම් පරිසර සමඟ සමූපකාර ව්‍යවසායික සබඳතා හරහා ක්‍රියාත්මක කෙරේ.

**මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.**

| මූල්‍ය කේත | 2018 වෙන් කිරීම - රු. මිලියන | 2018.12.31 දිනට වියදම | ප්‍රගතිය % |
|---|---|---|---|
| **13** | 624.24 | 245.22 | 40 |
| **16** | 183.60 | 55.05 | 30 |
| **17** | 192.16 | 90.28 | 46 |
| **එකතුව** | **1,000.00** | **390.55** | **39** |

වගු අංක 3.7: මූල්‍ය ප්‍රගතිය

### 3.9.3 ඇමරිකානු ආධාර (USAID) වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

මෙම ව්‍යාපෘති ශ්‍රී ලංකා රජය සහ ඇමරිකා එක්සත් ජනපදය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව ක්‍රියාත්මක වේ. USAID වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් ආනයනය කරනු ලබන භාණ්ඩ බදු සහ අගය එකතු කරන ලද බදු (VAT) වලින් නිදහස් කිරීමට ශ්‍රී ලංකා රජය එම අවබෝධතා ගිවිසුම යටතේ බැඳී ඇත. මේ වසරේ USAID ආධාර යටතේ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක විය. එනම් නව ආර්ථික කටයුතු වර්ධනය කිරීමේ වැඩසටහන (VEGA B1Z+ ) හා ප්‍රජාතාන්ත්‍රික පාලනය හා වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SDGAP Project) වේ.

### 3.9.4 නව ආර්ථික කටයුතු වර්ධනය කිරීමේ වැඩසටහන (VEGA B1Z+ )

දේශීය හවුල්කරුවන් සමඟ එක්ව රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය දිරිමත් කිරීම සඳහා සහයෝගය දක්වනු ලබන අතරම සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි යහ කළමනාකරණ භාවිතය වැඩි දියුණු කර ගැනීමට මෙන්ම උද්‍යාන පාලනය, කිරි නිෂ්පාදනය, ජලජීවී වගාව, සැපයුම් සේවාවන්, ඇඟලුම් සහ ඉදිකිරීම් ක්ෂේත්‍ර යනාදී වූ ඉලක්කගත කර්මාන්ත යටතේ සිදුවන නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සහ අවශ්‍ය තාක්ෂණික සහය, පුහුණුව හා ආධාර ලබා දීම මේ යටතේ සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය සෘජුවම ඇමරිකානු ආධාර යටතේ ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා USAID වැඩසටහන යටතේ ඇ.එ.ජ.ඩො. මිලියන 26.9 ක් සහ මිලියන 63.4ක මුදලක් ආයෝජනය කරනු ලබන අතර උතුර, උතුරු මැද, නැගෙනහිර හා ඌව පළාත් තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය සංරචකයන් දෙකකින් සමන්විත වේ. එනම්. ආධාර ලබාදීම සහ තාක්ෂණික සහය ලබා දීම වේ. මෙම ව්‍යාපෘතිය යටතේ නව රැකියා සහ ආදායම් උත්පාදන මාර්ග 107ක් ලබා ගැනීමට හැකිවී ඇත. තවද ශ්‍රී ලංකා රජය විසින් අදාල බදු ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා රු මිලියන 32 ක් වෙන් කර ඇත.

### 3.9.5 ප්‍රජාතාන්ත්‍රික පාලනය හා වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SDGAP Project)

සහයෝගීතා ගිවිසුම් අංක 383-0126 යටතේ දැක්වෙන ප්‍රතිපාදන අනුව, ප්‍රජාතාන්ත්‍රික පාලනය හා වගවීම ශක්තිමත් කරලීමේ ව්‍යාපෘතිය (SDGAP) ප්‍රධාන ආයතන හා අමාත්‍යාංශ කිහිපයක් හරහා ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික පාලනයක් සඳහා වඩා ඵලදායී හා වගවීමෙන් යුත් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වගවීමේ ක්‍රියාවලිය සවිමත් කිරීමයි. මෙම ව්‍යාපෘතිය වසර තුනක ව්‍යාපෘතියක් ලෙස 2016 ඔක්තෝම්බර් මස සිට 2019 සැප්තැම්බර් මාසය දක්වා ක්‍රියාත්මක වේ.

### 3.9.6 යුරෝපා සංගමයේ අරමුදල ව්‍යාපෘතිය

ඌව හා මධ්‍යම පළාත් සභා හා ඒවායේ පළාත් පාලන ආයතන වල ආධාරයෙන්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන 5ක් විසින් ක්‍රියාත්මක කෙරෙන යුරෝපා සංගමයේ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති ජාතික මට්ටමින් මෙම අංශය සම්බන්ධීකරණය කරයි. මධ්‍යම පළාතේ මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක වලද ඌව පළාතේ මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්ක තුලද වෙසෙන ඉහළම බලපෑමට ලක්වන දුප්පත් ජනතාව වෙත ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශය මඟින් මෙම ව්‍යාපෘතිය සහන සලසයි. මෙම ව්‍යාපෘතියේ පහත ලෙස උප ව්‍යාපෘති 05කි.

1. ව්‍යවසාය ව්‍යාපෘතිය.
2. සෞඛ්‍ය හා පෝෂණය නැංවීම සඳහා ජනතාවට නොලැබී ඇති ජලය, සනීපාරක්ෂාව, සමානව ලබාදීම.
3. මධ්‍යම හා ඌව පළාත් වල ඒකාබද්ධ ආර්ථික සංවර්ධනය.
4. පෝෂණ සංවර්ධනය හා පරිසරය සැකසීම මඟින් ප්‍රජාවට සහාය වීම.
5. ඌව හා මධ්‍යම පළාතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුලත් සමාජ ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම.







### 3.9.7 කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතිය

කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කෘෂි ඵලදායිතාවය ඉහළ නැංවීමට සහායවීම, වෙළඳපොලට ප්‍රවිශ්ඨවීම දියුණු කිරීම සහ ව්‍යාපෘති බල ප්‍රදේශ වල කෘෂි ව්‍යාපාර හා කුඩා පරිමාණ ගොවීන්ගේ නිෂ්පාදන වලට අගය එකතු කිරීම ඉහළ නැංවීමයි. මෙම ව්‍යාපෘතියේ සංරචක 3කි.

මෙහි පළමු සංරචකය වන්නේ කෘෂිකාර්මික වටිනාකම් දාමය සංවර්ධනය කිරීමයි. මෙමඟින් වාණිජ හා අපනයනය අරමුණු කරගත් කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, වැඩි වටිනාකමින් යුත් කෘෂිකාර්මික නිෂ්පාදන සිදුකිරීම හා අගය එක් කිරීම සඳහා ගොවි නිෂ්පාදන සමාගම් සහ කෘෂි ව්‍යාපාර වලින් ආයොජකයින් ආකර්ෂණය කර ගැනීම, තාක්ෂණික සහාය, වාණිජ බැංකු ක්ෂේත්‍රය

සමඟ සම්බන්ධතාවය, ඇප ආවරණ පහසුකම් හරහා එවැනි ආයෝජන සඳහා අවශ්‍ය පරිසරය, දිරිදීමනා සහ මූල්‍ය පහසුකම් ලබාදීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කෙරේ.

ඵලදායීතාවය ඉහළ නැංවීම හා විවිධාංගීකරන ආදර්ශන දෙවන සංරචකයයි. මෙහිදී තරඟකාරී වෙළඳාම් කල හැකි භාණ්ඩ නිෂ්පාදනය සඳහා කුඩා ගොවීන්ට සහය වීම, වෙළඳපොල අවශ්‍යතාවය අනුව හැඩගැසීමට සහ දියුණුවූ වාණිජකරණය කරා ගමන් කිරීමට ඔවුන්ගේ ඇති හැකියාවන් වැඩිදියුණු කිරීම අරමුණු කෙරේ.

තුන්වන සංරචකය ව්‍යාපෘති කළමනාකරණය නිරීක්ෂණය හා ඇගයීමයි. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ සහ ව්‍යාපෘති කළමණාකරන අංශය සඳහා උපකාර කිරීම සිදුවේ.

සම්බන්ධීකරණය හා ගැටළු නිරාකරණය හා අදාල පාර්ශ්වකරුවන් සමඟ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තිය පුහුණු හා  නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුවේ සභාපතීත්වය දරයි.

### 3.9.8 කාලගුණය පදනම් කරගත් වාරි කෘෂි ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ හම්බන්තොට, මොණරාගල, කුරුණෑගල, පුත්තලම, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, අනුරාධපුර, පොලොන්නරුව, කිලිනොච්චිය සහ මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක 11ට අයත් පළාත් සභා 6ක තෝරාගත් ව්‍යාපෘති බල ප්‍රදේශ වල ඵලදායීතාව නැංවීම සහ කුඩා පරිමාණ ගොවීන් හට කාලගුණයෙන් වන බලපෑම අවම කිරීමයි. මෙම ව්‍යාපෘතියේ සංරචක වන්නේ (i) කෘෂි නිෂ්පාදන හා අලෙවිකරණය (ii) කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය (iii) ව්‍යාපෘති කළමණාකරනය සහ (iv) අවිනිශ්චිත හදිසි අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීම වේ.

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තිය පුහුණු හා  නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය සිදු කරයි. ව්‍යාපෘති තක්සේරුව, මූල්‍ය ගිවිසුම හා ප්‍රසම්පාදන සැලැස්ම අදහස් දැක්වීම සඳහා ඉදිරිපත් කර ඇත. මෙම ව්‍යාපෘතිය ඇ.ඩො. මිලියන 140ක මූල්‍ය වටිනාකමක් ඇති අතර ඉන් ඇ.ඩො. මිලියන 125 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය මඟින් දරන අතර ශ්‍රී ලංකා රජය ඇ.ඩො. මිලියන 10ක් සහ ප්‍රතිලාභීන් මඟින් ඉතිරි ඇ.ඩො. මිලියන 5 දරයි.

### 3.9.9 "ජනපතිට කියන්න" වැඩසටහන

"ජනපතිට කියන්න" වැඩසටහන සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් වැඩිදියුණු කරන ලද නව දත්ත පද්ධතියක් හඳුන්වා දෙනු ලැබීය. එම දත්ත පද්ධතිය තුළින් මෙම අමාත්‍යාංශය වෙත යොමුවන මහජන ඉල්ලීම් (දුක්ගැනවිලි) සම්බන්ධයෙන් කටයුතු කිරීමේදි අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධ කර ගනු ලබයි. ඒ ඒ ආයතන වල විෂයන්ට අදාල දුක්ගැනවිලි එම ආයතන වෙත යොමු කරනු ලබයි.

**"ජනපතිට කියන්න" වැඩසටහන මගින් යොමුවන මහජන ඉල්ලීම් සම්බන්ධයෙන් 2018.01.01 සිට 2018.12.31 දක්වා කාලයට අදාලව ප්‍රගතිය**

| | |
|---|---|
| **අමාත්‍යාංශය ලද මුළු ඉල්ලීම් සංඛ්‍යාව** | **413** |
| විසඳුම් ලබාදුන් සංඛ්‍යාව හෝ  විසඳීමට පියවර ගනිමින් ඇති සංඛ්‍යාව | 378 |

වගු අංක 3.8: ජනපතිට කියන්න" වැඩසටහන මගින් යොමුවන මහජන ඉල්ලීම්

### 3.9.10 ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම

සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය විසින් ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම 2017-2021 දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලැබේ. ක්‍රියාකාරී සැලැස්මේ මෙහෙයුම් කටයුතු අභ්‍යන්තර අමාත්‍යාංශ මට්ටමින් සිදුකරයි. පරිච්ඡේද අංක 07 යටතේ ඇති ආර්ථික, සමාජීය සංස්කෘතික හිමිකමට අදාල කටයුතු අප අංශය වෙත පැවරී ඇත. ඒ අනුව මාසික ප්‍රගතිය ලබා ගැනීම සඳහා මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා අදාල ප්‍රගතිය ලබාදීම සිදුකරයි. ප්‍රගතිය පහත පරිදි වේ.

| ක්‍රියාකාරකම් | එකතුව | සම්පූර්ණ කරන ලද | ක්‍රියාත්මක වෙමින් පවතින | සුළු ප්‍රගතිය |
|---|---|---|---|---|
| කෙටි කාලීන | 24 | 23 | 1 | |
| මධ්‍ය කාලීන | 89 | 25 | 61 | 3 |
| දිගු කාලීන | 58 | 12 | 46 | |
| මුළු අගය | **171** | **60** | **108** | **3** |

වගු අංක 3.9: මාසික ප්‍රගතිය

### 3.9.11 පවුල්අයවැයඒකකය (Family Budget Unit)

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු රැස්වීමේදී ගනු ලැබූ තීරණයක් පරිදි අනපේක්ෂිත කාළගුණික තත්ව යටතේ රට තුළ ආහාර සැපයුමෙහි වන විචල්‍යයන් පිළිබඳ අවධානය යොමු කිරීමටත් පීඩාවට පත් වූ ජනතාවට සහන සැලසීමටත් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ පවුල් අයවැය ඒකකයපිහිටුවනු ලැබීය. ගෘහ ඒකක සඳහා දැරිය හැකි මිලකට අත්‍යාවශ්‍ය භාණ්ඩවල සමස්ත සැපයුම සමාලෝචනය කිරීම මෙහි මූලික අරමුණයි. ආහාර ද්‍රව්‍යවල මිල ගණන් සතිපතා අධීක්ෂණය කිරීම සහ ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවට සහ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවට වාර්තා කිරීම, දේශගුණික අනාවැකි සහ ආහාර නිෂ්පාදන මත එහි බලපෑම තක්සේරු කිරීම සහ ලංකා සතොස, වී අලෙවි මණ්ඩලය, ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන සහ පෞද්ගලික අංශය සමඟ ආහාර සැපයුම් ක්‍රියාවලිය අධීක්ෂණය කිරිම මෙම ඒකකයෙහි කාර්යභාර්යයන් වේ.
පවුල් අයවැය ඒකකය යටතේ මෙහෙයවනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

a) පොල් මද ආනයනය සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳ ගැටළු අධීක්ෂණය කිරීම.
b) සාමාන්‍ය වෙළඳපොළ මිල යාන්ත්‍රණයෙන් බැහැරව පිරිවැය මත පදනම් මිලකට ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ පහසුකම් ලබා දීමේ රජයේ වැඩසටහනට දායක වූ සුපිරි වෙළඳසැල්වලට දැරීමට සිදු වූ අලාභ ප්‍රතිපූරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
c) චීනයෙන් ටින් මාළු ආනයනය පිළිබඳ වූ ගැටළු නිරාකරණය සඳහා දායක වීම.
d) සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් සඳහා සහන ප්‍රදානය කිරීම සම්බන්ධ ව ක්‍රියාමාර්ග ගැනීම.
e) එළවළු හා පළතුරු ගබඩා කිරීමේ ශ්‍රී ලංකාවේ විශාලතම ශීතාගාරය ඉදිකිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීම.

#### 3.9.11.1 පොල්මද ආනයනය සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳ ගැටළු අධීක්ෂණය කිරීම.

2017 දෙසැම්බර් මාසයේ පොල්මද ආනයනය කිරිමේ දී ඇතිවන ප්‍රායෝගික ගැටළු සම්බන්ධ ව ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් සාකච්ඡා පවත්වනු ලැබීය. ඒ අනුව, පොල්මදකඩිනමින් ආනයනය කිරීමේක්‍රියාවලිය නියමිත පරිදි කිසිඳු ගැටළුවකින් තොරව සිදුවන බව සහතික කිරීමටත් එය අධීක්ෂණය කිරීමටත් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන

කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මඟින් මෙම කමිටුව අනුයුක්ත කරනු ලැබීය. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය මේ සම්බන්ධව කටයුතු කිරීම සඳහා නම් කරන ලදි. තවදුරටත්, ඕස්ට්‍රේලියාවේ අනුගමනය කරන නිරෝධායන යාන්ත්‍රණය සොයා බැලීම සහ ශ්‍රී ලංකාවේ එම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට ඕස්ට්‍රේලියානු සහය ලබා ගැනීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමට උපදෙස් දෙන ලදි.

### 3.9.11.2 සාමාන්‍ය වෙළඳපොළ මිල යාන්ත්‍රණයෙන් බැහැරව පිරිවැය මත පදනම් මිලකට ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ පහසුකම් ලබා දීමේ රජයේ වැඩසටහනට දායක වූ සුපිරි වෙළඳසැල්වලට දැරීමට සිදු වූ අලාභ ප්‍රතිපූරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් ඉහළ ජීවන වියදම සඳහා පිළියමක් ලෙස හාල්, මයිසූර් පරිප්පු, සීනි, හාල් මැස්සන්, ලූණු, අල, මැකරල් යන අත්‍යාවශ්‍ය ආහාර ඇතුළත් සහන මල්ලක් පෞද්ගලික සුපිරි වෙළඳසැල් ජාලය හා සතොස මඟින් බෙදාහැරීමට කටයුතු කරන ලදි. ඒ අනුව, මේ සඳහා සම්බන්ධ වන ආයතන සඳහා ගෙවන ලද ආදායම් බද්දෙන් 50% ක් ප්‍රතිපූරණය කිරීම ඇතුළු බදු සහන ලබාදීම සඳහා මෙම ඒකකය හරහා රජය කටයුතු කරනු ලබයි.

### 3.9.11.3 චීනයෙන් ටින්මාළු ආනයනය පිළිබඳවූ ගැටළු නිරාකරණය සඳහා දායක වීම.

චීනයෙන් ආනයනය කරනු ලැබූ ටින් මාළුවල පරපෝෂිතයන් සහිත බව ශ්‍රී ලංකා රේගු අධිකාරිය විසින් වාර්තා කරනු ලැබූ අතර ඒ සම්බන්ධව වූ ගැටළු නිරාකරණය පවුල් අයවැය ඒකකය විසින් සිදුකරනු ලබයි. මෙම ඒකකය විසින් කළ ඉල්ලීමක් පරිදි නීතිපති දෙපාර්තමේන්තුව නීතිමය උපදෙස් මාලාවක් නිකුත් කළ අතර එය මෙම ගැටලුව සම්බන්ධව කටයුතු කිරීම සඳහා සහයෝගය ලබා දෙනු ලබන ශ්‍රී ලංකා රේගු අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ආහාර පාලන ඒකකය සඳහා දැනුම් දෙනු ලැබීය. ඒ අනුව,ටින් මාළු පිළිබඳ නීතිමය උපදෙස් පරිදි කටයුතු කිරීමට සහ ඒ සම්බන්ධව වර්තමාන ප්‍රගතිය වාර්ථා කිරීමටත් මෙම ආයතන සඳහා උපදෙස් ලබා දී ඇත.

### 3.9.11.4 සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් සඳහා සහන ප්‍රදානය කිරීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම.

පසුගිය අනුගාමී කන්න හතරක් තුළ වී නිෂ්පාදනයේ පහළ වැටීමත් සමඟ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් බලවත් මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ පා ඇත. මෙම තත්වය මත වී මෝල්හිමියන්ට ලබා දී තිබූ ණය ගෙවීමට නොහැකි වීම හේතුවෙන් ඒ සම්බන්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබූ බැංකු සමඟ සාකච්ඡා පැවැත්වීම මෙම ඒකකය යටතේ සිදුකරනු ලබයි. මෙම සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස අදාළ බැංකු විසින් තාවකාලිකව නීතිමය පියවර ගැනීම අත්හිටුවීමට සහ එකී ණය ගැනීම වෙන් වෙන් ව සමාලෝචනය කිරීමට එකඟතාවය පළ කර ඇත.

### 3.9.11.5 එළවළු හා පළතුරු ගබඩා කිරීමේ ශ්‍රී ලංකාවේ විශාලතම ශීතාගාරය ඉදිකිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීම.

ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ අනුදැනුම පරිදි එළවළු හා පළතුරු ගබඩා කිරීම සඳහා මෙරට ඉදිවන විශාලතම ශීතාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ඉන්දීය රජය සමඟ අයබෝධතා ගිවිසුමකට එළඹුණ අතර එය දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය අසල ඉදිකිරීමට නියමිතය.

# 3.10 ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

## 3.10.1 දැක්ම

දැයේ සංවර්ධනයටඅවශ්‍ය උපදේශනය හා පහසුකම් සපයන්නා වීම

## 3.10.2 මෙහෙවර

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම

## 3.10.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික හා ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සහාය වීම.
- මධ්‍ය කාලීන අයවැය රාමුව සකස් කිරීම:රාජ්‍ය ආයෝජන වැඩසටහන.
- ව්‍යාපෘති ඇගයීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම.
- ආංශික ප්‍රවේශය ගොඩනැංවීම සඳහා මුලිකත්වය ගැනීම
- ව්‍යාපෘතිපෙළගැස්ම.
- සැලසුම් මාර්ගෝපදේශ සැකසීම.
- උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සැපසීම.
- විමධ්‍යගත මූලධන අයවැය ප්‍රතිපාදන කලමණාකරණය සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- සංවර්ධන පාර්ශවකරුවන්ගේ දූත මෙහෙයන් කළමණාකරණය කිරීම.
- විශේෂ පැවරුම් සම්පූර්ණ කිරීම
- කාර්යමණ්ඩල ධාරිතා සංවර්ධන
- පොදු පරිපාලනය

## 3.10.4 සාමාන්‍ය කාර්යසාධනය

- රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017 -2020 ) යාවත්කාලීන කරන ලදී
- 2017-2020 රාජ්‍ය ආයෝජන වැඩසටහනේ නව සංවර්ධන ව්‍යාපෘති 354 න් 200 ක්‍රියාත්මක කිරිම ආරම්භ කරන ලදි.
- සිංහරාජ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2018 – 2020 සකස් කරන ලදී.
- ලෝක බැකු මූල්‍යායනය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති සම්පාදනපහසුකම් සැපයීමේ වැඩසටහනමෙම දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය යටතේ ක්‍රියාත්මකකරනු ලබන අතර ඒ යටතේ 2018 වර්ෂයේදීපහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.
  - මූලිකසෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය
  - දේශගුණික අනුවර්තිත වාරි කෘෂි ව්‍යාපෘතිය
  - පළාත් පාලන සංවර්ධන සහයෝගීතා ව්‍යාපෘතිය
  - තිරසර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය

### 3.10.5 2018.12.31 දිනට ආංශික කාර්ය සාධනය

#### 3.10.5.1 කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, පශුසම්පත් හා ධීවර

- පරිභෝජනය හා අපනයනය සඳහා සෞඛ්‍යමත් ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා ගුණවත් කෘෂිකා ර් මි ක භාවිතාවයන් (Good Agricultural Practices) පිළිබඳ උපාය මා ර් ගයන් සකස් කිරීම.

- වී ගබඩා කිරීම අධීක්ෂණය සඳහා කළමණාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීම. මෙමගින් කිසියම් කාලයකදී රට තුළ වී/සහල් තොග තත්වය පිළිබඳව සොයා බැලීම සිදු කළ හැකි අතර එම තොරතුරු පද්ධතිය කෘෂි ක ර් ම දෙපාර්තමේන්තුවේ " Crop Look Net" තොරතුරු පද්ධතියේ සමඟ ඒකාබද්ධ කිරීමට පසුව තීරණය කරන ලදී.

- කෘෂි ක ර් ම ක්ෂේත්‍රයට අයත් අංශ සියල්ලටම අදාළව කෘෂි ක ර් ම ප්‍රතිපත්තිය සකස් කිරීමට සියලු පා ර් ශ වකරුවන් සමඟ එක්ව කටයුතු කිරීම හා අවශ්‍ය තාක්ෂණික යෙදවුම් සහ ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබාදීම.

- භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ උපදෙස් මත රබර් හා තේ ක ර් මා න් තය සඳහා ලබා දුන් සහනාධාර පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීම හා එම විශ්ලේෂණය පිළිබඳ උපාය මා ර් ග පත්‍රිකාවක් අමාත්‍ය මණ්ඩලයේ අනුකාරක සභාවට ඉදිරිපත් කිරීම සඳහා සකස් කිරීම.

- එක්සත් ජාතීන්ගේ සං ව ර් ධන වැඩසටහන "UNDP"සහ ආහාර හා කෘෂි ක ර් ම සංවිධානය "FAO"සභාය ඇතිව අදාළ රේඛීය අමාත්‍යාංශ හා ආයතන සමඟ එක්ව කෘෂි ක ර් මක්ෂේත්‍රයටඅදාළ තිරසාර සංව ර් ධ නඅරමුණුදේශීයකරණය කිරීම පිළිබඳවඅධ්‍යනයක් සිදුකිරීම.

- නව ධීවර හා ජල ජීවී ප්‍රතිපත්තියසකස් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික යෙදවුම් සහ ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම සඳහා අදාළ සියලු පා ර් ශ වකරුවන් සමග එක්ව කටයුතු කිරීම.

- රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජනයෙහි අවකාශීය විශ්ලේෂණය කිරීම සඳහා දැනට ක්‍රියාත්මක හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රධාන ග්‍රාමීය සංව ර් ධ න ව්‍යාපෘති හා ප්‍රමුඛ ව්‍යාපෘති සිතියම් ගත කිරීම.

- කුඩා වැව් හා අමුණු පුනරුත්ථාපනය කි රී මේ දී සිදුවනප්‍රසම්පාදන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.

- ගංවතුර අවම කිරීම , ආපදා වැලැක්වීම සහ ජල සම්පත් සංව ර් ධ නය ට අදාළව 2019-2024 කාල පරි ච් ජේ දය තුළ සිදු කිරීමට නියමිත ව්‍යාපෘති ඇතුළත් ප්‍රමුඛතා ලේඛණයක්සකස් කිරීම.

### 3.10.5.2 කර්මාන්ත , වෙළඳ හා ආයෝජන

- කොළඹ - ත්‍රිකුණාමලය ආර්ථික කොරිඩෝව සංවර්ධනය (**Colombo – Trincomalee Economic Corridor Development)** අධ්‍යයනය පැවැත්වීමට තාක්ෂණික සහාය ලබා දීම සහ එහි අවසන් වාර්තාව ප්‍රචාරණය සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමග සියළු පාර්ශව කරුවන් සහභාගිත්වය සහිතව උසස් මට්ටමේ නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළුවට සහභාගි වීම.
- “2025 දැක්ම : පොහොසත් රටක් ” සඳහා ආංශික ප්‍රතිපත්තිමය යෙදවුම් ලබා දීම.
- ජාතික අපනයන උපාය මාර්ග සැකසීම සඳහා සක්‍රීය වශයෙන් දායක වීම.

### 3.10.5.3 අධ්‍යාපන , උසස් අධ්‍යාපන, නිපුනතා සංවර්ධන , විද්‍යා තාක්ෂණ , තොරතුරු හා සන්නිවේදනය , ජනමාධ්‍ය හා තැපැල් අංශයන්

- දිස්ත්‍රික් මට්ටමින් ග්‍රාමීය ව්‍යාපෘති සැකසීම සඳහා තොරතුරු ලබා දීම
- ඉ- ග්‍රාම නිලධාරි ව්‍යාපෘතිය සඳහා ප්‍රශ්නාවලිය සැකසීම සඳහා තාක්ෂණික සහය විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සඳහා ලබා දීමග
- නිපුනතා ආංශික සංවර්ධන වැඩසටහනේ හතරවන අන්තර් අමාත්‍යාංශ මෙහෙයුම් කමිටුව පැවැත්වීම (ජුනි 08)
- චිත්‍රපට ඩිජිටල්කරණය හා බෙදා හැරීම සම්බන්ධ “සිනේ පිල්ම්” (CINE FILM) කමිටුවසඳහාඅවශ්‍ය තාක්ෂණිකසහායලබාදීම.
- අ.පො.ස.(උ.පෙ.) සමත් සිසුන් සඳහා පොලී රහිත ණය යෝජනා ක්‍රමයට අදාල රැස්වීම් සංවිධානය / පැවැත්වීම
- දකුණු ආසියානු උප කලාපීය ආර්ථික සහයෝගීතාවය සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ එක්ව මෙහෙයුම් හා සැලසුම් සකස් කිරීම.

### 3.10.5.4 සාර්ව ආර්ථික

- රටේ ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2018 – 2019 සකස් කිරීම
- ප්‍රාග්ධන අයවැය සීමා (2019 – 2021) සැකසීම හා පුරෝකතනය කිරීම

### 3.10.5.5 යටිතල පහසුකම්

ප්‍රවාහන අංශයට අදාල පහත දැක්වෙන ප්‍රතිපත්ති සම්පාදනයට සහභාගි වී අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබා දෙන ලදී.

- ජාතික මාරග ප්‍රතිපත්තිය
- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය
- ජාතික වරාය හා සාමුද්‍රීය ප්‍රතිපත්තිය

### 3.10.5.6 සමාජ ආරක්ෂණය

- ශ්‍රී ලංකාවේ මුල් ළමා විය සංවර්ධන පහසුකම් පුළුල් කිරීම පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් කමිටු නිර්දේශ පිළිබඳ වාර්තා සකස් කිරීම.
- ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ ප්‍රතිචාර සම්බන්ධයෙන් අයවැයකරණය සකස් කිරීම පිළිබඳ සාකච්ඡාකිරීම.
- ලෝක ආහාර සංවිධානය හා ශ්‍රී ලංකා රජය අතර අවබෝධතාවය පිළිබඳව උපාය මාර්ග සැලැස්ම 2018 – 2022 සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

### 3.10.5.7 සෞඛ්‍ය

- ''පෝෂණය සඳහා වැය කරන රජයේ පිරිවැය'' යන මැයෙන් වන අධ්‍යයනය සිදු කිරීම සඳහා අදාළ රජයේ ආයතන සම්බන්ධීකරණය කරන ආයතනය ලෙස කටයුතු කරන ලදී. ඒ සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් 2018 ඔක්තෝබර් මස 05 වන දින විවිධ පාර්ශවකරුවන් කැඳවා රැස්වීමක් පවත්වන ලදී.

- ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රතිපත්තිය සැකසීම සඳහා සෞඛ්‍ය, දේශීය වෛද්‍ය හා පෝෂණ අමාත්‍යාංශයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

## 3.10.6 විමධ්‍යගත අයවැය වැඩසටහන

ජාතික ලැයිස්තු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන කළමනාකරණය කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් තාක්ෂණික සහාය ලබා දෙයි. මෙම වැඩසටහන යටතේ 2018 වර්ෂය සඳහා රුපියල් මිලියන 290 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ( එක් මන්ත්‍රීවරයෙක් සඳහා රුපියල් මිලියන 10 බැගින් )2018 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් රුපියල් 278,770,881ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 1806 ක් අනුමැතිය සඳහා නිර්දේශ ලබා දී ඇත.

## 3.10.7 පරිපාලනය

### 3.10.7.1 ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය

| සේවා මට්ටම | 2018.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය | 2018.12.31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය | 2018.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව | 2018.12.31 දිනට අතිරික්ත කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 59 | 47 | 12 | - |
| තෘතීය මට්ටම | 02 | - | 02 | - |
| ද්විතිය මට්ටම | 27 | 13 | 14 | - |
| ප්‍රාථමික මට්ටම | 29 | 25 | 04 | - |

වගු අංක 3.10: 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය




**ප්‍රස්තාර අංක 3.7: 2018.12.31 දිනට ධාරිතා වර්ධන වැඩසටහන්හි ප්‍රගතිය**

| අංශය | ව්‍යාපෘති ඇගයීම (2018.12.31 දිනට) | | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා(2018.12.31) | |
|---|---|---|---|---|
| | ඇගයීම්සඳහා ලැබුණු ව්‍යපෘති යෝජනා ගණන | ඇගයීම්කරන ලද ව්‍යපෘති යෝජනා ගණන | නිර්දේශඅපේක්ෂිතව ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ගණන | නිර්දේශඉදිරිපත් ලදඅමාත්‍යමණ්ඩල පත්‍රිකා ගණන |
| කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, පශුසම්පත් හා ධීවර | 65 | 65 | 36 | 36 |
| කර්මාන්ත හා වෙළඳ, විදුලි බල හා බලශක්ති, සංචාරක, ජාත්‍යාන්තර වෙළඳාම, කම්කරු | 178 | 178 | 12 | 12 |
| මහාමාර්ග, වරාය, සිවිල් ගුවන් සේවා හා ප්‍රවාහන | 29 | 28 | 11 | 11 |
| නිවාස නාගරික සංවර්ධන හා ජල සම්පාදන, පරිසර හා ආපදා කලමනාකරණ | 390 | 313 | 26 | 26 |
| සාර්ව ආර්ථික අංශය | 45 | 45 | 01 | 01 |
| සෞඛ්‍ය දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික | 90 | 64 | 06 | 06 |
| අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන, තොරතුරු තාක්ෂණ, විද්‍යා තාක්ෂණ, ජනමාධ්‍ය හා තැපැල් | 79 | 79 | 14 | 14 |
| ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ | 84 | 84 | 21 | 21 |
| රාජ්‍ය කළමනාකරණ | 98 | 83 | 11 | 11 |
| එකතුව | 1058 | 939 | 138 | 138 |

**වගු අංක 3.11: 2018.12.31 දිනට ලැබී ඇති ව්‍යාපෘති යෝජනා හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධයෙන්වූ ප්‍රගතිය**

### 3.10.7.3 මූල්‍ය කාර්ය සාධනය -2018

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නියමිත මූල්‍ය ප්‍රකාශනවල සඳහන් පරිදි වෙන් කරන ලද ප්‍රතිපාදන සහ මුළු වියදම, පුනරාවර්තන සහ මූලධන වශයෙන් පහත පරිදි සාරාංශ කළ හැක.

| වැඩසටහනෙහි නම | උප ව්‍යාපෘතිය | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | මුළු ප්‍රතිපාදනය (රු.) | සත්‍ය වියදම (රු.) | වියදමෙහි ප්‍රතිශතය (%) | මුළු ප්‍රතිපාදනය (රු.) | සත්‍ය වියදම (රු.) | වියදමෙහි ප්‍රතිශතය (%) |
| | | | | | | | |
| පුනරාවර්තන | | 85,222,000 | 82,820,601 | 97.18 | 97,000,000 | 88,462,086 | 91.20 |
| මූලධන | | 10,223,000 | 6,273,910 | 61.37 | 12,000,000 | 6,523,012 | 54.36 |
| **උප එකතුව** | | **95,445,000** | **89,094,511** | **93.35** | **109,000,000** | **94,985,098** | **87.14** |
| මූලධන | 17 | | | | | | |
| **(PPPF) විදේශ ණය (12)**<br>**(PPPF) දේශීය අරමුදල් (17)** | | - | - | - | 100,000,000<br>2,000,000 | 25,713,327<br>1,375,948 | 25.71<br>68.80 |
| **උප එකතුව** | | | | | **102,000,000** | **27,089,275** | **26.56** |
| | | | | | | | |
| මුළු එකතුව | | **95,445,000** | **89,094,511** | **93.35** | **211,000,000** | **122,074,374** | **57.86** |

වගු අංක **3.12:** මූල්‍ය කාර්ය සාධනය -2018

# 04 පරිච්ඡේදය
## නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන අංශයෙහි කාර්යසාධනය

### 4.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සංක්ෂිප්තව

දශක තුනක් පුරා රට තුළ පැවති අභ්‍යන්තර ගැටුම්කාරී තත්වය අවසන් වීමෙන් පසු මුදාගත් ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු 2009 වසරේදී නැවත ආරම්භ විය. මීට අමතරව 20,000 ක් පමණ වූ තවත් පුද්ගලයින් සඳහා යාපනය, වව්නියාව, මන්නාරම යන ප්‍රදේශයන්හි පිහිටුවා තිබූ සුභසාධන මධ්‍යස්ථානවල නවාතැන් පහසුකම් සලසා දෙන ලදී. මේ වන විට අවතැන්ව සිටි සම්පූර්ණ පවුල් සංඛ්‍යාව 83,000 ක් පමණ වූ මෙම පවුල්වල මානුෂීය අවශ්‍යතා සහ අනෙකුත් කටයුතු ඉන්දීය රජය, එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන හා වෙනත් රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව සපුරාලීම සඳහා අවශ්‍ය පියවර රජය විසින් ගන්නා ලදී. එමෙන්ම සෙවිලි තහඩු, සිමෙන්ති, කෘෂි උපකරණ, හා මුළුතැන්ගෙයි උපකරණ ඉන්දීය රජය විසින් සපයා දෙන ලදී. තවද තාවකාලික පැල්පත් නිවාස, පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම්, අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම්, ළමා රක්ෂණ වැඩපිළිවෙල යනාදියට අවශ්‍ය ආධාර එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන විසින් සුභසාධන මධ්‍යස්ථාන වෙත සපයා දෙන ලදී. නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් ස්ථාපනය කරන ලද සුභසාධන මධ්‍යස්තානයන්හි පදිංචිව සිටි අවතැන් වූ ජනතාවට ලබාදෙන ලද සේවාවන්හි ගුණාත්මකභාවය ජාත්‍යන්තර ප්‍රමිතින්ට ද අනුකූලව පැවතිනි. 2009 දී ශ්‍රී ලංකාවේ සංචාරයකට පැමිණි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බැන්කීමූන් මහතාද මේ බව සනාථ කළේය. ආහාර, සනීපාරක්ෂක පහසුකම්, අධ්‍යාපනය, වෛද්‍ය පහසුකම්, සන්නිවේදන පහසුකම්, බැංකු පහසුකම් ඇතුළු සියලු මානුෂීය ආධාර අවතැන් වූ ජනතාවට ලබා දෙමින් ගෞරවාන්විතව හා අභිමානයෙන් යුතුව ඔවුන් වෙත සංග්‍රහ කරන ලදී. අවුරුදු 04 ක් වැනි කෙටි කාලයක් තුළ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් පවුල් 222,313 ක් නැවත පදිංචි කර 2012 සැප්තැම්බර් 25 වන දින මැණික්ෆාම් සහන ගම්මානය ඇමීමට කටයුතු කෙරිණි

2018 දෙසැම්බර් මස 31 වන දින වන විට උතුරු පළාත් පවුල් 167,137 කට අයත් පුද්ගලයින් 546,100 ක් ද නැගෙනහිර පළාතේ පවුල් 91,275 කට අයත් පුද්ගලයින් 337,085 ක් ද නැවත පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීමට අමාත්‍යාංශයට හැකි විය. සමස්ථයක් වශයෙන් ගත් කළ මෙම අමාත්‍යාංශය විසින් පවුල් 258,412 ක පුද්ගලයින් 883,185 ක් 2018 දෙසැම්බර් මස 31 වන දින වන විට උතුරු හා නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කරනු ලැබ ඇත.

30 වසරක අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් අවතැනු වූ ජනතාවගේ 97% ක් පමණ ඉතා කෙටි කාලයක් තුළ (අවුරුදු 3) නැවත පදිංචි කිරීමට හැකිවීම ශ්‍රී ලංකා රජයේ සුවිශේෂී සාධනීය මට්ටම පෙන්නුම් කරයි. එමෙන්ම දැනට ශ්‍රී ලංකාව තුළ සුභසාධන මධ්‍යස්ථාන පිහිටා අත්තේ යාපනය දිස්ත්‍රික්කය තුළ පමණි. 2018 දෙසැම්බර් මස 31 වන දින වන විට නැවත පදිංචි කිරීම සඳහා තවදුරටත් ඉතිරිව ඇත්තතේ පවුල් 10,509 කට අයත් පුද්ගලයින් 35,926 ක් පමණි.



### 4.1.1 නැවත පදිංචි කිරීම - උතුරු හා නැගෙනහිර පළාත

2018 දෙසැම්බර් මස 31 දින වන විට උතුරු හා නැගෙනහිර පළාත්හි අවතැන් වූ පවුල් 258,336 ක පුද්ගලයින් 882,280 ක් නැවත පදිංචි කිරීම සිදුකර ඇත.

| අනු අංකය | පළාත | නැවත පදිංචි කිරීම | |
|---|---|---|---|
| | | පවුල් | පුද්ගලයින් |
| 01 | නැගෙනහිර | 91,275 | 337,085 |
| 02 | උතුර | 167,137 | 546,100 |
| එකතුව | | **258,412** | **883,185** |

වගු අංක **4.1:** උතුරු සහ නැගෙනහිර පළාත්හි නැවත පදිංචි කිරීම (2018දෙසැම්බර් මස 31)

### 4.1.2 උතුරු පළාත

උතුරු පළාතේ දිස්ත්‍රික්ක තුළ 2018 දෙසැම්බර් මස 31 දිනට නැවත පදිංචි කරන ලද පවුල් හා පුද්ගලයින් පිළිබඳ විස්තර පහත ප්‍රස්ථාර මඟින් දැක්වේ.පහත අංක 4.1 ප්‍රස්තාරය මඟින් යාපනය දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ පවුල් 34,391 ක පුද්ගලයින් 109,678 ක් පිළිබඳ දත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පෙන්වා ඇත.




ප්‍රස්ථාර අංක **4.1:** නැවත පදිංචි කිරීම - යාපනය දිස්ත්‍රික්කය (2018දෙසැම්බර් මස 31)

පහත අංක 4.2 ප්‍රස්ථාරය මඟින් මන්නාරම දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ පවුල් 27,668 ක පුද්ගලයින් 100,126 ක් පිළිබඳ දත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පෙන්වා ඇත.




ප්‍රස්ථාරය අංක **4.2** :නැවත පදිංචි කිරීම - මන්නාරම දිස්ත්‍රික්කය (2018දෙසැම්බර් මස 31)

පහත 4.3 ප්‍රස්ථාරය මඟින් වවුනියාව දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ පවුල් 15,397 ක පුද්ගලයින් 55,203 ක් පිළිබඳ දත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පෙන්වා ඇත




ප්‍රස්ථාරය අංක **4.3**:නැවත පදිංචි කිරීම වවුනියාව දිස්ත්‍රික්කය (**2018** දෙසැම්බර් මස **31**)

පහත අංක 4.4 ප්‍රස්ථාරය මඟින් මුලතිව් දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ පවුල් 44,120 ක පුද්ගලයින් 136,623 ක් පිළිබඳ දත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පෙන්වා ඇත.




ප්‍රස්ථාර අංක **4.4** :නැවත පදිංචි කිරීම - මුලතිව් දිස්ත්‍රික්කය (**2018** දෙසැම්බර් මස **31**)

පහත අංක 4.5 ප්‍රස්ථාරය මඟින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ පවුල් 45,561 ක පුද්ගලයින් 144,470 ක් පිළිබඳ දත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පෙන්වා ඇත.




ප්‍රස්ථාර අංක **4.5**:නැවත පදිංචි කිරීම - කිලිනොච්චි දිස්ත්‍රික්කය (**2018** දෙසැම්බර් මස **31**)

### 4.1.3 නැගෙනහිර පළාත

2018 දෙසැම්බර් මස 31 දින වන විට නැගෙනහිර පලාතේ මඩකලපුව දිස්ත්‍රික්කය තුළ අවතැන් වූ පවුල් 37,096 ක පුද්ගලයින් 127,226 දෙනෙකු, අම්පාර දිස්ත්‍රික්කය තුළ අවතැන් වූ පවුල් 18,310 ක පුද්ගලයින් 71,286 දෙනෙකු සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ අවතැන් වූ පවුල් 35,869 ක පුද්ගලයින්

138,573 ක් නැවත පදිංචි කරවන ලදී. නැගෙනහිර පළාතේ එක් එක් දිස්ත්‍රික්ක තුළ 2018 දෙසැම්බර් මස 31 දිනට නැවත පදංචි කරන ලද පවුල් හා පුද්ගලයින් පිළිබඳ දත්ත පහත ප්‍රස්ථාර මඟින් දැක්වේ.

පහත අංක 4.6 ප්‍රස්ථාරය මඟින් මඩකළපුව දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ පවුල් 37,096 ක පුද්ගලයින් 127,226 ක් පිළිබඳ දත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පෙන්වා ඇත.




ප්‍රස්ථාර අංක **4.6 :**නැවතපදිංචි කිරීම - මඩකලපුව දිස්ත්‍රික්කය (2018 දෙසැම්බර් මස 31)

පහත අංක 4.7 ප්‍රස්ථාරය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ පවුල් 35,869 ක පුද්ගලයින් 138,573 ක් පිළිබඳ දත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පෙන්වා ඇත.




ප්‍රස්ථාර අංක **4.7:** නැවත පදිංචි කිරීම - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය (2018 දෙසැම්බර් මස 31)

පහත අංක 4.8 ප්‍රස්ථාරය මඟින් අම්පාර දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ පවුල් 18,310 ක පුද්ගලයින් 71,286 ක් පිළිබඳ දත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පෙන්වා ඇත.




ප්‍රස්ථාර අංක **4.8** :නැවත පදිංචි කිරීම - අම්පාර දිස්ත්‍රික්කය (2018 දෙසැම්බර් මස 31)

### 4.1.4 නැවත පදිංචි කිරීමට අපේක්ෂිත අවතැන් වූ පවුල් හා පුද්ගලයින්

2018 දෙසැම්බර් මස 31 දින වන විට උතුරු හැ නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් වාර්තා කර ඇති දත්තවලට අනුව තවදුරටත් ඥාති හිත මිතුන් සමඟ හා සුභසාධන මධ්‍යස්ථාන වල සිටින පවුල් 10,509 ක පුද්ගලයින් 35,926 ක් නැවත පදිංචිය අපේක්ෂාවෙන් සිටිති. දිස්ත්‍රික්ක අනුව නැවත පදිංචි වීමට අපේක්ෂාවෙන් සිටින පවුල් පිළිබඳ තොරතුරු වගු සහ ප්‍රස්ථාර අංක 1.2.1 මඟින් පහත දැක්වේ.

| පළාත | දිස්ත්‍රික්ක | ස්ථානය | ස්ථානය | | | පවුල් | පුද්ගලයින් |
|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | ද්‍රවිඩ | මුස්ලිම් | | |
| උතුර | යාපනය | සුභසාධන මධ්‍යස්ථාන වල | -- | 627 | -- | **627** | **2216** |
| | | ඥාති හිත මිතුන් සමඟ | -- | 7,523 | 1,465 | 8,988 | 31,101 |
| | **එකතුව** | | -- | **8,150** | **1,465** | **9,615** | **33,317** |
| | කිලිනොච්චිය | ඥාති හිත මිතුන් සමඟ | - | 440 | -- | 440 | 1367 |
| | මන්නාරම | -එම- | - | -- | - | - | - |
| | වව්නියාව | -එම- | -- | 15 | -- | 15 | 44 |
| | මුලතිව් | -එම- | -- | 68 | -- | 68 | 188 |
| **උතුරු පළාතේ මුළු එකතුව-(1)** | | | - | **8,673** | **1,465** | **10,138** | **34,916** |
| **නැගෙනහිර** | ත්‍රිකුණාමලය | සුභසාධන මධ්‍යස්ථාන වල | -- | -- | -- | - | - |
| | | ඥාති හිත මිතුන් සමඟ | 17 | 46 | 177 | 240 | 557 |
| | මඩකලපුව | ඥාති හිත මිතුන් සමඟ | 36 | 77 | 18 | 131 | 453 |
| | අම්පාර | | -- | -- | -- | 0 | 0 |
| **නැගෙනහිර පළාතේ මුළු එකතුව-(2)** | | | 53 | 123 | 195 | 371 | 1010 |
| **මුළු එකතුව 1+2** | | | 53 | **8,796** | **1,660** | **10,509** | **35,926** |

වගු අංක **4.2:** නැවත පදිංචි කිරීමට අපේක්ෂිත අවතැන් වූ පවුල් හා පුද්ගලයින්

### 4.1.5 2018 දෙසැම්බර් මස 31 දිනට ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකීය සම්භවයක් සහිත සරණාගත පිරිස් යළි පැමිණීම

උතුරු හා නැගෙනහිර පළාත්හි පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරව ඉන්දියාව බලාගැය සරණාගත පිරිස් යළි ශ්‍රී ලංකාවට පැමිණීම නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ස්වේච්ඡා පදනමින් සිදුවෙමින් පවතී. 2011 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් මස 31 වන දින වන විට සරණාගත පවුල් 3,001 ක පුද්ගලයින් 7,818 ක් යළි දිවයිනට පැමිණ ඇත

එම පිරිස් යලි දිවයිනට පැමිණීමේදී කටනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේදී පහසුක්ම ලබාදීමට සහ අවශ්‍ය මඟපෙන්වීම සිදු කිරීමට නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ නිළධාරීන් මෙන්ම එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ නිළධාරින් ද සූදානමින් සිටී

මෙලෙස ස්වේච්ඡා පදනමින් යළි පෙරෙලා දිවයිනට පැමිණෙන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති සරණාගතයින් සඳහා ගුවන් බලපත් චෙන්නායිහි පිහිටා ඇති ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ සහය ඇතිව නොමිලේ ලබා දෙන අතර ගුවන් ටිකට් පතද නොමිලේ ලබාදීමට කටයුතු කර ඇත

මෙයට අමතරව නැවත පදිංචි කිරීම සඳහා වයස අවරුදු 18ට වැඩි පුද්ගලයෙකුට රු. 10,000.00 ක් සහ වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙක්ට රු. 7500.00 ක දීමනාවක් ප්‍රවාහන වියදම් වශයෙන් රු. 2,500.00 ක මුදලක් හා නැවත පදිංචි කිරීමේදී එක් පවුලකට රු. 10,000.00 ක මුදලක්ද පවුලේ එක් පුද්ගලයෙකු පැමිණේ නම් රු. 5000.00 ක මුදලක්ද සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ (UNHCR) අනුග්‍රහයෙන් ලබාදෙනු ලැබේ එමෙන්ම එසේ පැමිණෙන එක් පවුලක් සඳහා ආහාර සලාකයක් ලෙස රු.5000.00 ක මුදලක් ද මෙම අමාත්‍යාංශය විසින් ලබාදෙනු ලැබේ.

මෙසේ දිවයිනට පැමිණෙන සරණාගයින් පිළිගනිමින් ඔවුන් ගෞරවාන්විතව නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය කටයුතු මෙහෙයවීම නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන හා හින්දු කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මඟින් සිදු කරමින් පවතී.

| අ. අංකය | වර්ෂය | පවුල් | පුද්ගලයින් |
|---|---|---|---|
| 01 | 2011 | 557 | 1728 |
| 02 | 2012 | 453 | 1291 |
| 03 | 2013 | 273 | 718 |
| 04 | 2014 | 137 | 338 |
| 05 | 2015 | 208 | 453 |
| 06 | 2016 | 326 | 852 |
| 07 | 2017 | 487 | 1170 |
| 08 | 2018 | 560 | 1268 |
| | **එකතුව** | 3,001 | 7,818 |

වගු අංක **4.3:** ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකීය සම්භවයක් සහිත සරණාගත පිරිස් යළි පැමිණීම 2018-12-31

### 4.1.6 සංවර්ධන ව්‍යාපෘති - 2018

උතුරු හා නැගෙනහිර පළාත්වල දශක 03 කට අධික කාලයක් පුරා පැවතුන අභ්‍යන්තර ගැටුම්කාරි වතාවරණය හේතුවෙන් තම මුල් ගම් බිම් අහිමිව අවතැන් වූ ජනතාවගේ නැවත පදිංචි කිරීමේ කටයුතුවලට අදාළ 2018 වර්ෂයට නිර්දේශිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා නැවත පදිංචිය අපේක්ෂාවෙන් සහන මධ්‍යස්ථානවල හා ඥාති හිතමිත්‍රාදින් සමග වෙසෙන ජනතාවගේ සුභ සාධන සේවා සැපයීම සඳහා නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 9,000 ක ප්‍රතිපාදන 2018 වර්ෂයේ දී හිමි විය.

මෙහිදී එක් එක් දිස්ත්‍රික්කය තුළ අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අවතැන්වූ පවුල්වල අවශ්‍යතාවයන් ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් හඳුනාගෙන එම තොරතුරු අමාත්‍යාංශය විසින් සකස් කරන ලද මග පෙන්වීම් යටතේ අවශ්‍ය ප්‍රතිලාභීන් දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගනු ලබයි. මෙහිදී ගැටුම්කාරි වාතාවරණය යටතේ ආබාධිතවූවන් සිටින පවුල්, කාන්තා මූලික පවුල්, අඩු ආදායම්ලාභී පවුල්, පුනරුත්ථාපනය කර සමාජගත කරනු ලැබූ පුද්ගලයින් සහිත පවුල් හා සුභසාධන මධ්‍යස්ථානයන්හි රැඳී සිටින පවුල් මෙන්ම නෑදෑ හිතමිතුරන් සමග සිටින පවුල් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදී ඇත. ඒ අනුව අමාත්‍යාංශය විසින් ලබා දී ඇති නිර්ණායක වලට පදනම්ව ප්‍රතිලාභීන් තෝරා ගැනීම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඍජු මැදිහත්වීම මත බිම් මට්ටමේ සිට සිදු කරනු ලැබේ. එසේ ලබා ගන්නා තොරතුරු අමාත්‍යංශ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් කරනු ලබන ක්ෂේත්‍ර නිරීක්ෂණ මගින් ද සනාථ කිරීමට කටයුතු කරනු ලැබේ. තවද එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යාංශ නිළධාරින් විසින් ද යම් යම් අදියරයන් හිදී අධීක්ෂණය කරනු ලබන අතර, එහිදී හඳුනා ගනු ලබන ගැටළු හෝ බාධාවන් වේ නම් ඒ සඳහා පිළියම් යෙදීමට ද කටයුතු කරනු ලැබේ.



| අංකය | ක්‍රියාකාරකම් | ඒකක ප්‍රමාණය | ප්‍රතිපාදන (රු. මිලියන) | වියදම |
|---|---|---|---|---|
| 01 | කුඩා වාරි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 59 | 100.00 | 71.72 |
| 02 | ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති | 1763 | 150.00 | 145.09 |
| 03 | අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති | 6 | 11.00 | 11.00 |
| 04 | සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන ව්‍යාපෘති | 5056 | 300.00 | 298.33 |
| 05 | පානීය ජල ව්‍යාපෘතිය | 2708 | 75.00 | 65.96 |
| 06 | ගෘහස්ථ විදුලි සැපයුම් ව්‍යාපෘතිය | 3304 | 64.00 | 62.01 |
| 07 | ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති (යුද්ධය හේතුවෙන් වැන්දඹු වුවන් සඳහා) | 1811 | 178.70 | 173.20 |
| 08 | සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතිය (යුද්ධය හේතුවෙන් වැන්දඹු වුවන් සඳහා) | 637 | 48.05 | 46.73 |
| 09 | පානීය ජල ව්‍යාපෘතිය (යුද්ධය හේතුවෙන් වැන්දඹු වුවන් සඳහා) | 674 | 22.00 | 20.57 |
| 10 | ඉරණතිව් නැවත පදිංචි කිරීම | 03 | 0.90 | 0.90 |
| 11 | නිෂ්පාදන සමුපකාර සමිති හරහා තෝරා ගත් කුඩා පරිමාන කර්මාන්ත නගා සිටුවීමට ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය | | 1000.00 | 430.46 |
| 12 | ණය දෙන සමුපකාර සමිති හරහා ණය ගැතිභාවයට පත් පවුල් ණය බරින් මුදවාලීම සඳහා ආධාර ලබා දීමේ ව්‍යාපෘතිය | | 1000.00 | 542.5 |
| 13 | උතුරු මුහුදු ව්‍යාපෘතියේ කටයුතු | | 3.5 | 3.5 |
| 14 | බිම් බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘති | | 26.00 | 26.00 |
| 15 | පලාලි නැවත පදිංචි කිරීමේ විශේෂ ව්‍යාපෘතිය | | 51.44 | 51.44 |
| 16 | හින්දු පුජනීය ස්ථාන පුනරුත්ථාපන කටයුතු | | 31.5 | 29.75 |
| 17 | මාන්කුලම් විශේෂ ව්‍යාපාතිය | | 5.00 | 5.00 |
| 18 | නැවත පදිංචි කිරීමේ විශේෂ ව්‍යාපෘති | | 71.88 | 70.9 |
| **එකතුව** | | | **3138.97** | **2055.06** |

වගු අංක **4.4 : 2018** වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ ප්‍රතිපාදන

## 4.2 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය

### 4.2.1 දැක්ම

ජාතික සංහිඳියාව, සාමය, සෞභාග්‍ය පිරි නීති ගරුක සමාජයක් කරා.

### 4.2.2 මෙහෙවර

නොමගිය කාන්තා, පිරිමි, ළමා හා ඔවුන්ගේ පවුල් ඒකක, පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළින් හා විවිධ ප්‍රතිකාර ක්‍රමවේදයන් මගින් ඔවුන්ගේ අයිතීන් සහ සංස්කෘතික වටිනාකම් සුරක්ෂිත කරමින් සමාජීය, ආර්ථික සංවර්ධනය ඵලදායි කිරීම තුළින් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම.

### 4.2.3 හැඳින්වීම

වසර තිහක යුද්ධය අවසානයේ රජයට භාරවූ හා අධිකරණ නියෝග මත යොමුකරන ලද නොමගගිය සටන්කරුවන් හා අන්තරායකර ඖෂධ සම්බන්ධ වැරදිකරුවන් පුනරුත්ථාපනය කොට සමාජයට වැඩදායි පුද්ගලයින් ලෙස සමාජගත කිරීමේ ක්‍රියාවලිය මෙම කාර්යාංශය මගින් සිදු කරනු ලබයි.

මෙම පුනරුත්ථාපනලාභීන්ගේ පුනරුත්ථාපන කාලසීමාවන වසරක් වන අතර මුලි මාස 6 ක කාලය තුල මූලික පුනරුත්තාපන ක්‍රියාවලිය සිදු කර ඉන් අනතුරුව උපදේශන ක්‍රියාවලියක් සමග වෘත්තීය පුහුණුව සඳහා යොමු කරනු ලබයි.

එසේම පුනරුත්ථාපන කාලය අවසන් වී සමාජගත වීමෙන් අනතුරුවද ඔවුන්ගේ ඉදිරි ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය පසුබිම මෙම කාර්යාංශය යටතේ ස්ථාපිත පශ්චාත් පුනරුත්ථාපන ප්‍රතිශ්‍යාධාර ශාඛාව හරහා සිදු කරනු ලබයි.

### 4.2.4 අරමුණු හා පරමාර්ථ

පුනරුත්ථාපනලාභීන්ගේ ආර්ථික, සමාජීය හා අධ්‍යාපන මට්ටම අනුව යුධ මානසිකත්වයෙන් හා අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඈත්වීම සඳහා සහය වීම හා මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රම තුළින් චර්යාත්මක වෙනසකට භාජනය කිරීම.

ඔවුන්ගේ ජීවන වටපිටාව හා වාතාවරණය වෙනස් කිරීම තුලින් සටන්කාමීත්වයෙන් හා අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවීමෙන් මොවුන් මුදවා ගැනීම.

සමාජගත වීමෙන් පසු රැකියා අවස්ථාවන් උදාකර ගැනීමට හැකිවන පරිදි වෘත්තීය දැනුම ලබාදීම.

පවුල් සංස්ථාව ශක්තිමත් කිරීම, එහි වැදගත්කම, ද්වී පාර්ශවීය වැදගත්කම අවබෝධ කර දීම හා පවුල් සංස්ථාව පවත්වාගේන යාම සඳහා අවශ්‍ය වන්නා වූ ආර්ථික, සමාජීය හා සුභසාධන කටයුතු නගා සිටුවීම.

### 4.2.5 පුනරුත්ථාපනලාභීන් මධ්‍යස්ථානය වෙත යොමු කිරීම

4.5.1 අධිකරණ නියෝග මගින් පුනරුත්තාපනය සඳහා පැමිණෙන නොමගගිය සටන්කරුවන් හා අන්තරායකර ඖෂධ සම්බන්ධ වැරදිකරුවන් 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා පහත සඳහන් පරිදි පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත යොමු කර සමාජගත කර ඇත.

| විස්තරය | පුනරුත්ථාපනයට යොමු කල සංඛ්‍යාව | සමාජගත කල සංඛ්‍යාව |
|---|---|---|
| නොමගගිය සටන්කරුවන් | 2 | 9 |
| අන්තරායකර ඖෂධ සම්බන්ධ වැරදිකරුවන් | 1,848 | 630 |

වගු අංක 4.5: පුනරුත්ථාපනලාභීන් මධ්‍යස්ථානය වෙත යොමු කිරීම

| විස්තරය | පුනරුත්ථාපන මධ්‍යස්ථානය | අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| නොමගගිය සටන්කරුවන් | ආරක්ෂක නවාතැන්දීමේ හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - පූන්තෝට්ටම් | 1 |
| අන්තරායකර ඖෂධ සම්බන්ධ වැරදිකරුවන් | ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු | 1,317 |
| | තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර | 482 |

වගු අංක 4.6 මේ වන විට පුනරුත්ථාපන මධ්‍යස්ථානය තුල සිටින අභ්‍යාසලාභීන් සංඛ්‍යාව

### 4.2.6 ක්‍රියාකාරකම්

#### 4.2.6.1 නොමගගිය සටන්කරුවන් සඳහා වූ පුනරුත්ථාපන ක්‍රියාකාරකම්

මෙම පුනරුත්තාපනලාභීන් සඳහා මෙම වර්ෂය තුළ පහත සඳහන් පරිදි ක්‍රියාකාරකම් සිදු කර ඇත.




ප්‍රස්තාර අංක 6.9: පුනරුත්ථාපනලාභීන් සඳහා සිදු කල වැඩසටහන්





වැඩසටහන් සඳහා සහභාගී වන පුනරුත්ථාපනලාභීන්

නොමගිය සටන්කරුවන්ගේ පුනරුත්ථාපන ක්‍රියාකාරකම් සඳහා වූ මූල්‍ය ප්‍රගතිය




වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල - රු.36,200,000.00

පුනරුත්ථාපනය සඳහා ඇස්තමේන්තුගත ගත සංඛ්‍යාව - 50

පසු විපරම් කටයුතු සඳහා ඇස්තමේන්තුගත ගත සංඛ්‍යාව - 12.182

වසරේ මධ්‍යස්ථානය වෙත ඇතුලු වූ පුනරුත්ථාපනලාභීන් ගණන - 2

සමාජ ගත කළ පුනරුත්ථාපනලාභීන් ගණන - 9

වසර තුළ පුනරුත්ථාපන ක්‍රියාවලිය වෙනුවෙන් වැයදැරීම - රු.35,286,823.85

ප්‍රස්තාර අංක 4.10: පුනරුත්තාපන ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය

## 4.2.6.2 අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන් සඳහා වූ පුනරුත්ථාපන ක්‍රියාකාරකම්

මෙම පුනරුත්ථාපනලාභීන් සඳහා වර්ෂය තුල පහත සඳහන් පරිදි ක්‍රියාකාරකම් සිදු කර ඇත.




ප්‍රස්තාර අංක 4.11: පුනරුත්ථාපනලාභීන් සඳහා සිදු කල වැඩ

වෘත්තීය පුහුණුව සඳහා තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලබන අතර එහිදී පුනරුත්ථාපන වැඩසටහන් සමග සිදු කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවන් පහත සඳහන් පරිදි වේ.

| අ/අ | වෘත්තීය පුහුණු පාඨමාලා | සහභාගීවූ අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | NVQ III මට්ටමේ පාඨමාලා (වඩු කාර්මික, වැද්දුම් ශිල්පී, ජලනල කාර්මික , ගෘහස්ත විදුලි කාර්මික, පෙදරේරු ) | 543 |
| 2 | සහතික පත්‍ර පාඨමාලා ( මැහුම්, පරිඝනක, භොජනාගාර සහායක) | 80 |
| 3 | එකතුව | 623 |

වගු අංක 4.7: වෘත්තීය පුහුණු පාඨමාලාවන්





**අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපන ක්‍රියාකාරකම් සඳහා වූ මූල්‍ය ප්‍රගතිය**




වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල - **රු. 400,000,000.00**

පුනරුත්ථාපනය සඳහා ඇස්තමේන්තුගත සංඛ්‍යාව - **1,000**

පසු විපරම් කටයුතු සඳහා ඇස්තමේන්තුගත සංඛ්‍යාව - **2,000**

වසරේ මධ්‍යස්ථානය වෙත ඇතුලු වූ පුනරුත්ථාපනලාභීන් ගණන - **1848**

සමාජ ගත කළ පුනරුත්ථාපනලාභීන් ගණන - **630**

වසර තුළ පුනරුත්ථාපන ක්‍රියාවලිය වෙනුවෙන් වැයදැරීම-

**රු. 390.175.786.75**

ප්‍රස්තාර අංක **4.12:** පුනරුත්ථාපන ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය

## 4.2.7 සමාජගත වූ අභ්‍යාසලාභීන්ගේ පසු විපරම් කටයුතු සිදු කිරීම

### 4.2.7.1 නොමගිය සටන්කරුවන්

නොමගිය සටන්කරුවන් 2009 වර්ෂ මානුෂීය මෙහෙයුමෙන් පසුව රජයට භාර වූ හා අධිකරණ නියෝග මත යොමු කරන ලද අයවලුන් පුනරුත්ථාපනය කර ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටු වීමේ අරමුණින් පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සමාජයීය හා සුභසාධන කටයුතු නන්වාලීම සඳහා සම්බන්ධීකරණ කාර්යාල 8ක් පිහිටුවා ඇත.

| මාසය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සංඛ්‍යාව | **95** | **180** | **164** | **147** | **137** | **62** | **322** | **490** | **374** | **307** | **334** | **310** | **2922** |

වගු අංක **4.8:** නොමගිය සටන්කරුවන්ගේ පසුවිපරම් කටයුතු

| අ/අ | දිස්ත්‍රික් පසුවිපරම් කාර්යාල | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | යාපනය | 323 |
| 2 | කිලිනොච්චිය | 312 |
| 3 | මන්නාරම | 500 |
| 4 | ත්‍රිකුණාමලය | 339 |
| 5 | වව්නියාව | 167 |
| 6 | මඩකලපුව | 2078 |
| 7 | **එකතුව** | **3,719** |

වගු අංක **4.9:** 2018 වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් විස්තරය

### 4.2.7.2 අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන්

අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමෙන් පසු විධිමත් සැලැස්මකට අනුව ඔවුන්ගේ පසුවිපරම් ක්‍රියාවලිය තුල කාර්යාල ස්ථාපිත කර එම කාර්යාල 05 යටතේ ක්‍රියාත්මක කර ඇත.

| දිස්ත්‍රික් පසුවිපරම් කාර්යාල 05 යටතේ සිදු කල පසුවිපරම් ක්‍රියාවලිය | අන්තරායතකර මත්ද්‍රව්‍ය භාවිතා නොකරන | | නැවත අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන් | | | පසුවිපරමේදී හඳුනානොගත් | | කාර්යාලීය වශයෙන් පසුවිපරම සිදු කර ඇති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | කිසිදු මත්ද්‍රව්‍යයක් භාවිතා නොකරන | මත්පැන් හා දුම්වැටි පමණක් භාවිතා කරන | නැවත අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන් | නැවත සිරගතවූවන් | නැවත පුනරුත්ථාපනයට යොමුවූවන් | ලිපිනයේ පදිංචිකරුවන් නොසිටි/ලිපිනය සොයාගත නොහැකි | මියගිය | |
| මුළු එකතුව | 508 | 487 | 672 | 143 | 51 | 243 | 21 | 2125 |
| | 24% | 23% | 32% | 7% | 2% | 11% | 1% | 100% |

වගු අංක 4.10: අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමෙන් පසු පසුවිපරම් ක්‍රියාවලිය

සමාජගත වන පුනරුත්ථාපනලාභීන්ගේ ආර්ථික සමාජීය සුබසාධන කටයුතු සිදු කිරීම උදෙසා මෙන්ම ඔවුන්ගේ සුරක්ෂිතභාවය සඳහා විෂයගත විද්වත් නිලධාරීන්ගේ (ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තු නිලධාරීන්/ අන්තරායකර ඖෂධ පාලක ජාතික මන්ඩ නිලධාරීන් / සමාජ සේවා දෙපාර්තමේන්තු අදාල උපදේශන නිලධාරීන් / පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශයේ නිලධාරීන්ගේ) සහභාගීත්වයෙන් ග්‍රාම නිලධාරි හා මහජනතාව සඳහා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර 2018 වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් විස්තරය පහත පරිදි වේ.

| අ/අ | දිස්ත්‍රික් පසුවිපරම් කාර්යාලය | සහභාගීවූ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කොළඹ | 482 |
| 2 | කුරුණෑගල | 1450 |
| 3 | ගම්පහ | 945 |
| 4 | කළුතර | 831 |
| 5 | පුත්තලම | 364 |
| 7 | **එකතුව** | **4072** |

වගු අංක 4.11: ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්

### 4.2.8 සමාජගත කරන ලද නොමගගිය කටනුකරුවන් සඳහා ලබාදී ඇති ආධාර

| අ/අ | භාණ්ඩ | සංඛයාව | අ/අ | භාණ්ඩ | සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | පාපැදි | 376 | 8 | විදුලි උපකරණ | 10 |
| 2 | ධීවර දැල් | 268 | 9 | පැස්සුම් උපකරණ | 9 |
| 3 | මහන මැෂින් | 139 | 10 | මෝටර් කාර්මික උපකරණ | 9 |
| 4 | වතුර මෝටර් | 150 | 11 | ගරාජ් උපකරණ | 4 |
| 5 | පෙදරේරු ආයුධ කට්ටල | 35 | 12 | බෝට්ටු | 3 |
| 6 | සෙවිල් තහඩු | 30 | 13 | පරිඝණක යන්ත්‍ර | 2 |
| 7 | කරණවෑම් උපකරණ | 15 | 14 | කැමරා | 2 |
| 25 | කැමරා ෆැලැෂර් | 1 | 20 | කිරි ගවයින් | 35 |
| 16 | මුද්‍රණ යන්ත්‍ර | 1 | 21 | එළුවන් | 16 |
| 17 | තෙල් සිඳින යන්ත්‍ර | 1 | 22 | කුකුල් පැටවුන් | 222 |
| 18 | ටයර් ගලවන යන්ත්‍ර | 1 | 23 | ළදරු උපකරණ | 1 |
| 19 | බ්ලොග් ගල් මැෂින් | 1 | | | |

වගු අංක **4.12:** සමාජගත කරන ලද නොමගගිය කටනුකරුවන් සඳහා ලබාදී ඇති ආධාර



සමාජගත පුනරුත්ථාපනලාභීන් සඳහා භාණ්ඩ බෙදා දෙන අවස්ථාවන්

# 4.3 තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

## 4.3.1 පුනරුත්ථාපන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

1. බලවත් සේ විපතට පත් වුවන් සඳහා වන්දි ගෙවීම.
2. සාමාන්‍ය මහජන දේපළ වන්දි ගෙවීම.
3. රාජ්‍ය සේවකයන් සඳහා ඔවුන්ගේ විනාශ වු දේපළ වෙනුවෙන් වන්දි ගෙවීම.
4. අලාභහානි වු ආගමික ස්ථාන පිළිසකර කිරීම සඳහා වු සහනාධාර යෝජනා ක්‍රමය.
5. හානියට පත් නිවාස ඉදිකිරීම සහ අලුත්වැඩියා කර ගැනීමේ සහන ණය යෝජනා ක්‍රමය.
6. සාමාන්‍ය ජනතාව සඳහා ක්‍රියාත්මක ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය.
7. සමාජගත වු අභ්‍යාසලාභීන් වෙනුවෙන් වු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය.
8. ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන.
9. කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන්
10. ජංගම සේවා

## 4.3.2 වන්දි වැඩසටහන්

මෙම වන්දි ක්‍රම යටතේ ගෙවීම් සිදු කරනු ලබන්නේ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හා ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් මියගිය, තුවාල ලැබු සහ දේපළ හානියට පත් පවුල් වෙනුවෙනි. මේ යටතේ මහා භාණ්ඩාගාරය විසින් 2018 වසර සඳහා රු. 1,467,982,670.00 ක මුදලක් ලබා දුන් අතර, එම මුදලින් වන්දිලාභීන් 16221 කට ගෙවීම් කල අතර සහ ප්‍රතිලාභීන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් 1689 ක් වෙනුවෙන් පුහුණු වැඩසටහන් 35 ක් පවත්වන ලදී. ඊට අමතරව වන්දි වැඩසටහන් 14 ක් ද ක්‍රියාත්මක කරනු ලැබුණි. ලබාදුන් මුදල් ප්‍රතිපාදන අනුව මෙය 100% ක ප්‍රගතියකි.

| අනු අංකය | වැඩසටහන් | ගෙවු සංඛ්‍යාව | ගෙවු මුදල රු මිලියන |
|---|---|---|---|
| 1 | බලවත් සේ විපතට පත් වුවන් සඳහා වන්දි ගෙවීම. (මියගිය රජයේ හා සාමාන්‍ය පුද්ගලයන්) | 1852 | 155,912,475.00 |
| 2 | සාමාන්‍ය මහජන දේපළ වන්දි ගෙවීම. | 11135 | 854,763,957.00 |
| 3 | රාජ්‍ය සේවකයන් සඳහා ඔවුන්ගේ විනාශ වු දේපළ වෙනුවෙන් වන්දි ගෙවීම. | 2731 | 357,294,955.00 |
| 4 | හානියට පත් ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණ වැඩසටහන. | 503 | 95,383,980.00 |
| | එකතුව | **16221** | **1,463,355,367.00** |

වගු අංක 4.13: වැඩ සටහන්හි කාර්ය සාධනය







ප්‍රස්තාර අංක 4.13: වන්දි වැඩසටහන්

### 4.3.3 පුහුණු වැඩසටහන් සහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

**මේ යටතේ ප්‍රධාන වැඩසටහන් 03 ක් පුනරුත්ථාපන අධිකාරිය විසින් ක්‍රියාවට නන්වන ලදී.**

1. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්
2. ණය ප්‍රතිලාභීන්ගේ පුහුණු වැඩසටහන්
3. ජංගම සේවා සහ වන්දි ප්‍රදාන උත්සව වැඩසටහන්

2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා ඉහත වැඩ සටහන්හි කාර්ය සාධන පහත පරිදි වේ.

| අනු අංකය | වැඩසටහන් | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | ගෙවූ මුදල රුපියල් |
|---|---|---|---|
| 1 | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් | 242 | 1,276,736.00 |
| 2 | ණය ප්‍රතිලාභීන්ගේ පුහුණු වැඩසටහන් | 1562 | 2,202,584.00 |
| 3 | ජංගම සේවා සහ වන්දි ප්‍රදාන උත්සව වැඩසටහන් | 12 | 1,147,982.00 |

වගු අංක 4.14: වැඩ සටහන්හි කාර්ය සාධනය

### 4.3.4 ණය යෝජනා ක්‍රම

**පුනරුත්ථාපන අධිකාරිය හා ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන රාජ්‍ය බැංකු සමඟ ඒකාබද්ධව පහත ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ 2018 වසරේ දී ප්‍රතිලාභීන් 985 ක් වෙනුවෙන් රුපියල් මිලියන 212,915,000.00 ක ණය මුදලක් නිදහස් කර ඇත.**

| අනු අංකය | වැඩසටහන් | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල රු. මිලියන |
|---|---|---|---|
| 1 | සාමාන්‍ය ජනතාව සඳහා ක්‍රියාත්මක ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය. | 692 | 144,645,000 |
| 2 | සමාජගත වූ අභ්‍යාසලාභීන් වෙනුවෙන් වූ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය | 186 | 41,720,000 |
| 3 | හානියට පත් නිවාස ඉදි කිරීම සහ අලුත්වැඩියා කර ගැනීමේ සහන ණය යෝජනා ක්‍රමය | 107 | 26,550,000 |
| | එකතුව | **985** | **212,915,000** |

වගු අංක 4.15: ණය යෝජනා ක්‍රම







ප්‍රස්තාර අංක 4.14: ණය යෝජනා ක්‍රම



2018.04.05 වැනි දින මරණයට පත් සහ තුවාල ලැබුවන් වෙනුවෙන් කිලිනොච්චියේ පැවැති වන්දි **ප්‍රදානෝත්සවය.**





**2018.05.25, 26 සහ 2018.08.10,11 වැනි දිනවල ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ යාපනය සහ මඩකලපුවේ දී පැවැති වෙළඳ ප්‍රදර්ශනය.**



2018.04.06 වැනි දින විනාශ වු දේපළ වෙනුවෙන් මුලතිව් හි පැවැති වන්දි ප්‍රදානෝත්සවය.





**2018.04.07 වැනි දින විනාශ වු පූජණීය ස්ථාන වෙනුවෙන් මඩකලපුවේ දී පැවැති වන්දි ප්‍රදානෝත්සවය.**



2014 සහ 2017 වර්ෂවල ගිංතොට සහ බේරුවල යන ප්‍රදේශයන් හි ඇති වු **නොසන්සුන්කාරී** තත්වයන් හේතුවෙන් විනාශ වු දේපළ වෙනුවෙන් වන්දි ගෙවීම.



**2018.04.05 වන දින රජයේ සේවකයන්ගේ විනාශ වු දේපළ වෙනුවෙන් මුලතිව් හි දී පැවැති වන්දි ප්‍රදානෝත්සවය.**



**2018.03.24 වැනි දින පැවැති කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන**

# 4.4 නෝත්සී ලිමිටඩ්

## 4.4.1 දැක්ම

ඉහළ මත්ස්‍ය ආහාර අස්වැන්නක් නෙලා ගැනීම අරමුණු කර දේශීය ධීවරයාගේ අවශ්‍යා පිරිමසමින් නියමිත උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා වෙනත් ධීවර ආම්පන්න සපයමින් ධීවර ක්ෂේත්‍රයට අග්‍රගන්‍ය දායකත්වයක් සපයන්නා බවට පත්වීම

## 4.4.2 මෙහෙවර

ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම හා රටේ මත්ස්‍ය ආහාර නිෂ්පාදනයේ කාලීන ඉල්ලුම සපුරාලන උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා වෙනත් ධීවර ආම්පන්න නිෂ්පාදනය කිරීම හා සැපයීම.

## 4.4.3 ප්‍රතිපත්තිය

රටේ ආර්ථිකයට පෙරලා දායක වන ධීවරයන්ගේ සුබසාධනයට ප්‍රමුඛත්වය ලබා දෙමින් මෙය රාජ්‍ය ආයතනයක් ලෙස සළකා ව්‍යාපාර කටයුතු වල නිරත ගම් මට්ටමේ ධීවර සමුපකාර සමිති වලට සියළු අවස්ථාවන් උදා කර දීම



## 4.4.4 ආයතනය

සීමා. නෝත් සී ආයතනය යනු භාන්ඩාගාරයට සියයට සියයක හිමිකාරත්වය ඇති 2001 ජූනි මස 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේත් පසුව 2007 අංක 7 දරණ නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරමින් පිහිටුවන ලද මාළු දැල් නිෂ්පාදනය කරන සමාගමකි.

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය (මීට පෙර සම්ප්‍රදායික කර්මාන්ත හා සුලු ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය) විෂය පථයට අයත් සීමා. නෝත්සී සමාගම සතුව යාපනය ගුරුනගර් හි එක් මාලු දැල් නිෂ්පාදනාගාරයක් පමණක් තිබුන අතර 2010 නොවැම්බර් 02 වන දින කැබිනට් තීරණය අනුව ලුණුවිල හා වීරවිල මාලු දැල් කර්මාන්තශාලා පසුකාලීනව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාශය යටතේ පැවති සීමා. සීනෝර් පදනම වෙත පැවරිනි. කර්මාන්තශාලා දෙක භාර ගත් සීමා. නෝත් සී සමාගම 2011 නොවැම්බර් වල සිට මෙහෙයුම් අරඹන ලදී. මෙම කාලයේ දී ආයතනයේ සමස්ත සේවක ප්‍රමාණය 259 ක් විය.

රැකියා, ආදායම් ඉපයීම හා රටේ මත්ස්‍ය ආහාර නිෂ්පාදනය අතින් රටේ ආර්ථිකයට දායකත්වයක් සපයන ධීවර අංශය තුල සමාගම කටයුතු කෙරිනි. ධීවර කර්මාන්තය යනු ශ්‍රී ලංකාවේ මිරිදිය හා සාගර ඇතුලත් වන අතර එය රටේ මුහුදුකර හා වියළි කලාපීය ජලාශ ආශ්‍රිත ප්‍රදේශ වල වෙසෙන ජනයාගේ ජීවන කටයුතු වල වැදගත් කාර්යභාරයක් හොබවයි. ධීවර කර්මාන්තය මගින් ධීවරයන් 150,000 කට අධික පිරිසකට හා ඔවුන්ගේ පවුල් ප්‍රමාණයක් ජීවත්වේ.

මාලු දැල් සඳහා වන ඉල්ලුම් වසරකට මෙට්‍රික් ටොන් 4,200 ක් පමණ වන අතර ඉන් මාලු දැල් වලින් 36% ක් දේශීය නිෂ්පාදකයන් (වසරකට මෙට්‍රික් ටොන් 200-300 ධාරිතාවය සහිත කර්මාන්තශාලා 5 කින්) විසින් සපයන අතර, සීමා. නෝත් සී සමාගම වසරකට මෙට්‍රික් ටොන් 720 ක ධාරිතාවයක් සපුරමින් මාලු දැල් ඉල්ලුමෙන් 7% ක් සපුරා දේ.

### 4.4.5 ප්‍රධාන ක්ෂේත්‍ර

1. මාලු දැල් නිපදවීම හා ධීවරයන්ට සේවය සැලසීම
2. ඉහළ ප්‍රමිතියෙන් යුතු මාලු දැල් හා වෙනත් ධීවර උපාංග නිපදවීම මගින් ධීවර ප්‍රජාවගේ කාලින ඉල්ලුම සැපිරීම.
3. නිෂ්පාදන කාලය වැඩි කරමින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම

### 4.4.6 ප්‍රධාන කටයුතු

මාළු දැල් හා ධීවර ආම්පන්න මෙන්ම රටේ ධීවරයන්ට අවශ්‍ය කරන නූල් නැවීම් නිෂ්පාදන හා සැපයීම

**කර්මාන්තශාලාවල සමස්ථ මාළු දැල් නිෂ්පාදන ධාරිතාවය.**

| අං. | විස්තරය | ගුරුනගර් | ලුණුවිල | වීරවිල | එකතුව |
|---|---|---|---|---|---|
| **01.** | සමස්ත නිෂ්පාදන ධාරිතාවය - වසරකට | මෙට්‍රික් ටොන් 300 | මෙට්‍රික් ටොන් 240 | මෙට්‍රික් ටොන් 180 | මෙට්‍රික් ටොන් 720 |

වගු අංක **4.16:** නිෂ්පාදන ධාරිතාවය

| අං. | විස්තරය | විස්තරය | ගුරුනගර් | ලුනුවිල | වීරවිල | එකතුව |
|---|---|---|---|---|---|---|
| **01** | ඉලක්කගත නිෂ්පාදනය - වාර්ෂික මෙ.ටො. ප්‍රමාණය | ඉලක්කගත නිෂ්පාදනය - වාර්ෂික මෙ.ටො. ප්‍රමාණය | 267 Mt | 240 Mt | 168 Mt | 675 Mt |

වගු අංක **4.17: 2018** වසරේ කර්මාන්තශාලාවල ඉලක්කගත නිෂ්පාදිතය හා ප්‍රතිලාභීන්

තම පුනරාවර්ථන වියදම් සඳහා සීමා. නෝත්සී සමාගම මේ වන විට භාණ්ඩාගාරය මගින් සපයා නොගන්නා අතර, ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා පවා දැල් අලෙවියෙන් සමාගම විසින් උපයාගත් අරමුදල් වලින් කටයුතු කරගෙන යනු ලැබේ.



| මත්ස්‍ය නිෂ්පාදනය - 2017 | | | | | |
|---|---|---|---|---|---|
| මාසික | නිෂ්පාදනය -මෙ.ටො. | | | | |
| | ගුරුනගර් | ලුණුවිල | වීරවිල | මුළු | කා |
| ජනවාරි | 3.89 | 4.80 | 2.53 | 11.22 | |
| පෙබරවාරි | 4.41 | 6.35 | 3.91 | 14.67 | |
| මාර්තු | 9.01 | 9.25 | 3.19 | 21.45 | 47.34 |
| අප්‍රේල් | 8.27 | 8.63 | 3.60 | 20.50 | |
| මැයි | 9.03 | 7.30 | 3.90 | 20.23 | |
| ජුනි | 9.48 | 7.47 | 5.41 | 22.36 | 63.10 |
| ජුලි | 11.55 | 6.68 | 6.69 | 24.92 | |
| අගෝස්තු | 10.44 | 11.18 | 12.39 | 34.01 | |
| සැප්තැම්බර් | 7.00 | 11.69 | 13.03 | 31.72 | 90.65 |
| ඔක්තෝම්බර් | 5.42 | 8.67 | 9.30 | 23.40 | |
| නොවැම්බර් | 4.80 | 10.67 | 5.76 | 21.23 | |
| දෙසැම්බර් | 4.63 | 7.93 | 9.55 | 22.10 | 66.73 |
| මුළු | **87.91** | **100.63** | **79.27** | **267.82** | |

වගු අංක **4.18:** මත්ස්‍ය නිෂ්පාදනය **- 2017**

| මත්ස්‍ය අලෙවිසැල් - 2017 | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාසික | විකුණුම් -රු.මිලියන | | | | | |
| | ගුරුනගර් | | ලුණුවිල | වීරවිල | මුළු | කා |
| | ණය | මුදල් | | | | |
| ජනවාරි | 3.854 | 1.020 | 4.152 | 3.500 | 12.526 | |
| පෙබරවාරි | 3.635 | 0.168 | 7.595 | 3.779 | 15.176 | |
| මාර්තු | 8.973 | 0.420 | 9.891 | 6.197 | 25.481 | 53.183 |
| අප්‍රේල් | 6.837 | 0.167 | 8.877 | 2.866 | 18.747 | |
| මැයි | 7.374 | 0.154 | 9.443 | 4.003 | 20.974 | |
| ජූනි | 0.100 | 0.170 | 9.192 | 3.213 | 12.676 | 52.397 |
| ජූලි | 1.088 | 0.206 | 10.049 | 3.171 | 14.514 | |
| අගෝස්තු | 0.439 | 0.088 | 14.784 | 2.490 | 17.801 | |
| සැප්තැම්බර් | 2.100 | 0.662 | 15.002 | 2.852 | 20.617 | 52.932 |
| ඔක්තෝම්බර් | 1.245 | 20.120 | 9.852 | 8.329 | 39.546 | |
| නොවැම්බර් | 2.344 | 26.841 | 28.216 | 3.454 | 60.855 | |
| දෙසැම්බර් | 1.002 | 10.925 | 12.027 | 7.681 | 31.635 | 32.036 |
| මුළු | **38.991** | **60.942** | **139.080** | **51.535** | **290.547** | |

වගු අංක **4.19:** මත්ස්‍ය අලෙවිසැල් - **2017**




ප්‍රස්තාර අංක **4.15:** මාළුඇල් නිෂ්පාදනය - **2018**

| මත්ස්‍ය නිෂ්පාදනය 2018 | | | | | |
|---|---|---|---|---|---|
| මාසික | නිෂ්පාදනය - මැට් | | | | |
| | ගුරුනගර් | ලුණුවිල | වීරවිල | මුළු | කා |
| ජනවාරි | 7.37 | 10.14 | 9.56 | 27.07 | |
| පෙබරවාරි | 5.31 | 9.11 | 6.75 | 21.17 | |
| මාර්තු | 10.11 | 8.82 | 11.21 | 30.14 | 78.38 |
| අප්‍රේල් | 5.36 | 3.63 | 5.04 | 14.04 | |
| මැයි | 6.26 | 9.20 | 8.76 | 24.23 | |
| ජූනි | 6.27 | 10.14 | 11.68 | 28.09 | 66.36 |
| ජූලි | 5.56 | 7.89 | 10.83 | 24.29 | |
| අගෝස්තු | 9.71 | 8.57 | 9.64 | 27.93 | |
| සැප්තැම්බර් | 6.40 | 5.60 | 5.68 | 17.68 | 69.89 |
| ඔක්තෝම්බර් | 4.67 | 7.87 | 9.74 | 22.28 | |
| නොවැම්බර් | 5.79 | 8.29 | 5.32 | 19.39 | |
| දෙසැම්බර් | 3.10 | 7.09 | 6.19 | 16.38 | 58.05 |
| මුළු | **75.93** | **96.35** | **100.40** | **272.69** | |

වගු අංක **4.20:** මත්ස්‍ය නිෂ්පාදනය - **2018**

## 4.4.7 විකුණුම් 2018




ප්‍රස්තාර අංක **4.16:** මත්ස්‍ය විකුණුම් **2018**

| විකුණුම් - 2018 | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාසික | විකුණුම් -මිලියන | | | | | |
| | ගුරුනගර් | | ලුණුවිල | වීරවිල | මුළු | කා |
| | ණය | මුදල් | | | | |
| ජනවාරි | 1.446 | 8.777 | 20.438 | 2.829 | 33.490 | |
| පෙබරවාරි | 1.124 | 10.219 | 14.166 | 3.000 | 28.509 | |
| මාර්තු | 2.138 | 7.633 | 10.885 | 3.134 | 23.790 | 53.183 |
| අප්‍රේල් | 2.840 | 5.788 | 6.107 | 4.799 | 19.534 | |
| මැයි | 0.254 | 11.652 | 18.843 | 6.621 | 37.370 | |
| ජූනි | 3.721 | 3.194 | 11.123 | 10.770 | 28.808 | 52.397 |
| ජූලි | 0.752 | 6.285 | 22.579 | 6.586 | 36.202 | |
| අගෝස්තු | 2.434 | 8.454 | 8.857 | 9.636 | 29.381 | |
| සැප්තැම්බර් | 4.335 | 0.444 | 8.664 | 3.038 | 16.482 | 52.932 |
| ඔක්තෝම්බර් | 2.939 | 0.789 | 9.162 | 4.182 | 17.072 | |
| නොවැම්බර් | 5.695 | 1.343 | 8.665 | 3.719 | 19.421 | |
| දෙසැම්බර් | 3.745 | 0.619 | 7.278 | 4.250 | 15.892 | 52.386 |
| මුළු | **19.045** | **62.446** | **121.662** | **50.414** | **305.953** | |

වගු අංක **4.21:** මත්ස්‍ය විකුණුම් **2018**

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන රු | අපේක්ෂිත ප්‍රතිඵලය | ප්‍රගතිය | | සටහන් |
|---|---|---|---|---|---|
| | | | මූල්‍ය | භෞතික | |
| නෝත්සි ලිමිටඩ් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | 3.5 මිලියන | නෝත්සි සමාගමේ කර්මාන්තශාලා ගොඩනැගිල්ල සහ මායිම් බිත්ති අලුත්වැඩියා කිරීම | රු මි. 3.5 | 100 % | වැඩ අවසන්. ගොඩනැගිල්ල, මායිම් බිත්ති අලුත්වැඩියා කිරීම සඳහා මිලියන 3.5 ක් පූර්ණ වශයෙන් යොදා ගෙන ඇත |

වගු අංක **4.22:** භෞතික හා මූල්‍ය ප්‍රගතිය **- 2018**

## 4.5 තල් සංවර්ධන මණ්ඩලය

### 4.5.1 පසුබිම

